**වර්ෂ 2022ක් වූ සැප්තැම්බර් මස 13 වන දින පෙ.ව.10.00ට සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව**

**සහභාගීත්වය :- පැමිණි සභිකවරු**

| | | |
|---|---|---|
| 01. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා | - | ගරු සභාපති |
| 02. ආර්.ඒ.ඩී.ලලිත් රණසිංහ මහතා | - | ගරු උප සභාපති |
| 03. මද්දුමගේ දොන් අතුල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. කේ.කේ.ඩී.ලලිත් නිශාන්ත කුලතුංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. කාලංචිදුරගේ මිත්‍රානන්ද මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ප්‍රේමරත්න නාකන්දල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. සංජේ එරංග කරවිට මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එච්.ඩී.නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. සීතා ඩයස් ජයසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 16. සූරියආරච්චිගේ සුජීව නිර්මාණ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. ජේ.කේ.ඩී.පුබුදු මධුරංග ජයනෙත්ති මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. තුඩුගලගේ දොන් රෝහිත මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 24. එච්.ඩී.සුරේෂ් දර්ශන ජයසේකර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 25. කේ.ඩබ්.නිලූකා දර්ශනී සිල්වා මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 26. දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 28. අයි.එච්.ඩී.ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

**නොපැමිණි සභිකවරු :**

| | | |
|---|---|---|
| 01.කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02.වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03.දෝන ලීලා මුණසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 04.කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

**නිලධාරීන්**

| | | |
|---|---|---|
| 01. ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය | - | ලේකම් |
| 02.එම්.කේ.ඩී.සී.අවන්ති මෙනවිය | - | සංවර්ධන නිලධාරී (සභා කටයුතු) |

මෙදින පෙ.ව. 10.00 ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ.පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්, නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2022.08.09 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සහා අනුමැතිය සලකා බැලීම:**

ඉහත සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතාගේ ස්ථිරත්වයෙන් පහත සංශෝධනයන්ට යටත් ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
පසුගිය සභා වාර්තාවේ ගුණ දොස් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති අවස්ථාවේ මා ඉතාමත් ගෞරවයෙන් අදහස් දක්වන්න කැමතියි.මෙතෙක් මේ සභාවේ අපි දැක්ක වාර්තාවලට වඩා ප්‍රශස්ත මට්ටමේ වාර්තාවක් මෙවර ඉදිරිපත් කර ඇති බව පිළිගන්නවා.ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි ඉදිරිපත් කරන අදහස්වල වැදගත් ටික ඉදිරිපත් වෙන්න ඕන කියන එකයි අපේ අදහස.මෙවර වාර්තාවේ බොහෝ දේ බොහෝ හොඳට සටහන් කර තිබෙනවා.මොකද ඉතාමත් වැදගත් කාරණා සාකච්ඡා වුණා.යම් අවස්ථාවක ඒ පිළිබඳ විමර්ශනයකට ලක් වෙන්න වුණොත් ඒකට අවශ්‍ය කාරණා ඇතුළත් ව තියෙනවා.නමුත් මගේ කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධ ව යම් අඩුපාඩුවක් තියෙන බව මම නිරීක්ෂණය කළා.පසුගිය සභාවේ දී මම එළහරක් මස් කඩය සම්බන්ධ යෝජනාවේ දී ගරු උපසභාපතිතුමා සමඟ යම් විවාදයකට පැටළුණා. මොකද එතුමා කිව්වා"දැනටමත් කුකුල් මස් කඩ ඇතුළේ හරක් මස් විකුණන නිසා මේ එළහරක් මස් කඩයටත් ඉඩ දීම සුදුසු යි කියලා.ඒ අවස්ථාවේ මම එතුමාගෙන් ප්‍රශ්න කළා.ඔබතුමා මේ සභාවේ උප සභාපතිවරයා,මේ සභාවේ ජොෂ්ඨයෙක්,වැදගත් වැඩිහිටියෙක් හැටියට මේ වෙලාවේ දී ගන්න ස්ථාවරය වගකීමෙන් කියන්න කියන කාරණය මම කියා සිටියා."මම උප සභාපතිවරයාව ප්‍රශ්න කළ කොටස මට දේශපාලනික වශයෙන් ඉතාමත් වැදගත්.ඒ කොටස පමණක් මේ සභා වාර්තාවට ඇතුළත් වෙලා නැහැ.ඒ හැරෙන්න ඉතා හොඳ සාර්ථක වාර්තාවක් බව කියා සිටිනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මේ වාර්තාව සම්බන්ධයෙන් මමත් ඇත්තට ම සතුටු වෙනවා.මේ වාර්තාව මේ කාලයේ ඉදිරිපත් වුණ හොඳ ම වාර්තාව හැටියට පේනවා.අනිත් පැත්තෙන් ජොෂ්ඨකමක් වැඩක් නෑ.මම මේ ප්‍රකාශය කළේ අද ඉන්න උප සභාපතිවරයා හැටියට.මොකද එළහරක් මස් කඩේ ඇතුළේ නැතිව ඒ මස් වර්ගය ම පිට විකුණනවා නම් ඒ කඩේ පවත්වා ගෙන ගියත් ඒ ටික ම තමයි වෙන්නේ.ඒක තමයි මගේ අදහස.ඒක සඳහන් කළාට මගේ කිසි ම ප්‍රශ්නයක් නැහැ.දේශපාලනික වශයෙන් ඔය වගේ දේවල් මට නම් අවශ්‍ය නැහැ.එතුමාට අවශ්‍ය නිසා ඇතුළත් කළාට ගැටළුවක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් රම්සාන් මහතා**
එදා සමහර මන්ත්‍රීවරු දක්වපු අදහස්වලින් පේන්නේ ඔවුන්ට දිගටම ජාතිවාදය ඕන බව.ජාතිවාදය හරි පැත්තට හදා ගෙන එන මිනිසුන්ට අපි අනිවාර්යෙන් ම පිළිගැනීමක් දෙන්න ඕනා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මන්ත්‍රීවරු අදහස් දැක්වුවා වගේ සභා වාර්තාවේ මුල් කාලයේ තිබුණ ගෙවීම්,සාරාංශගත දේවල් අද තේරුම් ගන්න පුළුවන් විදිහට පුළුල් වෙලා තියෙනවා.ඒකට ගරු මන්ත්‍රීවරු සියලු දෙනාටම ස්තූතිය පල කරනවා.මේවා විධිමත්භාවයට පත් වෙන්න ඔබතුමන්ලාගේ ප්‍රශ්න කිරීම හේතු වුණා.සභාගත දේවල් දැන ගන්න මන්ත්‍රීවරුන්ට අයිතිය තියෙන නිසා ඒක වරදක් ලෙස දකින්නේ නෑ.මේවා සරල ලෙස දැන ගන්න දෙන්න කියන එක තව දුරටත් නිලධාරීන්ට දැනුම් දෙනවා.

- 2022 අගෝස්තු මස 09 වන දින මහ සභා න්‍යාය පත්‍රයේ සඳහන් වූ නමුත් අගෝස්තු මස වාර්තාවට ඇතුලත් කිරීමට නොහැකි වූ පහත යෝජනා මෙම සැප්තැම්බර් මස සභා වාර්තාවට ඇතුලත් කරන බව කාරුණික ව දන්වා සිටිමි.ඒ අනුව,

<u>යෝජනාව</u>

6.1.2 බල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග වල් බිහි වී ඇති බැවින් ද සේවකයන් යොදා ගැනීමේ හා ඉන්ධන නොමැති වීමේ ගැටළුව මත පලාත් බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයක් කුලී පදනමට ගෙන බල ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

බල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග වල් බිහි වී ඇති බැවින් ද සේවකයන් යොදා ගැනීමේ හා ඉන්ධන නොමැති වීමේ ගැටළුව මත පලාත් බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයක් කුලී පදනමට ගෙන බල ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා විසින් සථිර කරන ලද බැවින් ඒකමතිකව සභා සම්මත විය.

<u>යෝජනාව</u>

6.1.3 771 බොන්දුපිටිය ගැමුණු ප්‍රජා මණ්ඩලය සහ 771 බී තල්ගස්ගොඩ පැරකුම් ප්‍රජා මණ්ඩලය පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

771 බොන්දුපිටිය ගැමුණු ප්‍රජා මණ්ඩලය සහ 771 බී තල්ගස්ගොඩ පැරකුම් ප්‍රජා මණ්ඩලය පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා විසින් සථිර කරන ලද බැවින් ඒකමතිකව සභා සම්මත විය.

<u>යෝජනාව</u>

6.1.4 සාහිත්‍ය මාසය හා ජාතික කියවීමේ මාස නිමිත්තෙන් 2022 සැප්තැම්බර් මස හා ඔක්තොම්බර් මාස වලදී බල ප්‍රදේශයේ ජනතාවට නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීමට ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

සාහිත්‍ය මාසය හා ජාතික කියවීමේ මාස නිමිත්තෙන් 2022 සැප්තැම්බර් මස හා ඔක්තොම්බර් මාස වලදී බල ප්‍රදේශයේ ජනතාවට නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීමට ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා විසින් සථිර කරන ලද බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදන :**

ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එවූ රජයේ කාර්යාලවලට නිලධාරීන් කැඳවීම සීමා කළ ලිපියක් ලැබී තිබෙනවා.2022.08.24 දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සියලු ම නිළධාරීන් සාමාන්‍ය පරිදි සේවයට වාර්තා කළ යුතු බව දැනුම් දී තිබෙනවා.එමෙන් ම අත්‍යාවශ්‍ය සේවා වල දී හැර නැවත දැනුම් දෙන තුරු සෙනසුරාදා,ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි දී සියලු කාර්යාල වසා තැබීමට කටයුතු කරන මෙන් දැනුම් දී තිබෙනවා.

**03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

3.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා

3.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා විසින් විදේශ නිවාඩු ඉල්ලුම් කළ ලිපිය සභාගත කරන ලදී.

3.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දෝන ලීලා මුණසිංහ මහත්මිය
යන මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ අද දින සභාවට නොපැමිණෙන බව දන්වන ලදී.

**04. සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සහ පැමිණිලි සභාගත කිරීම :**

I. මතුගම පොදු වෙළඳපොළ කඩ සුරැකීමේ සංවිධානය මඟින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.ඒ අනුව කටයුතු කිරීමට සියලු දෙනාගේ එකඟතාවය මත ඒකමතික ව තීරණය කරන ලදී.

II. ටවුන් වත්ත මාර්ගය සම්බන්ධ ව ලැබුණු ලිපිය සභාගත කරන ලදී. ඒ අනුව කටයුතු කිරීමට සියලු දෙනාගේ එකඟතාවය මත ඒකමතික ව තීරණය කරන ලදී.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :**

**5.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් ඉදිරිපත් කරන ලද යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න :**

**5.1.1** 2021/07/01 සිට 2022/06/30 දක්වා තණකොළ කපන යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා වැය වූ මුදල කොපමණ ද?

**5.1.2** සභාව සතුව තණකොළ කපන යන්ත්‍ර කීයක් තිබේ ද?

**5.1.3** අදාළ කාලය තුළ තණකොළ කපන යන්ත්‍ර සඳහා යොදන නූල් සඳහා වැය වූ මුදල කොපමණ ද?
(පිළිතුරු පෞද්ගලික ව ලබා දී ඇත.)

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා ඉදිරිපත් කර ඇති ප්‍රශ්න යටතේ ඒවාට උත්තර අපි එතුමාට පෞද්ගලික ව ලබා දී තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
දැන් ඒ සියලු යන්ත්‍ර වැඩ කරනවා ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් වැඩ කරනවා.පොඩි පොඩි අළුත්වැඩියාවන් ආවත් දැනට කරගෙන යනවා.මේ මැෂින් ඩිමෝ එකට දෙන්න වෙලා තියෙන්නේ.ඒවා ඒ ආයතනයෙන්මයි අරන් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔය වාර්තාව අපටත් බලන්න ලැබෙනවාද? නැද්ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව් දෙනවා,මෙකේ මේ බිල්වල තියෙන ඒවාත්,අළුත්වැඩියාවන් සඳහා ගිය උපාංගත් බලන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ වාර්තාවේ අපි දීලා තියෙන ප්‍රශ්නවලට පිළිතුරු අපි සභාවට එන්න කලින් ලැබෙනවා නම් අපිට ඒ සඳහා සූදානම් වෙන්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව් ඒක ඇත්ත.කළින් දැනුම් දෙනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් මේ උත්තරත් මෙතන ම දීලා අපි මේක අහගෙන ඉඳලා ගෙදර යනවා.මේකට කතා කරන්න වෙලාවක් නෑනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මන්ත්‍රීතුමන්ලා හැමෝටම මේවාට උත්තර ඡායා පිටපත් කරලා ගේනවා.න්‍යාය පත්‍රයෙන් වෙන ම අවස්ථාවක් අරගෙන මේකේ බිල් ටිකත් එක්ක වෙලාව අරන් කතා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
තොරතුරු ටික දැන් සූදානම් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මෙහෙමයි,ප්‍රශ්නයක් ඇහුවාම අපි ඒක ඒ මන්ත්‍රීතුමාට දැනුම් දෙනවා.දැනුම් දුන්නාට පසු අපි එතන විවාද කරන් නෑ.ඒකේ ප්‍රශ්නයක් තියෙනවා නම් ඊළඟ සභාවෙදි අහන්න පුළුවන්.විමර්ෂණයක් ඕන නම් විමර්ෂණයක් හෝ පරීක්ෂණයක් වුණත් ඉල්ලන්න පුළුවන්.ඉතින් අපි විවෘත විදිහට මේක කතා කරන්න අවස්ථාවක් ගමු.

**5.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න-**

**5.2.1** "ඉම්රිච්" ආපන ශාලාවෙන් මසකට සභාවට අය විය යුතු බදු මුදල කීයද?
**5.2.2** කොපමණ කලකික් එම මුදල් අය වී නොමැති ද ?
**5.2.3** අය වී නොමැති නම් අයකර නොගැනීමට හේතුව කුමක් ද?
**5.2.4** එ ලෙස අයකර නොගැනීමට හේතු මොනවා ද?
**5.2.5** එම අයකර නොගැනීමේ වගකීම ගන්නා වූ නිළධාරියා කවුද?අය නොකිරීමට උපදෙස් දුන්නේ කවුද? පනතේ කුමන වගන්ති ප්‍රකාර ව ඇති බලය යටතේ ද? අය වී ඇත්නම්,
**5.2.6** අවසන් වරට එම ආපන ශාලාවෙන් අය කරගත් බදු මුදල කොපමණ ද?
**5.2.7** ඒ කවදා ද?
**5.2.8** කොරෝනා කාලය තුළ දුන් සහනය මාස කීයක් ලබා දුනිද?
**5.2.9** එයට හා සමාන කාලයක් බදු සහන ලබා දුන් වෙනත් ව්‍යාපාරික ආයතන තිබේ ද? ඒ මොනවා ද?
**5.2.10** එ පමණ කලක් බදු අයකර නොගත් එකම ව්‍යාපාරය "ඉම්රිච්" ආයතනය නම් ඒ ඇයි? කාගේ නියෝගයක් හා හිතවත්කමක් මත ද?
(පිළිතුරු පෞද්ගලික ව ලබා දී ඇත.)

**5.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න-**

**5.3.1** හිටපු ලේකම් අසෝක රණසිංහ මහතා මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරයෙන් ඉවත් වූ දිනය කවදා ද?
**5.3.2** හිටපු අභ්‍යන්තර විගණන නිළධාරීතුමිය වන අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය ලේකම් තනතුරට පත් වූයේ,

I. වැඩබලන ලේකම්වරියක ලෙස ද?
II. නැතහොත් ලේකම්වරියක ලෙස ද?

III. වැඩබලන ලේකම් තනතුරට හෝ පසු ව ලේකම් තනතුරට පත් වූයේ නම් එම පත්වීම් ලද දිනයන් කවදාද?

IV. වැඩබලන ලේකම් තනතුරට හෝ ලේකම් තනතුරට පත්වූ ඊට අදාල පත්වීම් ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමි.

V. අභ්‍යන්තර විගණන නිලධාරියකව සිටි අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය එම තනතුර දරණ අවස්ථාවේදි ඇය කුමන ශ්‍රේණියේ නිලධාරිනියක් ද?

VI. වත්මන් ලේකම්තුමිය මේ වන විට කුමන ශ්‍රේණියේ නිලධාරිනියක්ද?

VII. වත්මන් ලේකම්වරිය ලේකම් තනතුරට පත්වන විට ඇය දරන ලද ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියේ නිලධාරීන් මෙම සභාවේ සේවයේ සිටියේද?

VIII. එම නිලධාරීන්ගේ නම් හා එම නිලධාරීන් එම ශ්‍රේණියේ සේවය කල කාලය (අවුරුදු) කොපමණද?

**5.3.3** I. ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ පුද්ගලික ලේකම්වරියෙකු ලෙස ඉසුරුනී නිකේෂලා මෙනවියටයට පත් වීම දෙන ලද දිනය කවදා ද

II. එම තනතුරෙන් ඉවත් වූ දිනය කවදා ද?

III. ගරු සභාපතිවරයාගේ පුද්ගලික ලේකම්වරියෙකු ව සිටි ඉසුරුනී නිකේෂලා මහත්මිය කාර්යාල කාර්ය සහායක ලෙස ආදේශක පත්වීම ලබා දුන් දිනය කවදා ද?

IV. ඇය දැනට සභාවේ සේවය කරන රාජකාරිය කුමක් ද?

V. ඉසුරුනී නිකේෂලා මහත්මියගේ කාර්යාල කාර්ය සහායක පත්වීම් ලිපිය සභාවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමි.
(පිළිතුරු පෞද්ගලික ව ලබා දී ඇත.)

අපි එහෙනම් 5.3.3 වෙනකන් අහලා තියෙන ප්‍රශ්නවලට තොරතුරු එකින් එක වෙන ම වෙලාවක් අරගෙනයි කතා කරන්නේ.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා :**

**6.1 ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :**

6.1.1 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත්ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.07.01 දින සිට 2022.07.31 දින දක්වා, කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදී.

| අනු අංකය | නම | වවචර් අංකය | විස්තරය | මුදල |
|---|---|---|---|---|
| | **2022.07.04** | | | |
| 1 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 1 | 2022.05.01- 2022.05.31 දක්වා දුරකථන ජාල බිල්පත් ගෙවීම | 27,212.59 |
| 2 | කාර්යභාර නිලධාරී - හොරවල | 2 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 1,836.00 |
| 3 | කේ.කේ.ඩී.ආර්. සංජීව (ප්‍රජා සංවර්ධන නිලධාරී) | 3 | ආහාර සුරක්ෂිතතා වැඩසටහන සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 50,000.00 |
| 4 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 4 | 53 - 4621 කැබ් රථයට ඩීසල් ලීටර් 47 ක් ලබා ගැනීම | 18,801.20 |
| | **2022.07.05** | | | |
| 5 | මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 5 | ගබඩාවට ඩීසල් ලීටර් 200 ක් ලබා ගැනීම | 92,000.00 |
| | **2022.07.06** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | නාමල් හාඩ්වෙයාර් | 6 | ක්‍රියාත්මක ප්‍රජා ශාලා සඳහා ලබා දෙන ප්ලාස්ටික් පුටුවල ප්‍රාදේශීය සභාව මතුගම අකුරු මුද්‍රණය සඳහා තීන්ත මිලදී ගැනීම. | 5,810.00 |
| 7 | පතිරගේ දොන් සෝමතිලක | 7 | නැබඩ පාර කඩකාමර තැනීමේ 5% අතරුදවුම් මුදල් ගෙවීම | 674,250.00 |
| | **2022.07.07** | | | |
| 8 | මොහොතාදූරගේ කාංචනා ජයමාලි | 8 | යටදොල කායවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුකරු දීමනා 2022 මැයි මාසය | 3,483.87 |
| | **2022.07.08** | | | |
| 9 | මුදල් හාරකරු | 9 | 2022 ජූලි මස වැටුප් අත්තිකාරම් හොරවල උපකාර්යාලය | 1,500.00 |
| 10 | මුදල් හාරකරු | 10 | 2022 ජූලි මස වැටුප් අත්තිකාරම් වැලිපැන්න උපකාර්යාලය | 1,000.00 |
| 11 | මුදල් හාරකරු | 11 | 2022 ජූලි මස වැටුප් අත්තිකාරම් මතුගම ප්‍රධාන කාර්යාලය | 14,600.00 |
| 12 | මුදල් හාරකරු | 12 | 2022 ජූනි මස ව්‍යාපෘති වැටුප් හොරවල උපකාර්යාලය | 204,289.56 |
| 13 | මුදල් හාරකරු | 13 | 2022 ජූනි මස දෛනික වැටුප් හොරවල උපකාර්යාලය | 66,599.48 |
| 14 | මුදල් හාරකරු | 14 | 2022 ජූනි මස ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උපකාර්යාලය | 98,452.80 |
| 15 | මුදල් හාරකරු | 15 | 2022 ජූනි මස දෛනික වැටුප් වැලිපැන්න උපකාර්යාලය | 99,899.20 |
| 16 | මුදල් හාරකරු | 16 | 2022 ජූනි මස දෛනික වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 245,086.24 |
| 17 | මුදල් හාරකරු | 17 | 2022 ජූනි මස ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 355,045.41 |
| 18 | මුදල් හාරකරු | 18 | 2022 ජූනි මස ඩෙංගු මර්ධන වැඩසටහන වැටුප් | 247,362.66 |
| 19 | මුදල් හාරකරු | 19 | 2022 ජූනි මස විෂබීජහරණ ,කසළ කළමනාකරණ වැඩසටහන වැටුප් | 179,676.36 |
| | **2022.07.12** | | | |
| 20 | මුදල් හාරකරු | 20 | සභාපතිතුමා ඇතුළු 33 ක් සඳහා 2022 ජූලි මස සභික දීමනා | 510,000.00 |
| 21 | අර්ජුන කිරිඇල්ල | 21 | 2022 ජූලි මස මහාසභාව සඳහා සංග්‍රහ අත්තිකාරම් | 10,000.00 |
| 22 | මුදල් හාරකරු | 22 | සභාපතිතුමා ඇතුළු 30 ක් සඳහා 2022 ජූනි මස සභික ගමන් වියදම් | 75,000.00 |
| 23 | නන්දසේන ලියනගේ | 23 | 2022 ජූනි මස මහජන සම්බන්ධතා නිලධාරී දීමනා | 14,000.00 |
| 24 | ශ්‍රී ලංගම මතුගම ඩිපෝව | 24 | සභාවට අවශ්‍ය ඩීසල් ලීටර් 200 ක් මිලදී ගැනීම | 92,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | ගැස්ටෙක් එනර්ජි ලංකා පුද් සමාගම | 25 | ලිට්රෝ ගෑස් සිලින්ඩර් 8 ක් මිලදී ගැනිම ආදාහනාගාරය සඳහා රු. 18668.00 x 8 | 149,344.00 |
| 26 | එස්.පී. ගුණසිංහ - IOC පිරවුම්හල මතුගම | 26 | පෙට්‍රල් ලිටර් 50 ක් ගබඩාවට ලබා ගැනීම රු.470.00 x 50 = රු. 23500.00 | 23,500.00 |
| | **2022.07.14** | | | |
| 27 | සෙන්දනායක සිනට් | 27 | පුස්තකාල පොත් 8ක් මිලදී ගැනිම | 2,000.00 |
| 28 | එන්.එස්.ටී.එන්. විරාජිනි | 28 | සෞඛ්‍ය අංශයට ග්ලවුස් 100 ක් මිලදී ගැනීම රු. 175.00 x 100 = රු. 17500.00 | 17,500.00 |
| 29 | දසුන් උපේන්ද්‍ර කළුතරගේ | 29 | ශ්‍රවණාගාර භූමිය තාර දැමීම සඳහා ඒ.බී.සී. ගල් කියුබ් 6ක් මිලදී ගැනිම රු. 9500.00 x 6 | 57,000.00 |
| | **2022.07.15** | | | |
| 30 | එම්. ලූෂන් ප්‍රනාන්දු | 32 | 2022 පෙබරවාරි හා මාර්තු කායවර්ධන පුහුණුකරු දීමනා | 4,002.30 |
| 31 | ගුණවර්ධන ගරාජ් | 33 | YQ - 6448 ත්‍රි රෝද රථයේ රෝද තුනටම ලයිනර් සවි කිරම | 1,300.00 |
| 32 | සෝෆාස්ට් ප්‍රයි ලිමිටඩ් | 34 | YQ - 6448 ත්‍රි රෝද රථයේ බ්‍රේක් ලයිනර් සවි කිරීම | 8,770.00 |
| 33 | සෝෆාස්ට් ප්‍රයි ලිමිටඩ් | 35 | AAJ-4210 ත්‍රී රෝද රථයේ බ්‍රේක් පද්ධතියට උපාංග ලබා ගැනීම | 11,360.00 |
| 34 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගීතා සමිතිය | 36 | කොම්පෝස්ට් අංගනයට ජලය ලබා ගැනීම 2022.03.30 - 2022.05.30 දක්වා | 16,200.00 |
| 35 | පී.වී. කපිල | 37 | අළුත්ගම්ගොඩ පෙර පාසලේ ජලනල පද්ධතිය අළුත්වැඩියාවට ද්‍රව්‍ය මිලදී ගැනීම | 16,215.00 |
| 36 | එච්.පී.කේ.බී.ද අල්විස් | 38 | ගල්මත්ත පුස්තකාලයේ පුවත්පත් බිල - 2022 - අප්‍රේල් | 10,350.00 |
| 37 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 39 | හේනේගම පුස්තකාලයට පුවත්පත් සැපයීම - 2022 - අප්‍රේල් | 6,950.00 |
| 38 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 40 | හේනේගම පුස්තකාලයට පුවත්පත් සැපයීම - 2022 - මැයි | 10,270.00 |
| 39 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 41 | යටදොලවත්ත පුස්තකාලයට පුවත්පත් සැපයීම 2022 - මැයි | 12,480.00 |
| 40 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 42 | නවුත්තුඩුව පුස්තකාලයට පුවත්පත් සැපයීම - 2022 - මැයි | 10,240.00 |
| 41 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 43 | නවුත්තුඩුව පුස්තකාලයට පුවත්පත් සැපයීම - 2022 - අප්‍රේල් | 7,050.00 |
| 42 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 44 | යටදොලවත්ත පුස්තකාලයට පුවත්පත් සැපයීම 2022 - අප්‍රේල් | 8,330.00 |
| 43 | ඒ.සී.ඒෆ්. සභීරා | 45 | මීගම පුස්තකාලයට පුවත්පත් සැපයීම 2022 - අප්‍රේල් | 5,580.00 |
| 44 | ජී.ඩී. මලිත් ඩිල්ෂන් | 46 | වැලිපැන්න පුස්තකාලයට පුවත්පත් සැපයීම - 2022 - අප්‍රේල්, මැයි | 17,750.00 |

| | | | | |
|---|---|---|---|---|
| 45 | මහජන බැංකුව - ඩියුක් වීදිය | 47 | 2022 ජනවාරි පෙබරවාරි මාර්තු විශ්‍රාම වැටුප්දායක මුදල් | 23,967.12 |
| 46 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 48 | ඉන්ධන බිල්පත් ඇමුණුම 01 | 39,948.00 |
| 47 | නෙක්ෆා ඔස්ට්‍රේලියා ප්‍රයිවට් ලිමිටඩ් | 49 | 2022 පෙබරවාරි සිට මැයි දක්වා වෙබ් අඩවි ගාස්තු | 19,800.00 |
| 48 | චමින්ද ටයර් හවුස් | 50 | සභාවේ වාහන 5 ක් සඳහා පැච් දැමීම | 4,100.00 |
| 49 | පී.එස්.කේ. සර්විස් සෙන්ටර් | 51 | PE-6914 කැබ් රථය සේවා කිරීම 2022.05.09 | 31,196.00 |
| 50 | ඩී.පී.ජේ. හොල්ඩිංස් | 52 | හොරවල උප කාර්යාලයේ ඇඟිලි සළකුණු යන්ත්‍රයට මෘදුකාංග දැමීම | 16,200.00 |
| 51 | අයි.බී. සුසන්ත | 53 | ZA-9260 ගාබේජ් කම්පැක්ටරයේ හෝස් 1 ක් ගැසීම | 2,450.00 |
| 52 | සතොස මෝටර්ස් | 54 | LM-5610 කම්පැක්ටරයේ ටයර් රෝඩ් හා බ්‍රේක් පද්ධතිය සෑදීම | 231,584.40 |
| 53 | චමින්ද ටයර් හවුස් | 55 | JG-4546 ට්‍රැක්ටරයට 600 x 16 ටයර් 1 ක් මිලදී ගැනීම | 20,800.00 |
| 54 | ගුණවර්ධන ගරාජ් | 56 | AAJ-4210 ත්‍රී රෝද රථයේ බ්‍රේක් සෑදීම | 1,800.00 |
| 55 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 57 | R-135 බොබ්කැට් යන්ත්‍රයේ බකට් එකෙහි ප්ලේට් එක සෑදීම | 3,800.00 |
| 56 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | 58 | ZA-2657 JCB යන්ත්‍රය අළුත්වැඩියාව 2022.04.30 | 165,747.60 |
| 57 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | 59 | ZA-2657 JCB යන්ත්‍රය අළුත්වැඩියාව 2022.06.30 | 42,000.00 |
| 58 | අයි.බී. සුසන්ත | 60 | ZA-2657 JCB යන්ත්‍රයට හයිඩ්‍රොලික් හෝස් 1 ක් දැමීම | 6,380.00 |
| 59 | මතුගම ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ් | 61 | ඉන්ධන බිල්පත් ගෙවීම - ඇමුණුම 02 | 102,025.89 |
| 60 | ආර්.පී. වරුණ ඉෂාන්ත | 62 | සෞඛ්‍ය පරිපාලක 2022 ජුනි නිවාඩු දින වැටුප් ගෙවීම | 4,923.33 |
| 61 | ගයාන් මධුසංඛ | 63 | රාජකාරී ගමන් වියදම් | 2,800.00 |
| 62 | ආර්.එම්. සන්දනායක | 64 | රාජකාරී ගමන් වියදම් | 800.00 |
| 63 | ඩබ්.ජී.එම්.අයි.එස්. තෙන්නකෝන් | 65 | 2022 මැයි නිවාඩු දින වැටුප් | 10,677.50 |
| 64 | කාර්යභාර නිලධාරී - හොරවල උප කාර්යාලය | 66 | සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1,000.00 |
| 65 | මුදල් භාරකරු | 67 | කොම්පෝස්ට් අංගනයේ පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත බලපත්‍ර ගාස්තු මුදලින් ගෙවීම් කිරීම | 4,880.00 |
| 66 | මුදල් භාරකරු | 68 | සභාපතිතුමා ඇතුළු නිලධාරීන් 8 ක් සඳහා 2022 මැයි මස සැලසුම් කමිටු දීමනා | 11,250.00 |
| | **2022.07.18** | | | |
| 67 | කල්‍යාණි ට්‍රේඩිං සමාගම | 70 | Ax4 පැකට් 25 ක් මිලට ගැනීම | 31,400.00 |
| 68 | කල්‍යාණි ට්‍රේඩිං සමාගම | 71 | ගල්මත්ත ආයුර්වේදය සඳහා කැල්කියුලේටර් 1 ක් මිලදී ගැනීම | 4,600.00 |
| 69 | පී.වී. කපිල | 72 | 50kg සිමෙන්ති මල් 10 ක් ගැනීම. මතුගම පෙදු වෙළඳපල කාණුව සකස් කිරීම සඳහා | 32,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 70 | එස්. අතුකෝරල | 73 | මහජන පුස්තකාලය සඳහා බිත්ති ඔරලෝසු 1 ක් මිලදී ගැනීම | 2,350.00 |
| 71 | එස්. අභීත විරාජිත් ද සිල්වා | 74 | කාගිල්ස් අගලවත්ත පාර දැන්වීම් පුවරු සඳහා දෙවරක් ගෙවන ලද මුදල ආපසු ගෙවීම | 52,200.00 |
| 72 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 75 | LL-7571 කෘ කැබ් රථයේ ගියර් පද්ධතිය සෑදීම | 14,200.00 |
| 73 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 76 | RF-1964 ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය සෑදීම | 13,100.00 |
| 74 | චමින්ද ටයර් හවුස් | 77 | සභාවේ වාහන 3 ක් සඳහා පැච් දැමීම | 2,100.00 |
| 75 | ලංකා විදුලිබල මණ්ඩලය | 78 | ආයතන 34 ක් සඳහා විදුලි බිල්පත් ගෙවීම | 106,062.23 |
| 76 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 79 | දුරකථන ජාල බිල්පත් පියවීම | 10,390.33 |
| 77 | එල්.ජ්ල්.ජ්ම්. මුණසිංහ | 80 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය 2022.04.01 - 2022.04.30 දක්වා | 2,500.00 |
| 78 | මුදල් භාරකරු | 81 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 23,547.68 |
| | **2022.07.19** | | | |
| 79 | ගෑස් ටෙක් ඒර්ජි ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 83 | ආදාහනාගාරය සඳහා ලිට්‍රො ගෑස් සිලිංඩර් 2ක් මිලදී ගැනීම රු.19043.00x2 | 38,086.00 |
| | **2022.07.21** | | | |
| 80 | ඉසුරු ගොවි සංවිධානය ඉද්දගොඩ | 84 | මතුගම වොලිබෝල් ක්‍රීඩාංගණය ඉදි කිරීම් ව්‍යාපෘතිය-IIවන අදියර | 1,311,432.00 |
| 81 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 85 | ආදාහනාගාරය සඳහා 37 1/2 ගෑස් සිලිංඩර් 5 ක් මිලදී ගැනීම රු. 19043.00 x 5 | 95,215.00 |
| 82 | සුසන්ත හෙට්ටිආරච්චි | 86 | සෞඛ්‍ය කම්කරු - 2022 මැයි අතිකාල | 7,013.25 |
| 83 | ඒ.කේ. කරුණාලාල් ඇපා | 87 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 7,525.45 |
| 84 | ඒම්.ඒ. සේනාරත්න | 88 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 8,812.80 |
| 85 | කේ.ඒ. සරත් | 89 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 2,155.44 |
| 86 | කේ.ඒ. ලසන්ත කුමාර | 90 | ව්‍යාපෘති කම්කරු - 2022 ජූනි අතිකාල | 3,377.60 |
| 87 | ආර්.ඒම්. සන්දනායක | 91 | කළමනාකරණ සේවා නිලධාරී - 2022 ජූනි අතිකාල | 9,983.67 |
| 88 | ජානක රුවන් | 92 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 6,932.88 |
| 89 | දමිත් මලවරආරච්චි | 93 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 4,863.87 |
| 90 | රංජිත් වීරසිරි | 94 | සෞඛ්‍ය කම්කරු - 2022 අප්‍රේල් අතිකාල | 9,722.00 |
| 91 | රංජිත් වීරසිරි | 95 | සෞඛ්‍ය කම්කරු - 2022 මැයි අතිකාල | 7,388.72 |
| 92 | මිහිඳු ජන්න කුමාර | 96 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි අතිකාල | 2,449.68 |

| | | | | |
|---|---|---|---|---|
| 93 | පී. ඉන්දික කුමාර | 97 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල | 1,388.88 |
| 94 | ඒන්.ඩී. අජිත් | 98 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල | 727.74 |
| 95 | කේ.වී. අරුණ ශාන්ත | 99 | රාත්‍රී මුරකරු - 2022 ජුනි අතිකාල | 7,799.49 |
| 96 | ජී. චන්දන පුෂ්පකුමාර | 100 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 8,088.36 |
| 97 | සී.පී. මුණසිංහ | 101 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 8,263.70 |
| 98 | ජේ.ඩී. ප්‍රභාත් කුමාර | 102 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 4,208.40 |
| 99 | ඊ.ඒ. කසුන් | 103 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 11,222.40 |
| 100 | එස්.ඒ.ඩී. රංගජීව | 104 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 9,722.00 |
| 101 | බී.කේ. සුරාජ් | 105 | රියදුරු - 2022 ජුනි අතිකාල | 7,585.27 |
| 102 | ඒල්.ඒ. ගාමිණී | 106 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල | 12,240.96 |
| 103 | නිරංග පුෂ්පකුමාර | 107 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක - 2022 ජුනි අතිකාල | 5,103.37 |
| 104 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 108 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජුනි අතිකාල | 5,777.40 |
| 105 | ඩිලාන් ගුණරත්න | 109 | සෞඛ්‍ය කම්කරු - 2022 ජුනි අතිකාල(මුර සේවා) | 7,703.20 |
| 106 | සුසන්ත හෙට්ටිආරච්චි | 110 | සෞඛ්‍ය කම්කරු - 2022 අප්‍රේල් අතිකාල | 8,041.86 |
| 107 | යූ.කේ.ඩී. සුමිත් | 111 | කාර්යාල කාර්ය සහායක - 2022 ජුනි අතිකාල | 6,739.92 |
| 108 | සංජය ඒරික් ලසන්ත | 112 | මුරකරු - 2022 ජුනි අතිකාල | 11,776.80 |
| 109 | නුවන් චතුරංග | 113 | මුරකරු - 2022 ජුනි අතිකාල | 6,233.04 |
| 110 | එස්.එම්. අයෝනා | 114 | කාර්යාල කාර්ය සහායක - 2022 ජුනි අතිකාල | 2,375.58 |
| 111 | එච්.ඩබ්.ඩී. නීල් ප්‍රසන්න | 115 | කළමනාකරණ සේවා නිලධාරී - 2022 මැයි අතිකාල | 3,505.46 |
| 112 | එච්.ඩබ්.ඩී. නීල් ප්‍රසන්න | 116 | කළමනාකරණ සේවා නිලධාරී - 2022 ජුනි අතිකාල | 1,037.33 |
| 113 | ජයන්ත සිල්වා | 117 | ආදාහනාගාර ක්‍රියාකරු - 2022 ජුනි අතිකාල | 8,200.80 |
| | **2022.07.22** | | | |
| 114 | සී.ස. මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 121 | ඉන්ධන ලබා ගැනීම - ඇමුණුම - 03 | 133,000.00 |
| | **2022.07.25** | | | |
| 115 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 122 | ආදාහනාගාරය සඳහා 37 1/2 ගෑස් සිලිංඩර් 8 ක් මිලට ගැනීම රු. 19043.00 x 8 | 152,344.00 |

| | | | | |
|---|---|---|---|---|
| 116 | එස්.ඩී. ජයසිංහ | 123 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය 2022.04.01 - 2022.04.30 දක්වා | 2,364.41 |
| | **2022.07.26** | | | |
| 117 | පී.වී. ආනන්ද කුසුම්සිරි | 124 | මතුගම පොදු වෙළඳපල මාළු කඩ අළුත්වැඩියාව සඳහා සිමෙන්ති ගල් 300 ක් මිලට ගැනීම 115×300 | 34,500.00 |
| | **2022.07.28** | | | |
| 118 | එම්.ඩී. කාංචනා ජයමාලි | 125 | කායවර්ධන මධ්‍යස්ථාන පුහුණුකරු දීමනා - 2022 ජූනි | 7,150.00 |
| | **2022.07.29** | | | |
| 119 | සී/ස මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 126 | ගබඩාවට පෙට්‍රල් ලීටර් 80 ක් ලබා ගැනීම රු.450.00 x 80 = 36000.00 | 36,000.00 |
| | **සේවක ණය** | | | |
| | **2022.07.28** | | | |
| 1 | කේ.ඒ. ප්‍රියන්ති | 46 | ආපදා ණය | 72,006.00 |
| 2 | ජේ.ඒම්. නිරංජලා කුමාරි | 47 | පැ පැදි ණය | 6,000.00 |
| 3 | කේ. උදය නෙලුපුල් | 48 | ආපදා ණය | 136,250.00 |
| 4 | ඩී.එන්.කේ. ජයසිංහ | 49 | ආපදා ණය | 250,000.00 |
| 5 | එස්.ආර්.වී. චාමික | 50 | ආපදා ණය | 250,000.00 |
| | **කර්මාන්ත** | | | |
| | **2022.07.** | | | |
| 1 | ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය | 10 | දූවවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 197,827.27 |
| 2 | ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය | 11 | ආඳවල ගල්ලන්දොල මාර්ගය සංවර්ධනය කිරීම | 539,449.60 |

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අංක **6.1.1** යටතේ තිබෙන ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම්. ඒ පිළිබඳ දැන ගන්න දෙයක් තියෙනවා නම් අහන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අංක 29 යටතේ මේක කවදා ගත්ත එකක් ද?ශ්‍රවණාගාරයේ කොහේ ද තාර දාලා තියෙන්නේ?අපි මේ ගැන දැනුවත් නැහැ.ශ්‍රවණාගාරෙ වටේ කොහේවත් තාර දාපු තැනක් අපි දැක්කේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
තාර කොහේවත් නැහැ.ඒ.බී.සී.ගල් ටික විතරයි දැනට අතුරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ ගෙවීම් විස්තර ඇතුලත් කරද්දී මේවා නිවැරදි කරලා දාන්න.තාර දැම්මා කිව්වම අපි බලනවා තාර දාපු තැනක් තියෙනවාද කියලා.තාර දාපු තැනක් නැති වුණාම අපි බලනවා මේ මොකක්ද කියලා.මේක මොන කාලේ ගත්ත එකක් ද?ඒ ගැන මොකුත් සඳහනක් මේ විස්තරයේ නැහැ.මේ වගේ තොරතුරු ඕන තරම් ඇතුලත් කරන්න පුළුවන් වාර්තාවලට.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒ.බී.සී.ගල් ටික දාලා රෝලකින් තැලුවා.ඊට පස්සේ අපට තාර ගන්න බැරි ප්‍රශ්නයක් ආවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
**මේක මොන කාලේ කරපු ව්‍යාපෘතියක් ද?**

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක අපට කරන්න තියෙන වැඩක්.දැනට ගල් දාලා තලළා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම අහන්නේ මේක මොන කාලේ කරපු ව්‍යාපෘතියක් ද?කවදාද මේ ගල් ගෙනාවේ කියලා.07.14 දාලා තියෙන්නේ.මේ ගෙවීම් විස්තරවල ජුනි,ජූලි මාසවල පවා දින දාලා ගෙවීම් දාලා තියෙනවා.ඒ නිසා අහන්නේ මේක මොන කාලේ ගෙනාව එකක් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
කළින් උත්සවයක් වෙලාවෙදි ඒ.බී.සී.ගල් දැම්මා මට මතකයි.මැතිවරණ කාලේ ජනාධිපතිතුමා එන වෙලාවක දි දැම්මේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා ඉදිරිපත් කළ කාරණයට අමතර ව අංක 80 යටතේ සඳහන් මතුගම වොලිබෝල් ක්‍රීඩාංගනය අළුත්වැඩියා කිරීම සඳහා ඉද්දගොඩ ඉසුරු ගොවි සංවිධානයට රු.1,311,432.00ක් ගෙවීමට යෝජනා කර තිබෙනවා.ඇත්තටම මේ ඉදිරිපත් කරලා තියෙන යෝජනාව අපට මේ තත්වයෙන් පිළිගන්න බෑ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අතරුදවුමක් නෙමෙයි මේ තියෙන්නේ ගෙවීමක්.අර වොලිබෝල් පිට්ටනියට රජය වෙන් කරපු ලක්ෂ පහළවයි ගාණ තමයි මේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ පිළිබඳ ව අපට යම්කිසි වැඩි විස්තරයක් ලබා ගන්නේ නැතුව මේක අනුමත කරන්න අපි එකඟ නෑ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම ඒක දැනුවත් කරන්නම්.මොකක්ද මන්ත්‍රීතුමාට දැන ගන්න තියෙන්නේ?මේ සම්පූර්ණ ව්‍යාපෘතියේ පළමුවැනි ගෙවීම.මුදල් ඇවිල්ලා තියෙන නිසා ගෙවන්න දාලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
දැන් ඒකේ වැඩ අවසන් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව් වැඩ අවසන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
තව තියෙනවා අංක 17න්,"එස්.අභීත විරාජිත් ද සිල්වා-දැන්වීම් පුවරු සඳහා වැඩිපුර අය කරන ලද මුදල් ආපසු ගෙවීම"කියලා.ඒක මොකක් සම්බන්ධ ව ද?වැඩිපුර මුදල් අය කරලා තියෙන හේතුව මොකක් ද?එතකොට ඇයි මේ වැඩිපුර මුදල් අය කරලා තියෙන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
කාගීල්ස් එකෙන් මුදලිනුයි,චෙක් එකකිනුයි දෙකකින් ම ගෙවලා තියෙනවාලු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
10වැනි පිටුවේ තියෙනවා 1,2 කියලා දෙකක්.ලෙව්වන්දූව එක්සත් ප්‍රජා මණ්ඩලය දූවවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට 197,827.27කුත් ලෙව්වන්දූව එක්සත් ප්‍රජා මණ්ඩලය ආඳවල ගල්ලන්දොළ මාර්ගය සංවර්ධනය කිරීමට 539,449.60ක් තියෙනවා.මේ ව්‍යාපෘති දෙක මොන කාලේ කරපු එකක් ද?මේක සභා අරමුදලින් ද පළාත් සභා අරමුදලින් කරපු එකක් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
සභා අරමුදල් නෙමේ.ගල්ලන්දොළ එක තියෙන්නේ ආඳවල.ඒක මේ සමිතියෙන් තමයි අත්සන් කරලා තියෙන්නේ.ඒකේ මුළු මුදල තමයි තියෙන්නේ.ව්‍යාපෘතියට සල්ලි ඇවිත් තියෙන්නේ මාස අටක් විතර ප්‍රමාද වෙලා.දූවවත්ත එක 10% මුදල ගෙවන එක.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මොන කාලේ කරපු එකක් ද කියලා දැනගන්න ඕනා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැනට අවුරුදු දෙකකට පෙර කරපු එකක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එච්චර වෙනවද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ආඳවෙල ගල්ලන්දොළ මාර්ගයේ සම්පූර්ණ ගෙවීම 539 449.60යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒක සභා අරමුදලක් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ.මේක පළාත් සභා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
අංක 69 යටතේ 50Kg සිමෙන්ති කොට්ට 10ක් අරගෙන තියෙනවා කාණුවක් හදන්න කියලා.පොළේ කොහේද දන් නෑ කාණුවක් හදලා තියෙන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
පොළේ මාළු ලෑල්ල ළඟ කාණුවටයි,ගොඩනැඟිල්ලටයි දෙකටම ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
සිමෙන්ති ගල් 300ක් බඳින්න සිමෙන්ති කොට්ට 10ක් යන්නේ නෑ.සිමෙන්ති කොට්ට දෙකෙන් බඳින්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ.කොන්ක්‍රීට් එකකුත් දාලා තියෙනවා කියලයි මට වාර්තා කළේ.දැන් වහල ගහලා තියෙනවා ඒ මාළු කඩේ.

මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි මේ ගෙවීම් ගැන කාරක සභාවක් කරලා එකින් එක ගමු.නැත්නම් කාලේ යනවානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ සියල්ලට ම කාරක සභාවක් කරලා එකින් එක ගන්න.ඒක අයින් කරලා ඉතුරු ටික ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
සියලු ගෙවීම්වලටයි මුදල් වියදම් කරලා තියෙන ටිකටයි මේ යෝජනා ටික සාකච්ඡා කළාට පස්සේ ලිපි ගොනු ගෙනත් එකින් එක කතා කරමු.

<u>යෝජනාව</u>

**6.1.2** යටදොළවත්ත උප කාර්යාලයේ සේවය කරන පෙර පාසල් ගුරු යූ.කේ.ඩී.දීප්ති ඉයෝමා මිය 2022.10.15 දින සිට විශ්‍රාම යාමට නියමිත ය.ඇය 1996 ජනවාරි සිට 2001.09.30 දක්වා ආදේශක පෙර පාසල් ගුරුවරියක් ලෙස යටදොළවත්ත පෙර පාසලේ සේවය කර ඇත.මෙම කාලය තුළ ඇයගේ වැටුපෙන් අය කරන ලද සේවක අර්ථ සාධක අරමුදලේ 60% ප්‍රතිශත මුදල වන රු.21849.52ක මුදලක් 2002.09.10 වන දින ලදුපත් අංක 21352 මඟින් සභා ගිණුමට බැර කර ඇත.මෙම මුදල ගිණුමෙන් ආපසු ලබා ගෙන ආදේශක සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට එකතු කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු බැවින්,මෙම මුදල ආපසු ලබා ගැනීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

යටදොළවත්ත උප කාර්යාලයේ සේවය කරන පෙර පාසල් ගුරු යූ.කේ.ඩී.දීප්ති ඉයෝමා මිය 2022.10.15 දින සිට විශ්‍රාම යාමට නියමිත ය.ඇය 1996 ජනවාරි සිට 2001.09.30 දක්වා ආදේශක පෙර පාසල් ගුරුවරියක් ලෙස යටදොළවත්ත පෙර පාසලේ සේවය කර ඇත.මෙම කාලය තුළ ඇයගේ වැටුපෙන් අය කරන ලද සේවක අර්ථ සාධක අරමුදලේ 60% ප්‍රතිශත මුදල වන රු.21849.52ක මුදලක් 2002.09.10 වන දින ලදුපත් අංක 21352 මඟින් සභා ගිණුමට බැර කර ඇත.මෙම මුදල ගිණුමෙන් ආපසු ලබා ගෙන ආදේශක සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට එකතු කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු බැවින්,මෙම මුදල ආපසු ලබා ගැනීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

<u>යෝජනාව</u>

**6.1.3** 2022 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවල ඩෙංගු මර්දන බලකායේ සේවයේ යෙදවීම පිළිබඳ වැඩ සටහන් වාර්තාව ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

2022 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවල ඩෙංගු මර්දන බලකායේ සේවයේ යෙදවීම පිළිබඳ වැඩ සටහන් වාර්තාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් සභා සම්මත විය.

<u>යෝජනාව</u>

**6.1.4** පුස්සලමුල්ල තිලක වළව්ව අසළ සිට කාලවිල කන්ද දක්වා වූ මාර්ගය “උදාර රණවිරු මාවත” ලෙස නම් කිරීමට අවසර ලබා දෙන මෙන් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

පුස්සලමුල්ල තිලක වළව්ව අසළ සිට කාලවිල කන්ද දක්වා වූ මාර්ගය “උදාර රණවිරු මාවත” ලෙස නම් කිරීමට අවසර ලබා දෙන මෙන් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන

ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මෙම මාර්ගය නම් කිරීම අනුමැතියට ඉදිරිපත් කරනවා.ඒක විධිමත් විදිහට යන්නයි ඕනා. පාරක් නම් කරනකොට ගැසට් කරලා නිවේදනය කරලා යන්න ඕනා.

<u>යෝජනාව</u>

**6.1.5** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසාන ගෙවීම් මුදල වන රු.1323000.00ක් ඉසුරු ගොවි සංවිධානය,ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසාන ගෙවීම් මුදල වන රු.1323000.00ක් ඉසුරු ගොවි සංවිධානය,ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් සථිර කරන ලදී.මෙම යෝජනාව පිළිබඳ මතභේද මතු වූ බැවින් නැවත වරක් පැහැදිලි කර ඉදිරිපත් කරන මෙන් ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් තීරණය විය.

**6.1.6 මුදල් කමිටුවට යොමු කළ යෝජනාවකි.**

<u>යෝජනාව</u>

**6.1.7** 2021 භාණ්ඩ සමීක්ෂණ කමිටු වාර්තාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

2021 භාණ්ඩ සමීක්ෂණ කමිටු වාර්තාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට යෝජනා කරන ලද අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබීය.එහි දී භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි බැවින් ගරු මන්ත්‍රීවරුන් විසින් අදාළ තොරතුරු සොයා බලා ඒ අනුව තීරණයක් ගැනීමට තීරණය විය.

<u>යෝජනාව</u>

**6.1.8** මතුගම නගරයේ වටරවුම අසළ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා ටෙලිකොම් ආයතනය,මතුගම පොලිස් ස්ථානය,ලංකා විදුලි බල මණ්ඩලය,මතුගම වෙළඳ සංගමය,මතුගම ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ ව සාකච්ඡා කළ පරිදි බිල්පත් ගෙවීම සභාව මඟින් සිදු කිරීමට සහ මතුගම පොලිස් ස්ථානයේ ඉල්ලීම පරිදි එම ආරක්ෂිත කැමරා පද්ධතිය සම්පූර්ණ කිරීම සඳහා අඩුවක්ව පවතින ඩයලොග් සමාගමෙන් 4 G රවුටරයක් මතුගම පොලිස් ස්ථානය වෙත ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම නගරයේ වටරවුම අසළ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා ටෙලිකොම් ආයතනය,මතුගම පොලිස් ස්ථානය,ලංකා විදුලි බල මණ්ඩලය,මතුගම වෙළඳ සංගමය,මතුගම ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ ව සාකච්ඡා කළ පරිදි බිල්පත් ගෙවීම සභාව මඟින් සිදු කිරීමට සහ මතුගම පොලිස් ස්ථානයේ ඉල්ලීම පරිදි එම ආරක්ෂිත කැමරා පද්ධතිය සම්පූර්ණ කිරීම සඳහා අඩුවක්ව පවතින ඩයලොග් සමාගමෙන් 4 G රවුටරයක් මතුගම පොලිස් ස්ථානය වෙත ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි වටරවුම සඳහා කැමරා පද්ධතියක් සවි කළා.එයාලට 4G රවුටරයක් අරන් දෙන්න තියෙනවා.අපි රවුටරයක් අරන් දීලා ඒකෙ බිල්පත අපට එන්නේ.අපේ ඔරලෝසු කණුවේ සවි කරලා තියෙන්නේ.ඒකේ දැනට කැමරා ක්‍රියාත්මකයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ඔබතුමා යෝජනාවක් ඉදිරිපත් කළා ඔරලෝසු කණුව අවට කැමරා පද්ධතියක් සවි කරන්න.එහිදී මම හිතන්නේ සභාව විසින් රවුටරයක් අරගෙන දෙනවාට වඩා මම හිතන්නේ මේක ව්‍යාපාරික මහත්මෙකුට දෙන්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වෙළඳ සංගමයෙන් තමයි කැමරා පද්ධතියට හය ලක්ෂ ගාණ ම වියදම් කළේ.රවුටර් එකට පන්දාස් ගාණයි තියෙන්නේ.අපි අරගෙන දුන්නාට වරදක් නැහැ නේද ඒක?අපිට බිල එනවා ඒකේ.නැත්නම් අපි ඒක එයාලට දාන්න කියන්නම්.

<u>යෝජනාව</u>

**6.1.9** මතුගම මහජන පුස්තකාලය,ගල්මත්ත හා යටදොළවත්ත උප කාර්යාලවලට අනුබද්ධ පුස්තකාල මඟින් ලබා දෙන ඡායා පිටපත් සේවය හා අන්තර්ජාල සේවය ලබා දීම,පවතින ආර්ථික තත්වය හමුවේ වියදම් අධික බැවින් පැවති මිළ ගණන්වලට සේවය ලබා දීම අපහසු වී ඇත.එ බැවින් මිළ ගණන් සංශෝධනය කර ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට යෝජනා කරන ලදී.

**<u>ඡායා පිටපත් කිරීම</u>**

| කඩදාසි | තනිපැත්ත (රු) | දෙපැත්ත(රු) |
|---|---|---|
| A4 | 8.00 | 10.00 |
| A3 | 15.00 | 20.00 |
| Legal | 12.00 | 15.00 |
| Print out | 8.00 | 10.00 |
| Type Setting | 60.00 | 80.00 |

**<u>අන්තර්ජාල සේවය</u>**

| | |
|---|---|
| ළමා පැය 01 ක් | රු. 30.00 |
| වැඩිහිටි පැය 01ක් | රු. 60.00 |

<u>තීරණය</u>
මතුගම මහජන පුස්තකාලය,ගල්මත්ත හා යටදොළවත්ත උප කාර්යාලවලට අනුබද්ධ පුස්තකාල මඟින් ලබා දෙන ඡායා පිටපත් සේවය හා අන්තර්ජාල සේවය ලබා දීම,පවතින ආර්ථික තත්වය හමුවේ වියදම් අධික බැවින් පැවති මිළ ගණන්වලට සේවය ලබා දීම අපහසු වී ඇත. එ බැවින් මිළ ගණන් සංශෝධනය කර ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

යෝජනාව

**6.1.10** ආපදාවලින් විපතට පත් ජනතාව නැවත පදිංචි කිරීමට යෝජිත වැලිපැන්න,මවුන්ට්පර්ල් ඉඩම්වල නිවාස සැලසුම් අනුමත කිරීමේ දී,පෙරසැරි ගාස්තුව අය කිරීමකින් තොර ව සිදු කරදෙන ලෙස මතුගම ප්‍රාදේශීය ලේකම්ගේ අංක මතු/සං/2/3/12 ලිපිය මඟින් ඉල්ලා ඇත.නාය යෑමට ලක් ව ඇති ප්‍රදේශවල පදිංචිකරුවන් වන මොවුන් සඳහා පෙරසැරි ගාස්තු අය කිරීමකින් තොර ව සැලසුම් කමිටුවට ඉදිරිපත් කර ගොඩනැඟිලි සැලසුම් අනුමත කර දීම සඳහා ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

**තීරණය**

ආපදාවලින් විපතට පත් ජනතාව නැවත පදිංචි කිරීමට යෝජිත වැලිපැන්න,මවුන්ට්පර්ල් ඉඩම්වල නිවාස සැලසුම් අනුමත කිරීමේ දී,පෙරසැරි ගාස්තුව අය කිරීමකින් තොර ව සිදු කරදෙන ලෙස මතුගම ප්‍රාදේශීය ලේකම්ගේ අංක මතු/සං/2/3/12 ලිපිය මඟින් ඉල්ලා ඇත.නාය යෑමට ලක් ව ඇති ප්‍රදේශවල පදිංචිකරුවන් වන මොවුන් සඳහා පෙරසැරි ගාස්තු අය කිරීමකින් තොර ව සැලසුම් කමිටුවට ඉදිරිපත් කර ගොඩනැඟිලි සැලසුම් අනුමත කර දීම සඳහා ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මද්දුමගේ මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

යෝජනාව

**6.1.11.** මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර උඳුන අළුත්වැඩියා කර ගැනීම සඳහා එල්.ඒ.එල්.ලියනආරච්චි",Lanmo Engineering"සමාගමට රු.660000 .00 ක මුදලක් ගෙවීම් කිරීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

**තීරණය**

මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර උඳුන අළුත්වැඩියා කර ගැනීම සඳහා එල්.ඒ.එල්.ලියනආරච්චි",Lanmo Engineering"සමාගමට රු.660000 .00 ක මුදලක් ගෙවීම් කිරීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.12** 2022 ජුනි මස මහ සභාවේ දී පරිසර කමිටු සාමාජිකත්වය වෙනස් වීම හේතුවෙන් අදාළ අනෙකුත් කමිටු නැවත පත් කර ගැනීම සඳහා කරන ලද මෙම යෝජනාව ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි විය.

යෝජනාව

**6.1.13.** 1989 අංක 12 දරණ පළාත් සභා පනත හි දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව සතු වරිපනම් දේපළ සඳහා වසර 5කට වරක් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු බැවින් ද දැනට ක්‍රියාත්මක වන්නේ 2014 වර්ෂයේ තක්සේරු කර 2016.01.01 සිට ක්‍රියාත්මක කරන ලද තක්සේරුව බැවින් ද, 2020 වර්ෂයේ සිදු කළ තක්සේරු ප්‍රතිශෝධනය 2023 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

**තීරණය**

1989 අංක 12 දරණ පළාත් සභා පනත හි දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව සතු වරිපනම් දේපළ සඳහා වසර 5කට වරක් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු බැවින් ද දැනට ක්‍රියාත්මක වන්නේ 2014 වර්ෂයේ තක්සේරු කර 2016.01.01 සිට ක්‍රියාත්මක කරන ලද තක්සේරුව බැවින් ද,

2020 වර්ෂයේ සිදු කළ තක්සේරු ප්‍රතිශෝධනය 2023 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද **යෝජනාව** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරනු ලැබුයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගැන අපි සෑහීමකට පත් වෙන්නේ නෑ.මොකද යකඩ ඇණයක්,පරාල ඇණයකුත් දැන් රු.30.00ක් වෙනවා.සමහරවිට මෙතන රු.50.00,රු.60.00 දාලා තියෙන වක් කැති අපි දන් නෑ මොන තත්වයේ තියෙනවාද කියලා.ඒ වගේ ම අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන් ටයර් රීබිල් කරන්න කියලා අපි යෝජනා කළා.නමුත් දැන් මේ 75016 ටයර් එකක් රීබිල් කළාට පස්සේ රු.22 000.00ක් විතර වෙනවා දැන්.මේ රු.2500.00ට වගේ දාලා තියෙන්නේ.අපි රීබිල් කළා නම් රු.10 000ක් විතර සභාවේ ප්‍රයෝජනයට ගන්න පුළුවන් මේවා.මේවා ඉතින් හරි අපරාදයක්.එතනින් සභාවට ලොකු අවාසියක් සිදු වෙනවා.ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා මම සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිබඳ පැහැදිලි විරෝධතාවයක් තියෙනවා. භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මීට අවුරුදු දෙකකට කළින් වෙන කොට මම දැක්කා ටෙන්ට් එකක් තියෙනවා සභාවෙන් පිට තැනක.තාම ඒක සභාවට කැඳවලාත් නෑ.වතුර ටැංකි දෙකක් තියෙනවා.ප්‍රේම් එකක් නැත්නම් දෙකක් තියෙනවා.එතකොට මේවා මෙහෙම තියෙද්දි මේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට සඳහන් වෙලා නෑ මේ ටැංකිවල අඩුපාඩුවක් තියෙනවා කියලා.එක ටැංකියක් පලලා විසි කරලා තියෙනවා.ඉතින් මේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව කොහොමද හදන්නේ කියලා මම දන්නේ නෑ.ගිය අවුරුද්දේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඒ ටැංකි දෙක තවමත් එතන තියෙනවා.මේවා සඳහන් වීමක් නෑ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒවා කොහේද තියෙන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

තියෙන තැන් දැන ගන්න ඕන නිලධාරීන්.අපි ඉන්නේ ඒකට නෙමේනේ.ඉතින් මේ වාර්තා කොහොම හදනවාද කියලා අපිට නම් ඇත්තටම තේරුමක් නැහැ.මේවා හදනවාට දීමනාවකුත් ගෙවනවා.ඒත් ඉතින් මේවගේ අඩුපාඩු හොයාගන්න බැරි එකනේ වෙලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒ වාර්තාව සභාවේ අයට බලා ගන්න දෙන්න.දැන් යම් දෙයක් මඟ තියෙනවා නම් ඒක ඒ ගබඩාවෙන් භාර ගන්න කෙනා වගකියන්න ඕනා එයාගේ භාරයේ තියෙනවාද කියලා.ඒක හොයාගෙන පස්සෙන් යන්නේ නැතේ සමීක්ෂණ කණ්ඩායම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මම මේ කියන දේ පැහැදිලි ව අහගෙන ඉන්න.මම කතා කරන්නේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඉන්න කාර්යභාර නිළධාරියා පිළිබඳ නෙමෙයි. භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේදී අවුරුදු දෙකක් තිස්සේ මේක අහුවෙන්නේ නැත්තේ ඇයි කියන එකයි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒක ඇත්ත.ඒ ප්‍රේම් එක ගිය අවුරුද්දේ එතන තිබුණා නම් මේ අවුරුද්දට කොහොමද සමීක්ෂණය කළේ කියන එක ප්‍රශ්නයක් තමයි.කොහේද ඔය තැන?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

සභාපතිතුමා,මට මේකට පැහැදිලි උත්තරයක් දෙන්න.අපි ආවට පස්සේ තමයි මේ වතුර ටැංකි ටික ගෙන්නුවේ.මට කියන්න වතුර ටැංකි කීයක් ගෙන්නලා තියෙනවා ද?දැනට වතුර ටැංකි කීයක් තියෙනවාද කියලා මට කෙටියෙන් කියන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

වතුර ටැංකි 78ක් තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

දැනට එතනින් කීයක් තියෙනවා කියලද කියන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

78ම තියෙනවා කියලා කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මම කියන ටැංකි දෙක දොඩම්ගොඩ ප්‍රාදේශීය සභාවේ ටැංකි දෙකක් නෙමෙයි,මතුගම ප්‍රාදේශීය සභාවේ ටැංකි දෙකක්.මේ ටැංකි දෙකයි ප්‍රේම් එකට අමතර ව තව ටෙන්ට් එකක් තියෙනවා.මම දන්න කාලේ ඉඳන් ඒ ටෙන්ට් එක එතන.දැන් ඒ බඩු තියෙනවා නම් ගැටළුවක් නෑ.අපට ලැයිස්තුව දෙන්නකෝ.මතුගම කාර්යාලයේ ටැංකි කීයක් තියෙනවා ද?යටදොළ,ගල්මත්ත කාර්යාලවල කීයක් තියෙනවාද කියලා අපට වාර්තාවක් දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ කාර්යාලවල භාණ්ඩ ලැයිස්තුවක් පවත්වාගෙන යන්නේ නැද්ද?ඒක තියෙනවා නම් ඉදිරිපත් කළා නම් ඉවරයිනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

උප කාර්යාලවලට ගෙනිහින් තියෙන ටැංකි ටික තියෙනවා.ඒවාට උප කාර්යාලයෙන් තමයි වගකියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

සභාපතිතුමා,වැරදි වැටහීමකට ගන්න එපා.මම මේ කියන ටැංකි දෙක උපකාර්යාලවලවත්,පෙරපාසල්වලවත්,අපට අයිති තැනකවත් නෙමේ තියෙන්නේ.මේ ටැංකි දෙක තියෙන්නේ අපට අයිති නැති තැනක.මම අහන්නේ මේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දී සමීක්ෂණ කරන්න ගියා ම මෙච්චර ටැංකි ප්‍රමාණයක් අඩුයි නම් ඒ ටික නැතුව කොහොමද මේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හැදුවේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් මේ කියන එක හරි.ගිය අවුරුද්දෙත් එතන තිබුණා නම් මේ අවුරුද්දෙත් තාම එතන ම තියෙනවා නම් ඒක භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නැතුව එතන තියෙන්නේ කොහොමද කියන එක අහන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

හෙට දිනේ දී මම සභාවට එනවා.මට දෙන්න මෙතනින් නිකුත් වුණ ටැංකි ටිකයි ඔක්කෝම ටැංකිවල වාර්තාවක්.ටැංකි 78 තියෙනවා නම් ඉතුරු ටැංකි දෙක මම වාහනේක පටවලා අරන් යන්නම්.ආයේ ඉල්ලන්න එපා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නෑ ඒක ගැන හොයලා බලලා නැති එකයි තියෙන්නේ. ටැංකි දෙකක් අවුරුදු දෙකක් පිට පාරේ තියෙනවා නම් ඒක වරදක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

දිගින් දිගටම මේ සභාවේ තියෙන අවිධිමත් බව මේ හරහා පේන්නේ.මම හිතන්නේ මේකට ක්‍රමවේදයක් හදන්න ඕනා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ ටෙන්ට්වල නම් තියෙන්නේ ටෙන්ට් ගෙනියපු තැනින් දවස් 7ක් තියලා ලේසියට තව තැනකට හුවමාරු කර ගන්නවා.මේක අවුරුද්ද අන්තිමේ ඒ භාර ව ඉන්න අය මේ ටික ගෙනත් දෙන්න ඕනා.අපි හිටපු ගමන් සමීක්ෂණයක් කරලා සහතික කර ගන්නවා මේ ටික තියෙනවා කියලා.ඉතින් ඒක කරලා පෙන්නන්න.අර මන්ත්‍රීතුමා ඉල්ලන ලේඛනේ හෙට දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

කොවිඩ් කාල සීමාව තුළ මේ ටැංකි,ටෙන්ට් එකතු කළේ නැති ප්‍රශ්නයක් තිබුණා.නමුත් ඊට පස්සේ මේවා එකතු කර ගන්න තියෙන තැන් පිළිබඳ වාර්තාවක් මේ සභාවෙන් හදන්න ඕනා.මේවා සටහන් වෙලා තියෙන තැනින් නැවත වාරයක් සභාවට ගෙන්න ගන්න.ඇත්තට ම හෙට වෙන කොට කොවිඩ් නිසා මේ ටික එකතු කර ගන්න වුණේ නෑ කියයි.ඒ තැනට පත් වෙන්න එපා.මේ සභාවේ මළ ගෙදරකට දෙන්න ටෙන්ට් එකක්,වතුර ටැංකියක් නෑ.ඒ නැති වෙලා තියෙන්නේ මේ අවිධිමත් ක්‍රියා කළාපය නිසා යි.එනිසා මේක නිවැරදි කර ගන්නයි දිගින් දිගට ම කතා කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් විජේසිංහ මහතා**

මම හිතන්නේ ටැංකි වැඩි වෙලා ඇති.උදාහරණයක් වශයෙන් අපෙන් ටැංකි ඉල්ලුවා ම අපට ටැංකියක් සභාවෙන් ගන්න බැරි වුණා ම පෞද්ගලික සල්ලිවලින් ටැංකි අරන් ගිහින් තියපු තැන් තියෙනවා.අද වනතුරු ඒ ටැංකිවලට වුණ දෙයක් නැහැ.ඒ ටැංකිත් ඔතනට එකතු වෙලා ඇති.පෙත්තකන්දේදි ටැංකි නෑ කිව්වම මම පෞද්ගලික සල්ලිවලින් ටැංකියක් අරන් ගිහින් තිබ්බා.අද වනතුරු ටැංකිය ගැන මොකුත් ආරංචියක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

ඇත්තට ම ටැංකි පිළිබඳ ප්‍රශ්නයක් ආවාට පස්සේ මම සැකේට ඇමතුමක් දීලා බැලුවා.ටැංකි දෙකක් තියෙනවා තල්ගස්ගොඩ.ඒ ටැංකි දෙක මම ගෙනියපු එකක් නෙමෙයි.ගෙනිච්චේ කාගේ හරහා ද මම දන්නේ නෑ.එතකොටෙ මේ ගණන් හැදීම් වෙන්නේ කොහොමද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ ටැංකි සහ ටෙන්ට්වලට භාර ව සභාවේ සේවකයෙක් ඉන්නවා.එයාගේ ගිණුමට මේ තොරතුරු ටික එනවා.මම කියන්නේත් මේක දැඩි ව පාලනය කරලා කරන්න.ඒ කරන කොට අපහසුතාත් එයි. කොට්ඨාශේ ඇතුලේ මොනවා හරි වෙනවා නම් සභාවේ මොනවා හරි දෙයක් ගෙනියනවා නම් අඩු ම තරමේ ඒ ගමේ මන්ත්‍රීතුමාවත් දැනුවත් වෙන්න ඕනා.ඒක තමයි මෙහෙම අස්ථානගත වෙන්නේ.ඒකෙන් සභාවට පාඩුවක් වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඇත්තටම මේකේ තත්ත්වේ ජේනවානේ.මේ අක්‍රමිකතා රැසක් එක්ක මේ සභාව යන්නේ.මේවාගේ වගකීම ගන්න කවුරුවත් නැහැ.වගකීම ගන්න වෙලා තියෙන්නේ මේවා හොයන අපට.මේ වෙන දේවල් එක්ක යම්කිසි නිලධාරීන් පිරිසක් ගැන අපට කලකිරීමක් තියෙන්නේ.
තව අංක **6 නාමල් හාඩ්වෙයාර්-ප්ලාස්ටික් පුටුවල "ප්‍රාදේශීය සභාව,මතුගම"අකුරු මුද්‍රණය සඳහා තීන්ත මිළ දී ගැනීම.**මේ පුටු කොහෙන්ද ගෙනාවේ?අපි නම් මේ පුටුවක් ඇහැටවත් දැක්කේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නැහැ ප්‍රජා මණ්ඩලවලට දීපු පුටුවල නම ගැහුවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අපේ ප්‍රජා මණ්ඩලවලට ලැබිලා නැහැ.අපි දන්නේ නැහැ.ඒකයි මේ ඇහුවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
දැන් මන්ත්‍රීවරු දුරකථන දීමනාව ගන්නේ නැහැ.ආහාර වේලේ බත් පැකට් එක ගන්නේ නැහැ.අඩුම ගානේ මොනවා හරි තොරතුරක් තියෙනවා නම් මේ මන්ත්‍රීවරු දැනුවත් කරන්න ඇමතුමක් දීලා.දැන් මෙතන රු.10 000.00ක් ගන්නවා මන්ත්‍රීවරුන්ට තේ එකක් දෙන්න.ඒ වගේ බිල් එක අපි දැකලා නැහැ.ඒ 10000න් රෝල්ස් එකක් බැරි නම් පැටිස් එකක්වත් දෙන්න පුළුවන්නේ.එක්කෝ මොකක් හරි වැඩ පිළිවෙලක් මේකට හැදෙන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**
මම යෝජනාව ගෙනාවේ මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව සහ දිවා ආහාරය නතර කරන්න පමණයි.හැබැයි පෙ.ව.10.00ට දෙන කේක් කෑල්ල නතර කරන්න කිව්වේ නැහැ.ඒක කොහොමද වුණේ කියලා පුදුම ගැටළුවක්.ඒ කියන්නේ මේ ගෙනාපු යෝජනාව හරියට තේරුම් අරගෙන නැහැ.අපි ගෙනාවේ සද්භාවයෙන්.අදින් පස්සේ මාස 6 ඉවරයි.ඊළඟ සභා වාරේ යෝජනාවක් දාලා සම්මත කරන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ අපි ඉල්ලපු වාර්තාවලට අපට උත්තර දෙන්න පුළුවන්කමක් තියෙනවා ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් ගෙවීම් ගැන මතභේදාත්මක ඒවා අපි පසුවට ගන්නවා.දැන් යෝජනා ටික ගැන සාකච්ඡා කරමු.

## 6.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

<u>යෝජනාව</u>

6.2.1 ඉදිගස්තුඩුව ගම ප්‍රධාන පිවිසුම් මාර්ගය වාහන දෙකක් මාරු වීමට නොහැකි ස්ථානයක් බැවින් මාර්ගයේ වම් පස පැති කානුවක් ඉදි කොට දෙපස පස් දමා සංවර්ධනය කර දෙන ලෙස ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ඉදිගස්තුඩුව ගම ප්‍රධාන පිවිසුම් මාර්ගය වාහන දෙකක් මාරු වීමට නොහැකි ස්ථානයක් බැවින් මාර්ගයේ වම් පස පැති කානුවක් ඉදි කොට දෙපස පස් දමා සංවර්ධනය කර දෙන ලෙස ගරු සභාවට

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**
ඉදිගස්තුඩුව පාර කියන්නේ සම්පූර්ණයෙන් ම සංවර්ධනය වූ මාර්ගයක් නෙමෙයි.මේ ඉදිගස්තුඩුව ගමට හැරෙන ප්‍රධාන ස්ථානය යි.අද එක පැත්තක පෞද්ගලික ඉඩමක වැටක් තියෙනවා.සාමාන්‍යයෙන් අඩි 18ක වගේ ප්‍රමාණයක ආරම්භක ස්ථානය තියෙනවා.ඒ ආරම්භක ස්ථානය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙන් කරලා කාණුව ආරම්භයක් තියලා තියෙනවා.එතැන් සිට ඉදිරියට පැති කාණුව ඉදි කරලා පස් දාලා ගොඩ කරලා හංදිය සංවර්ධනය කරලා දෙන එකයි මේ යෝජනාව.ඇත්තටම මේ ස්ථානයේ අනිත් පැත්තේ වාහනයක් නවත්වලා තිබුණොත් අනිත් පැත්තෙන් ඊ ළඟ වාහනේට යන්න පුළුවන්කමක් නැහැ.සාමාන්‍යයෙනක් ගමට පයින් යන අයට මේ අවස්ථාවේ දී එතනින් එහා පැත්තට යන්න විදිහක් නැහැ.මේ වගේ ක්‍රමයක් තමයි මෙතන තියෙන්නේ.ගමක් තියෙනවාද කියලා පේන්නවත් මේ ස්ථානය සංවර්ධනය වෙලා තියෙන්න ඕනා.ඒ නිසා මේ ස්ථානය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.2022 වර්ෂය වෙනුවෙන් මන්ත්‍රීවරුන් සඳහා දෙන සභා ප්‍රතිපාදනවලින් මේ යෝජනාව කරන්න කියන එක තමයි මගේ ඉල්ලීම.නමුත් මේ යෝජනාවත් එක්ක මේක ක්‍රියාත්මක කරන්න නොහැකි බව දක්වා එවන ලද ආණ්ඩුකාරතුමාගේ චක්‍රලේඛනයක් මෑත් සමඟ ම අපේ ලේකම්තුමිය එවා තියෙනවා.එතකොට මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් ද කියන එක තවත් ප්‍රශ්නයක්.තව දෙයක් කියන්න ඕනා. ඉදිගස්තුඩුව ප්‍රධාන පාර වලවල් හැදිලා විනාශ වෙලා තිබුණේ.ඒක මෑතකදි අපේ ගරු සභාපතිතුමා කර දුන්නා.ඒ සම්බන්ධයෙන් ස්තූතිය පුද කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි මේ යෝජනා දාලා ආණ්ඩුකාර අනුමැතිය ඉල්ලනවා නඩත්තු වැඩ යටතේ මේවා කරන්න දෙන්න කියලා.අපිට ඒක නොලැබුණොත් අපි දැනුවත් කරන්නම්.

**6.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

<u>යෝජනාව</u>

6.3.1 අපවත් වී වදාළ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අති පූජ්‍ය බොන්දුපිටියේ නාගතිස්ස ස්වාමීන් වහන්සේ, ගම් ප්‍රදේශයට කරන ලද ශාසනෝන්නතික සහ දේශපාලන මෙහෙවර අගය කිරීම් වස්, උන් වහන්සේට කරන ලද ගෞරවයක් වශයෙන් බොන්දුපිටිය-පොල්දූව මාර්ගයෙන් සහ තල්ගස්ගොඩ-ලද්දුව මාර්ගයෙන් විහාරස්ථානයට පිවිසෙන මාර්ගය "අති පූජ්‍ය බොන්දුපිටියේ නාගතිස්ස හිමි මාවත "ලෙස නම් කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>
අපවත් වී වදාළ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අති පූජ්‍ය බොන්දුපිටියේ නාගතිස්ස ස්වාමීන් වහන්සේ, ගම් ප්‍රදේශයට කරන ලද ශාසනෝන්නතික සහ දේශපාලන මෙහෙවර අගය කිරීම් වස්, උන් වහන්සේට කරන ලද ගෞරවයක් වශයෙන් බොන්දුපිටිය-පොල්දූව මාර්ගයෙන් සහ තල්ගස්ගොඩ-ලද්දුව මාර්ගයෙන් විහාරස්ථානයට පිවිසෙන මාර්ගය "අති පූජ්‍ය බොන්දුපිටියේ නාගතිස්ස හිමි මාවත "ලෙස නම් කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය**

මේක සභා අනුමැතියට නෙමෙයි මගේ යෝජනාවක් හැටියටයි මම ඉදිරිපත් කළේ.ඒක නිවැරදි ව මුද්‍රණය විය යුතුයි.මේක මගේ පෞද්ගලික යෝජනාවක් හැටියට නෙමෙයි ගරුතර ස්වාමීන් වහන්සේ,ගරු සභාපතිතුමා,ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු ම මන්ත්‍රී මණ්ඩලයෙන් සහ ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලයේත් යෝජනාවක් විදිහට අපි සලකන්න ඕනා.මොකද උන් වහන්සේ මතුගම ප්‍රාදේශීය සභාව නියෝජනය කර මන්ත්‍රීධූරයක් හෙබවූ ස්වාමීන් වහන්සේ නමක් නිසා.ගිය සභා වාරයේ දී සියලු දෙනා ම අදහස් දැක් වූ නිසා වැඩිදුර ගුණකථන අවශ්‍ය නැහැ.මේක කඩිනමින් ඉෂ්ඨ සිද්ධ කරලා දෙන්න කියලා තමයි මට ඉල්ලීමක් කරන්න තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

අපි මේ ප්‍රාදේශීය සභාවල පාරවල් නම් කිරීමේ දී ඉදිරියට විශාල ගැටළුවක් වෙනවා.ඒ නිසා විශේෂයෙන් ම වාර්තාවට කියා සිටිනවා 198 වන වගන්තිය යටතේ මේ කාරණය ඉෂ්ඨ සිද්ධ කරන්න කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේකට "බොන්දුපිටිය නාගතිස්ස නාහිමි මාවත" කියලා ඇතුලත් කරමුද?ඒක එකතු කරගමු.නැත්නම් කවුරුහරි මේකේ අඩුවක් දැක්කොත්.සංශෝධනයක් එක්ක මන්ත්‍රීතුමිය කැමතියි නේද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

ඇත්තටම සතුටුයි මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳ ව.විශේෂයෙන් ම ස්තූතිවන්ත වෙන්න ඕනා ප්‍රියංකා මන්ත්‍රීතුමියට.හැබැයි මේකේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා.මෙතුමිය යෝජනාව දාලා තියෙන්නේ මාර්ග දෙකකට.පාරවල් දෙකකට මම හිතන්නේ එක ම නමකින් නම් කරන්න බැහැ.වටරවුම පාරක් කියලා එකක් එහේ නෑ මම දන්න තරමට.අනිත් එක මේ තල්ගස්ගොඩ පාර මීට ටික දවසකට කළින් රණවිරුවකුගේ නමින් නම් කළා.දැන් මාස 3-4ට කළින් දාපු නමක් වෙනස් කරලා වෙන නමක් දාන්න බෑනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නෑ මන්ත්‍රීතුමා මේ දාලා තියෙන්නේ මැද පාර කියන එකයි මට හිතෙන්නේ.
කතා කරලා තීරණයක් ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය**

මේ නම් කළේ බොන්දුපිටිය-පොල්දූව මාර්ගයෙන් සහ තල්ගස්ගොඩ-ලද්දූව මාර්ගයෙන් විහාරස්ථානයට පිවිසෙන මාර්ගය යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මටත් පේන හැටියට මේ නම් කරලා තියෙන්නේ මැද කොටස.මම හිතන්නේ නිවැරදි දාලා තියෙන විදිහ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

නායක ස්වාමීන් වහන්සේට මාර්ගයක් නම් කළ එකට ප්‍රසාදය පල කරනවා.හැබැයි ඒ පාරේ කැඩුණු තැන් හදලා තමයි කරන්න ඕනා.

## 6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මද්දුමගේ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

<u>යෝජනාව</u>

6.4.1 අගලවත්ත සිට කොළඹ දක්වාත් වැලිපැන්න සිට කොළඹ දක්වාත් පොදු පාසල් සේවා බස්රථයක් ධාවනය කිරීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

අගලවත්ත සිට කොළඹ දක්වාත් වැලිපැන්න සිට කොළඹ දක්වාත් පොදු පාසල් සේවා බස්රථයක් ධාවනය කිරීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලද බැවින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

අගලවත්ත සිට කොළඹ දක්වාත් වැලිපැන්න සිට කොළඹ දක්වාත් පොදු පාසල් සේවා බස් රථයක් ධාවනය කිරීමට මම යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා.දැනට මෙහෙන් පෞද්ගලික බස් රථ හෝ රජයේ බස් රථ ගමන් කරනවා.ඒක අපට ගැටළුවක් නැහැ.නමුත් දැනට ළමුන්ට පාසල් යන්න බැරි තත්වයට පත් වෙලා තියෙනවා.බස් රථවල ප්‍රවාහන ගාස්තුව අධික වීම හේතුව යි.ඒක නිසා මේකට අපි දන්න හිතවත් පරිත්‍යාගශීලී පුද්ගලයෙක් පෞද්ගලික බස් රථයක් හරි ධාවනය කරනවා නම් ඒක ලොකු දෙයක්.සියලුම පාසල් සඳහා පොදුවේ ගමන් කිරීමටයි මෙම බස් රථය මම යෝජනා කරන්නේ.සියලු ම පාසල් ආවරණය වන පරිදි මේ සඳහා වාර ප්‍රවේශ ක්‍රමයක් යටතේ ගමන් කිරීමටයි මම යෝජනා කරන්නේ.දැනට මේ නගරයේ ඉන්නවා මුදල් තියෙන මේ වගේ බස් රථයක් ධාවනය කරවන්න පුළුවන් අය.ඒ අයට මේක අවසරයක් අරගෙන දෙන්න පුළුවන්.එතකොට ඒ බස් රථය උදේ සවස දවසට දෙපාරක් ධාවනය කරන්න පුළුවන්.මෙමඟින් විශේෂයෙන් ම දරුවන්ට ආරක්ෂාවත් සැලසෙනවා.මොකද මේක මේ කාලයේ සිද්ධ වෙන්න ඕන වැඩක් කියන එකයි මම කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

මම හිතන්නේ මේක කාලෝචිත යෝජනාවක්.දැන් මේ තියෙන තත්ත්වය අනුව පාසල් දරුවන්ට පවා අසීරු කාලයක් උදා වෙලා තියෙන්නේ.අම්මලා තාත්තලාට බස් රථ කිහිපයක දරුවන් ව යවන්න අපහසුයි.ඒ නිසා මේ සම්බන්ධ ව කඩිනමින් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කරලා මෙම බස් රථය කඩිනමින් ලබා දීමට කටයුතු කරනවා නම් ගොඩක් වටිනවා.එදා වේල උපයගෙන කාලා ජීවත් වෙන අයට මේක ලොකු පිටිවහලක් වෙනවා.මේවගේ කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධ ව මම ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අපි මේ ආයතනවලට දැනුම් දෙන්නම්.කවුරු හරි බස් රථයක් යොදන්න ඉදිරිපත් වෙනවා නම් වඩා හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**

මේක හොඳ යෝජනාවක්.මොකද අද පාසල් දරුවන්ට කොළඹ ගිහින් ඉගෙන ගන්න නම් විශාල වියදමක් දරන්න වෙනවා.මේක හොඳම දේ ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයා දැනුවත් කරලා ලංගම බස් රථයක් දැම්මොත් අපට මාසික වාර ප්‍රවේශපත්‍රයක් ලබා ගන්න පුළුවන්.එතකොට පොඩි ගාණක් යන්නේ.නැත්නම් පෞද්ගලික බස් රථයක් දැම්මොත් තරමක් විශාල වියදමක් දරන්න වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මේක ඇත්තට ම කාලෝචිත යෝජනාවක්.අද බස් ගාස්තුව ඉතා ඉහළ මට්ටමකට ගිහින් තියෙන්නේ.මේ සඳහා කවුරු හරි පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට මාර්ග අවසර පත්‍රයක් නැතුව මේකේ ධාවනය කරන්න අවස්ථාවක් ගන්න.මම හිතන්නේ මේ වෙලාවේ අවසර පත්‍රයක් ලබා ගන්න බැහැ.ඒක නිසා කවුරුහරි ව්‍යාපාරිකයෙක් සම්බන්ධ වෙලා මේක කරනවා නම් ඒ ව්‍යාපාරිකයාගේ පැත්තෙන් ඔහුටත් හොඳයි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒක අපි ගමනාගමන මණ්ඩලය දැනුවත් කරන්නම්.කොටහරි පුළුවන් ද පෞද්ගලික ව මැදිහත් වෙලා මේ සඳහා බස් රථයක් යොදවන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාලංචිදුරගේ මිත්‍රානන්ද මහතා**

අපේ අතුල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්.මොකද අද සමාජයේ බස් ගාස්තුව බොහෝ ඉහළ ගොස් ඇති අවස්ථාවක මෙවැනි යෝජනාවක් කරලා මේ කටයුතු ඉෂ්ට කරන්න පුළුවන් නම් ඉතා වැදගත්.නමුත් ප්‍රශ්නයක් තියෙනවා.අපේ සභාවට බස් රථයක් ගන්න පුළුවන්කමක් නැහැ.ඒ නිසා හොඳ පරිත්‍යාගශීලී බස් හිමියෙකු සම්බන්ධ කරගෙන ක්‍රමානුකූල ව මේක පවත්වා ගෙන යන්න කටයුතු කරලා දෙනවා නම් ඉතාමත් ම හොඳයි.අපේ විපක්ෂනායකතුමා ජගත් මන්ත්‍රීතුමා එක්ක බොහෝ සම්බන්ධ යි.ඉතින් කතා කරලා මේ සඳහා පරිත්‍යාගශීලී සේවාවක් ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරනවා නම් ඉතාමත් ම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-**

<u>යෝජනාව</u>

6.5.1 වැලිපැන්න සහ යටදොළ උප කාර්යාලවලට කොම්පෝස්ට් අළෙවි මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කරන මෙන් ගරු **ප්‍රාදේශීය** සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ගරු සභාවට යෝජනා කරන **ලදී.**

**<u>තීරණය</u>**

වැලිපැන්න සහ යටදොළ උප කාර්යාලවලට කොම්පෝස්ට් අළෙවි මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කරන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහ සම්මත විය.

**<u>යොජනාව</u>**

6.5.2 වලගෙදර ලැබුවැල්ගොඩ මාර්ගයේ හානියට පත් වී ඇති ස්ථාන තාර දමා පිළිසකර කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් **ගරු** සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

වලගෙදර ලැබුවැල්ගොඩ මාර්ගයේ හානියට පත් වී ඇති ස්ථාන තාර දමා පිළිසකර කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් **ගරු** සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහ සම්මත විය.

**<u>යෝජනාව</u>**

6.5.3 කොළණිය සුසාන භූමියේ සභාවට අක්කර බදු ගෙවමින් සිටින දීර්ඝකාලීන ව ජීවත් වන අය සඳහා එම භූමින් වෙන් කොට දැනට පවතින සුසාන භූමියේ ප්‍රමාණය වෙන් කිරීමට පියවර ගන්නා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

තීරණය

කොළණිය සුසාන භූමියේ සභාවට අක්කර බදු ගෙවමින් සිටින දීර්ඝකාලීන ව ජීවත් වන අය සඳහා එම භූමින් වෙන් කොට දැනට පවතින සුසාන භූමියේ ප්‍රමාණය වෙන් කිරීමට පියවර ගන්නා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදී.

මම හිතන්නේ අපි මාස කිහිපයක් තිස්සේ කොම්පෝස්ට් අංගනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ ව ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ මට්ටමින් අවශ්‍ය කරන සාධාරණය ඉෂ්ඨ කළා.එහි දී කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රමවත් ව සිදු කරගෙන යන්න වැඩසටහනක් ඉදිරිපත් කළා.ඒකට යම්කිසි සාධාරණයක් කරමින් මේ සභාව කරගෙන යනවා.එයට ස්තූතිවන්ත වෙන්න ඕනා.අපි කොපමණ කොම්පෝස්ට් නිශ්පාදනය කළත් ඒකේ ප්‍රධාන අරමුණ විය යුත්තේ අපේ වගා ව්‍යාපෘතීන් සඳහා මිනිස්සුන්ට අවශ්‍ය කරන කොම්පෝස්ට් ප්‍රමාණය ලබා ගැනීමට පෙළඹවීම යි.ඒ ආර්ථික අපහසුතා එක්ක මතුගම නගරයටම ඇවිත් කොම්පෝස්ට් ලබා ගැනීමට සිදු වුණොත් ගෘහස්ථ ව වගා කරන අය අපහසුතාවයට ලක් වෙනවා.ඒ අයට සාධාරණයක් කරන්න දිරි ගැන්වීමක් වශයෙන් කොම්පෝස්ට් අංගන දෙකක් වැලිපැන්න උප කාර්යාලයේ සහ යටදොළ කාර්යාලයේත් කඩිනමින් ස්ථාපිත කිරීමට ඉල්ලා සිටිනවා. අපේ කුණු එකතු කරන ට්‍රැක්ටර් දිනපතා මෙම උප කාර්යාලවලට යනවා.ඒ නිසා එය ප්‍රවාහනයට අපහසු නැහැ.අපේ සේවකයෙක් පත් කරලා ඒ සඳහා වගකීම ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

6.5.2 වලගෙදර ලැබුවැල්ගොඩ මාර්ගයේ හානියට පත් වී ඇති ස්ථාන තාර දමා පිළිසකර කරන ලෙස කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමා පැමිණ ලැබුවැල්ගොඩ මාර්ගය පරීක්ෂා කළ බව මට දැනගන්නට ලැබුණා.අධිවේගී පිවිසුමෙන් කි.මී.එකහමාරක් ප්‍රධාන මාර්ගයෙන් ගම්මානයට පිවිසීමට ඇති මාර්ගය මෙයයි.මෙම මාර්ගය කිලෝ මීටරයක් පමණයි තියෙන්නේ.අවුරුදු ගණනාවකට පෙරයි මෙම මාර්ගයේ සංවර්ධන කටයුත්තක් සිදු වී තිබෙන්නේ.මම මේ මාර්ගය සම්බන්ධයෙන් මේ ගරු සභාවේ කිහිප වතාවක් යෝජනා ඉදිරිපත් කරනු ලැබුවත් කිසිඳු සංවර්ධනයක් සිදු වුණේ නැහැ.මේ ගරු සභාවට කියන්න ඕනා මගේ කලාපයේ මම නියෝජනය කරන කොට්ඨාශයේ තවම එක ම අවස්ථාවකවත් මේ සභාව මඟින් තාර දමා සංවර්ධනය කිරීමක් සිදු වුණේ නැහැ.ඒ නිසා ඉතාමත් අපහසු තත්වයේ තියෙන මේ මාර්ගය සංවර්ධනයට ඔබතුමාගේ අවධානය යොමු කර අවශ්‍ය වැඩ පිළිවෙල සකසන මෙන් ඉල්ලා සිටිනවා.

6.5.3. සුසාන භූමි සම්බන්ධ යෝජනාවේ දී අවුරුදු 50කට වඩා වැඩි කාලයක් අක්කර බදු ගෙවමින් පවුල් 50ක් සථිර නිවාස හදාගෙන ජීවත් වෙනවා.දැන් ඒ නිවෙස්වල ජීවත් වෙන්නේ දෙවැනි පරම්පරාවයි.අපේ සභාවටත් අයිති මෙම සොහොනේ භූමි කලාපයේ නිවාස සඳහා වෙනම වෙන් වෙලා සොහොන් භූමිය වෙන ම වෙන් කරගෙන තියෙන්නේ.ඔවුන් ජීවත් වන මේ ප්‍රදේශයේ භූමි ප්‍රමාණය වෙන් කර ගැනීමටයි අවශ්‍ය ව තියෙන්නේ.ඒ ප්‍රදේශවාසීන් පවසන අයුරින් ඔවුන්ට මෙ පමණ කළක් කිසිඳු සාධාරණයක් ඉටු වී නැහැ.මැණුම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා වැය වන මුදල ඔවුන්ගේ වියදමින් දරා ගැනීමට පවා ඔවුන් කැමතියි.සභාවේ අධීක්ෂණය යටතේ ඒ කටයුතු සිදු කර දෙන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අපි හොයලා බැලුවා සුසාන භූමියේ අක්කර බදු අපි ගන්නේ නැහැ.ඒක ගන්නේ ගොවිජන සේවා මධ්‍යස්ථනය හරහායි.ඉතින් මේ ඉන්න පවුල් 5ට අගතියක් නොවන මෙන් අපි කටයුතු කරමු.එයාලා අනවසර පදිංචියක් හැටියටයි පේන්නේ.අපි ඒ අය ඉවත් කරන්නට නෙමෙයි අගතියක් නොවන විදියටයි ක්‍රියා කරන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

6.5.1. යෝජනාවට මම හිතන්නේ කොම්පෝස්ට් පොහොර අළෙවි කිරීමට ගම් මට්ටමින් හෝ ස්ථාන ස්ථාපිත කිරීම බොහෝ වටිනවා.අපේ වසමේ මිනිස්සු බොහෝ විට බේරුවල කලාපයට තමයි පොහොර වර්ග ලබා ගැනීමට යන්නේ.ඒ නිසා හැම ගම් ප්‍රදේශයකට ම කොම්පෝස්ට් පොහොර අළෙවි කරන මධ්‍යස්ථානයක් පිහිටු වීමට පුළුවන් නම් කාලෝචිත යි.මේ හරහා සභාවටත් යම් ආදායමක් ලබා ගන්න පුළුවන්.ඒ නිසා මේක හොඳ යෝජනාවක්.එය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිනවා.

6.5.2. ලැබුවැල්ගොඩ මාර්ගය හානියට පත් වෙලා තියෙන ආකාරය අපිත් දැක්කා.ඒ නිසා එම ප්‍රදේශවලට පිට පළාතකින් පිරිසක් පැමිණියහොත් මේ මාර්ගය අබලන් ව පැවතීම අපටත් හොඳ නැහැ.ඒ නිසා මෙම යෝජනාවත් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිනවා.

6.5.3. සුසාන භූමි සහ මිනී පිටි ආඥා පනත ගැන අපේ අතුල මන්ත්‍රීතුමා දැන්වූවා.එහි විධිවිධාන අනුව ඒක අපට කරන්න බැහැ.මේක කළොත් අපට හිරේ යන්න වෙන්නේ.ඒ නිසා මේක මනින්න ඔප්පු හදන්න ගියොත් ඒ පවුල්වලට ලොකු අසාධාරණයක් වෙනවා.ඒ නිසා මෙම යෝජනාව මෙම අවස්ථාවට කාලෝචිත නැති බව හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

6.5.1.හොඳ යෝජනාවක්.නමුත් මෙම යෝජනාවට කළින් කොම්පෝස්ට් අංගනයේ ක්‍රියාකාරීත්වය වැඩි කළ යුතුයි.අපි මේක දිගටම කතා කළා.අනිත් උප කාර්යාලවලට මේ කොම්පෝස්ට් යවන්න කළින් අපේ ධාරිතාවය වැඩි කර ගන්න ක්‍රමවේදයක් සකසන මෙන් ඉල්ලා සිටියා. කොම්පෝස්ට් අංගනයේ කුණු එක් රැස් වෙලා වැඩි කියලා ඒවා ඉවත් කරන්න යෝජනාවක් කමිටුවේ දී ආවා.ඒ වෙලාවේ මට මතක විදිහට සභාපතිතුමා සහ ලේකම්තුමියත් හිටියා.ඒ වැඩි කුණු ඉවත් කරන්න අවස්ථාවක් ඉල්ලපු වෙලාවේ මම කිව්වේ ඉවත් කරන්න එපා කියලා.පසු ව ඒක ඉවත් කරන්න තීරණයකට ආවාම "සෙන්.පීටර්ස්"එකේ තැනක දාන්න කියලා මම කිව්වා.පසු ව ඒකට කට කතාවක් ගිහින් තියෙනවා මම කොම්පෝස්ට් අංගනයට ඇවිත් සහ කමිටු සාමාජිකයෙක් වෙලා කතා කළේ මේ කුණු මට ගෙනියන්න කියලා.මම දැන් ඉල්ලීමක් කරනවා මේ සභාව කාරක සභාවක් කරලා මේ රියදුරන් ව ගෙන්නලා අහලා මේ කොම්පෝස්ට් කොහේට ද අරගෙන ගියේ කියන එක සභා වාර්තාවට ඇතුළත් කරන්න කියලා.මොකද ඒවා කොහේවත් සඳහන් වෙලා නැහැ.ඒක වැරදි පූර්වාදර්ශයක් දෙන්නේ.ඒක නිවැරදි කරන්න කියන ඉල්ලීම කරනවා.මම වගා කරන කෙනෙක් විදිහට මමත් මේ කොම්පෝස්ට් කොට්ට ගන්නේ සල්ලිවලට.එතකොට සභාවෙන් රු.800.00ට නොගෙන මම රු.1100.00 ගානේ ගත්තේ මම මේ කමිටු සාමාජිකයෙක් නිසා.අඩු ම තරමේ සහන මුදලට මට හිමි කොට්ට 5වත් මම ගත්තේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

කවුරුහරි මේ නොකියපු දෙයක් වැරදි විදිහට කියලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**

6.5.3 යටතේ සුසාන භූමි සම්බන්ධ ව අපේ වැල්කන්දල ප්‍රදේශයේ සුසාන භූමියේ මේ වෙනකොට පුද්ගලයින් කිහිප දෙනෙක් විසින් විශාල ගස් කොළන් කපලා ඒව ප්‍රවාහනය කරලා විකුණනවා.මම සභාපතිතුමාව දැනුවත් කළා.එතුමා කිව්වේ මේ ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති බවයි.නමුත් එම ඉඩමේ ගහලා තියෙනවා ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් කියලා.(කෙවෙලන්ද සුසාන භූමිය කියලා)එතන තියෙන ගහත් කපලා මේ පිරිස ප්‍රවාහනය කරලා තියෙනවා.මම පුද්ගලයාවත් හඳුන්වලා දුන්නා.ගරු සභාපතිතුමනි,මේ වෙනකොට මිනී භූමදානය කිරීමට සුළු ඉඩ ප්‍රමාණයක් තමයි වෙන් වෙලා තියෙන්නේ.ඒ තියෙන ටිකත් කපලා ප්‍රදේශවාසීන් වගා කිරීම සඳහායි සූදානම් වෙන්නේ.මේකට ප්‍රාදේශීය ලේකම්තුමියත් දැනුවත් කරලා කඩිනම් පියවරක් ගන්න ඕනා.මෙම ඉඩම මැනලා සභාවට පවරා ගන්න මෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

මේ සුසාන භූමි සම්බන්ධ ව කතා කළ නිසයි අදහස් දක්වන්නේ.මීට පෙර සභාවේ දාපු යෝජනා බහුතරයක් ක්‍රියාත්මක වුණේ නැහැ.ඒ පිළිබඳ ව කණගාටුව ප්‍රකාශ කරනවා.මම සභාවට පත් වුණ මුල් ම දවස්වල සුසාන භූමි නිරවුල් කරන්න කියලා යෝජනා දෙකක් දැම්මා.මේ වෙන කොට බෝපිටිය පොදු සුසාන භූමිය අක්කර දෙකක ප්‍රමාණයෙන් පර්චස් 20ක්වත් අද වෙන කොට ඉතුරු වෙලා නැහැ.ඒකෙත් මිනිසුන් දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ මේ දවස්වල කරපු හැම භූමදානයක ම සොහොන් කොත් බැන්දා.අද වෙනකොට පොදු සුසාන භූමියේ මිනියක් භූමදාන කරන්න ඉඩ ඉතුරු වෙලා නැහැ.ඒ වගේ ම කැටගොඩ පොදු සුසාන භූමිය වටේත් භෝග වගා කරලා.සුසාන භූමි නිරවුල් කරන්න කියන එකෙන් මම ඉල්ලා සිටියේ අල්ලා ගෙන සිටින ප්‍රමාණය ගන්න කියන එක නෙමෙයි,දැනට ඉතිරි ප්‍රමාණය වැටක් ගහලා නිරවුල් කරලා දෙන්න කියලයි.කඩවක පොදු සුසාන භූමියේත් එලෙස ම යි.ඒ නිසා මේක මහජනතාවට ගැටළුවක්.මේ හරහා භූමදාන කරන්න කියන මිනී වළලන්න ඉඩක් නැති වෙනවා.එ නිසා මේ පිළිබඳ වැඩි අවධානය යොමු කරන්න.සියලු ම සුසානභූමිවල සොහොන් කොත් බඳින එක තාවකාලික ව නැවැත්වූයේ නැති වුණොත් මේ ඉඩ කඩ පිළිබඳ විශාල ගැටළුවකට මුහුණ පාන්න වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

සොහොන් භූමි සම්බන්ධ යෝජනාව ඇත්තට ම හොඳ එකක්.මොකද හැම තැන ම තියෙන ප්‍රශ්නයක් තමයි සොහොන් භූමිවල වගා කරන්න පටන් අරන් තියෙන එක.අනිත් එක පොදු කටයුතුවලට ඉඩම් අල්ලා ගන්නවා.අපේ තල්ගස්ගොඩත් සැහෙන ඉඩම් ප්‍රමාණයක් තියෙනවා.මේ මැනලා තියෙන ඉඩම් ටිකවත් වෙන් කර ගන්න ඕනා.ඒ වගේ ම අද වන විට හැමෝම සොහොන් කොත් බඳිනවා.කලක් යනකොට ඒ පොදු ඉඩමම සොහොන් භූමියක් බවට පත් වෙලා ඉවරයි.ඒ නිසා ඒක නවත්වන්න ඕනා.සොහොන් පිටි සඳහා මේ ඉඩම් බෙදලා වෙන් කරලා දෙන්න ඕනා.මේ පොදු කටයුතු සඳහා භාවිතා කරන්න තියෙන ඉඩම මිනිසුන්ට හිතුමතේ භාවිතා කිරීමට නොදීමට වගබලා ගන්න ඕනා.මේකට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

කොහොම වුණත් මේක නිවැරදි කරලා ඉඩම් බෙදන්න ගියොත් ප්‍රශ්නයක් වෙන නිසා ඉඩම් බෙදා වෙන් කිරීම නොකළ යුතුයි කියලයි මම කියන්නේ.අපි මේකට මැදිහත් නොවිය යුතුයි.මම දැන්වීම් පුවරුවක් ඉල්ලුවා යටදොළවත්ත සුසාන භූමියට අනවසරයෙන් මිනී තැන්පත් කරන්න එපා කියලා.මම ඉල්ලුවේ අනවසර ඉදිකිරීම් නොකර සභාපති තුමාගේ අණ පරිදි ක්‍රියා කරන්න කියලා.නමුත් ගෙනත් ගැහුවේ "මතුගම ප්‍රාදේශීය සභාවට අයිති සොහොන් භූමියක්" කියලා .

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

කරවිට මන්ත්‍රීතුමා කියන එක ඇත්ත.ඒත් දැන් අපි කොස්ගහදෙණියේ කොළඹිය සුසාන භූමියට ගිහිල්ලා,මේ ඉන්න අය හඳුනාගන්න ගියාම යන නිලධාරීන් මේක වෙන් කරන්න කැමැති වුණොත් හරි.යම්කිසි පරස්පර මතයක් කිව්වොත් දෙන්න බැහැ කියලා, ඒ නිසා ඕක ප්‍රශ්නයක්. ඔබතුමා සහ මේ ප්‍රදේශයේ අනිත් අයත් අපහසුතාවයට පත්වෙන නිසා අපි ඔය විදිහට ඉන්න දීලා සුසාන භූමියේ කටයුතු කරගෙන යමු. මොකද ඔප්පුවක් දෙන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

6.5.1 බොහොම කාලෝචිත යෝජනාවක්. වැලිපැන්න වගේම යටදොළ උප කාර්යාලවල තැනක් ස්ථාපිත කරලා මේ කොම්පෝස්ට් බෙදා හැරීමට කටයුතු කිරීම ආර්ථික අපහසුතාවයක් ඇති මෙම වකවානුවේ දී ඉතා වැදගත් කාර්යයක්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

කොම්පෝස්ට් බෙදා හැරීමට පුස්තකාලවලට දෙමුද?පොදුවේ උපකාර්යාල දෙකටත් දෙමු. පුස්තකාලවලත් තියමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

ඒ වගේම අපි දැනගන්න කැමතියි අද වන විට කොම්පෝස්ට් අංගනයෙන් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා ද කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් මේ අගෝස්තු මාසයේ එක ලැබුණා. අගෝස්තු මාසයේ රු. 45 000.00ක අලෙවි කරලා තියෙනවා. නිෂ්පාදනය කරලා තියෙනවා පොහොර කොට්ට 66ක්.හලපු ටික පිළිබඳ මේ වාර්තාවේ නැහැ. එතකොට මේක මම බලන්න දෙන්නම්.වාහනවලින් අලෙවි සැලට මේ ටික ගෙනත් තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

කොට්ට 56යි මේ හලලා තියෙන්නේ.දවස් දෙකකට හලන්න පුලුවන් ඒවායි මාසෙකට හලලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නෑ මේ දින අටකට හලලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

අපි ඉල්ලා සිටින්නේ මේ කරවිට මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව, නිශ්පාදනයත් තව වැඩි කරලා පුස්තකාල හරහා හෝ ක්‍රියාත්මක කරන්න කියලා.මේක ඊලග සභා වාරෙට කලින්වත් ආරම්භ කරනවා නම් හොඳයි.

සුසාන භූමි පිළිබඳ යෝජනාවක් ගෙනාවා. කසුන් මන්ත්‍රිතුමා මතක් කළ විදිහට මගේ කොට්ඨාශය නියෝජනය කරන දීයගල වසමේ සොහොනේ අවුරුදු තිහකටත් වඩා වැඩි ගෙවල් හතරක් තියෙනවා.රුවන්දි මන්ත්‍රීතුමියගේ කොට්ඨාශයේ සොහොනේ හදලා තියෙනවා ගෙවල් දෙකක්.ඉතින් මේ නිවාස කඩලා සොහොන් භූමිය වෙන් කරන්න වෙන්නේ නැති නිසා මේ තියෙන ප්‍රමාණය ආරක්ෂා කරන්න වැඩපිළිවෙළක් සකසන්න. මින් මතුවට "සොහොන් කොත් බැදීම සපුරා තහනම්" කියලා පැහැදිලිව පුවරුවක් සවි කරන්න,මේ වෙන කොට සභාවට කොපමණ සොහොන් භූමි ප්‍රමාණයක් තියෙනවද කියලා හඳුනාගෙන වැඩපිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිමින් කරවිට මන්ත්‍රීතුමාටත් ස්තුතිය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

සුසානභූමි යෝජනාව හා සම්බන්ධ ව මටත් ගැටලුවක් තියෙනවා.ඔබතුමාට මතක ඇති මගේ ඡන්ද පදනමේ ඉහළම ඡන්ද ප්‍රමාණයක් තියෙන හොලින්බෝන් රණවිජයගම ජනපදයට අයිති සුසාන භූමිය.මම මීට අවුරුදු 2 කට පමණ කලින් සොහොන් කොත් ඉදිකිරීම නවත්වන්න කියලා සභාවට යෝජනාවක් කළා.ඒ අවස්ථාවේ ඔබතුමා මට පොරොන්දුවක් දුන්නා ඒ වෙනුවෙන් එම ස්ථානයේ ප්‍රදර්ශනාත්මක දැන්වීම් පුවරුවක් ස්ථාපිත කරනවා කියලා.අද වනතුරු එහෙම දැන්වීමක් එතන නිරූපණය කරලා නැහැ. එනිසා කඩිනමින් එහෙම දෙයක් කරන්න පුළුවන් නම් එය බොහෝ වටිනවා සහ ප්‍රදේශවාසීන් දැනුවත් වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මගේ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම අදහස් දැක්වූවා.මේ යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධ ව ස්තුතිවන්ත වෙනවා.එමෙන්ම උපකාර්යාල දෙකේ කොම්පෝස්ට් අංගන දෙකක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ප්‍රජා සංවර්ධන මහත්තයා ඉන්නවා. එයාට කියමු සතියක් ඇතුලත මේක කරන්න කියලා.සුසාන භූමියේ ප්‍රශ්නය සම්බන්ධව මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම විවිධ අදහස් ප්‍රකාශ කරනු ලැබුවා.ඒ පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින් මම සුසාන භූමිවල දැනට ඉතිරිව තියෙන භූමි ප්‍රමාණය ස්ථිර වැටක් යොදලා ඒක රැක ගන්නා මෙනුත් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

සුසානභූමි යෝජනාව සම්බන්ධයෙන් මට පොඩි අදහසක් තියෙනවා.එතුමා නම් කරන සුසාන භූමියත් අපට අයිති එකක් නෙමෙයි.ඒකේ අයිතිය තියෙන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට.මතුගම ප්‍රදේශය පුරාම ගත්තම ගොඩක් සුසානභූමිවල අයිතිය අපට නැහැ.මම යෝජනාවක් දැම්මා මේ සමස්ත ප්‍රදේශයේ ම අපට අයිති සුසානභූමි අපට ම පවරා ගැනීමට.මේවා හොයලා බලලා අපට අයිති සොහොන් භූමිවල දැනට පවතින ප්‍රමාණයවත් නිරවුල් කිරීම සඳහා වැඩපිළිවෙළක් සකසන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අපට නීත්‍යානුකූලව අයිති සුසාන භූමි 29යි තියෙන්නේ. අයිති නො වන පවරා ගැනීම් සඳහා ප්‍රාදේශීය ලේකම්ට සහ ඉඩම් අමාත්‍යාංශයට විසිතුනක් යවලා තියෙනවා.ඔක්කොම පනස් දෙකයි. මේකෙන් වැල්කන්දලත් අපට තාම අයිති නැහැ.මම කියන්නේ මේකේ ගොනුව අරගෙන අපි යවලා නැද්ද බලන්න.මේ ඉඩම් ටික අපේ නෙමෙයි කියලා ප්‍රකාශ කරලා ප්‍රසිද්ධ කළොත් අපට එන උවදුර වැඩියි.මේ රජයේ සුසාන භූමි අපට බාර නොදුන් ඒවා තියෙනවා.රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණය අඩුයි.

**6.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-**

<u>යෝජනාව</u>

6.6.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් වැඩ පරීක්ෂකවරුන්ගේ වැඩ කටයුතු විධිමත් කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් වැඩ පරීක්ෂකවරුන්ගේ වැඩ කටයුතු විධිමත් කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>යෝජනාව</u>

6.6.2 ඒ ඒ අංශවල වගකීම ඔවුන්ට භාර දිය යුතු අතර එය ඉටු නොවන්නේ නම් ඒ සඳහා සුදුසු දක්ෂ කළ හැකි අය පත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ඒ ඒ අංශවල වගකීම ඔවුන්ට භාර දිය යුතු අතර එය ඉටු නොවන්නේ නම් ඒ සඳහා සුදුසු දක්ෂ කළ හැකි අය පත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් ගරු

සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

ඇත්තෙන්ම මම මේ යෝජනාව ඉදිරිපත් කළේ පසුගිය සභා වාරෙදි ඉදිරිපත් කළ යෝජනාවේදී ඔබතුමා පොරොන්දු වුණා ඒ දැන්වීම මැදිහත්වෙලා ගහන්නම් කියලා.ඔබතුමාට මෙතන සේවකයෝ දෙසීයකට වැඩියෙන් ඉන්නවා.වැඩ පරීක්ෂකවරු කියන්නේ මේ සියලු සිදු කෙරෙන වැඩ අධීක්ෂණය කරන විධායක නිලධාරීන්ට යි.මම දකින්නේ නැහැ ඒ අයගෙන් යුතුකම් සහ වගකීම් ඉටු වෙනවා කියලා.කොම්පෝස්ට් අංගනයේ බැලුවත්,විදුලි අංශයේ බැලුවත්, මාර්ග අංශයේ හෝ පොළට ගිහින් බැලුවත් ඒ අදාළ නිලධාරීන්ගෙන් කාර්යය ඉෂ්ට වෙන්නේ නෑ.ඒක පැහැදිලිවම දකින්න තියෙනවා.මේ හැම කාර්යයක්ම සභාපතිතුමාට සිදු කළ නොහැකි නිසා යි කාර්ය මණ්ඩලයක් සහ විධායක කමිටුවක් තියෙන්නේ.මම දන්න තරමින් තාක්ෂණ නිළධාරීන් මෙම කටයුතු අධීක්ෂණය කරන්න ඕනා.නමුත් මොන ම වැඩකවත් නිසි ක්‍රමවේදයක් නැහැ.සභාවේ තියෙන අඩුපාඩු එදිනෙදා වැඩ කරන අය තමයි දැන ගෙන ඉන්න ඕනා.රක්ෂණය සම්බන්ධයෙන් අළුත් ක්‍රමය ක්‍රියාත්මක වුණොත් ලක්ෂ දෙකක් පමණ අඩු වෙනවා.ඒ අළුත් ක්‍රමය ක්‍රියාත්මක වෙනවා ද?නැත් නම් පරණ ක්‍රමය ම ද ක්‍රියාත්මක වනුයේ කියලා සභාව අවසන් වීමට පෙර දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් අද ගන්නවා රක්ෂණ එකයි ජේ.සී.බී. යන්ත්‍රයේ අලුත්වැඩියාවක් ඇවිත් තියෙනවා. ඒකත් සාකච්ඡාවට ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

6.6.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතාගේ යෝජනාව වාර්තාවට දාලා කතා කරන්න තරම් සුදුසු යෝජනාවක් නෙමෙයි කියලා මම හිතනවා.මොකද මේක පරිපාලනයේ දුර්වලතාවයක්.අපි මේ සභා වාර්තාවල ගත්තාම දිගින් දිගටම පරීක්ෂා කරලා බලද්දි අපටම බලාගන්න පුළුවන් දුර්වල පාලනය නිසා සිදු වූ දේවල්.අද වන විටත් කොම්පෝස්ට් ප්‍රශ්නය,දැන්වීම් පුවරු ප්‍රශ්නය තාම කතා කරනවා.හැමදාම මේ ප්‍රශ්න එකින් එක ඇදිලා එනවා.මේ එක ප්‍රශ්නයක්වත් විසඳගන්න තවමත් උත්සාහ කරලා නැහැ.තමන්ට අදාළ රාජකාරිය තම තමන් කරනවා නම් මේ ප්‍රශ්නය ඉවරයි.මේක ඇත්තටම ලැජ්ජාවට කරුණක්.මේ අවසාන කාලෙදි හරි මාසයක් සඳහා හෝ එක කමිටුවක් පත් කරලා මේක විධිමත් කරන්න වැඩපිළිවෙළක් හදන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය**

මේ යෝජනා සම්බන්ධයෙන් කතා කරනවා නම් අපට අදාළ වනුයේ වැලිපැන්න උප කාර්යාලය යි.එතැනදී මාර්ග නඩත්තු අංශයෙන් වැඩ පරීක්ෂකතුමා ග්‍රාම සේවා වසම් විසිදෙකක් ආවරණය කරනවා.අනිත් ආයතනවලින් විසි හතක් ආවරණය කරනවා.එතනදි මාර්ග නඩත්තු අංශයේ ඉන්න පළපුරුදු සේවකයන්ගේත් යම්කිසි අවංක භාවයක් තියෙනවා.එනිසා අලුත් සේවකයෝ ඉන්නවා නම් ඔවුන් සමග අනුබද්ධ කරලා සභාවේ උන්නතිය උදෙසා එම ක්‍රමවේදය සකස් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

ඇත්තටම හොඳ යෝජනාවක්.වැඩ පරීක්ෂකවරුන් පමණක් නෙමෙයි,හැම ක්ෂේත්‍රයක් හා සම්බන්ධව ම පූර්ව නිගමනයක් කිරීමට ලේකම්තුමියට පුළුවන් නම් ඒක පරිපාලනය අතින් ලේකම් කෙනෙකුට තියෙන වගකීමක්.මොකද මේ සභාවේ කුමන ක්ෂේත්‍රයක් ගත්තත් නිලධාරී කෙනෙකුගේ අක්‍රමිකතාවයක් තියෙනවා.බොහෝවිට මීට හේතුවක් වන්නේ මේ පරිපාලනයේ ඉහළින් සිටිනුයේ කාන්තාවක් වීමයි.සමහර වෙලාවට සේවකයෝ ඒ කාන්තා නිලධාරීන් කියන එක අහන්නේ නැහැ.ඒ

නිසා ලබන සහාවාරය වෙනකොටවත් අපට මේ නිලධාරීන්ගේ ප්‍රශ්න නෙමේ,ගමේ ප්‍රශ්න කතා කරන්න අවස්ථාවක් හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
මොන දේ කතා කළත් ප්‍රධාන චෝදනාව සභාපතිතුමාට සහ ලේකම්තුමියට මන්ත්‍රීවරුන්ගෙන් එල්ල වෙනවා.කාලයක් තිස්සේ මේ සභාවේ පැවැතුණ ක්‍රමවේදය තමයි අද මේ සභාව පරිහානියට පත්වීමට හේතුව වෙලා තියෙන්නේ.ඇත්තටම මන්ත්‍රීතුමාලා අදහස් දැක්වූවා වගේ මොකක් හරි හොඳ වෙනසක් කරන්න සභාපතිතුමා. මෙ පමණ කලක් ආපු ඒකාකාරී ගමනේ විනාශය තමයි මේ අද තියෙන්නේ.

**6.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යථා පරිදි කල් දී ඇති යෝජනා :**

<u>යෝජනාව</u>

6.7.1 රජයේ සංචාරක ප්‍රවර්ධන වැඩ සටහනට යටත්ව ගොඩනැඟීමට කටයුතු කරන සංචාරක කළාපය අළුත්ගම බෙන්තර ආශ්‍රිතව යෙදෙන බැවින් එම සංචාරක කළාපයට මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද ඇතුළත් කර ගැනීමට සංචාරක අමාත්‍යංශය වෙත ඉල්ලීමක් කිරීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

රජයේ සංචාරක ප්‍රවර්ධන වැඩ සටහනට යටත්ව ගොඩනැඟීමට කටයුතු කරන සංචාරක කළාපය අළුත්ගම බෙන්තර ආශ්‍රිතව යෙදෙන බැවින් එම සංචාරක කළාපයට මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද ඇතුළත් කර ගැනීමට සංචාරක අමාත්‍යංශය වෙත ඉල්ලීමක් කිරීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

<u>යෝජනාව</u>

6.7.2 සියලු සුභ සාධන කටයුතු තාවකාලික ව දින කිහිපයකට නවත්වා එම ඉතුරු වන මුදලින් හෝ සභාව සතු සියලු යන්ත්‍රෝපකරන,අවි ආයුධ,වාහනවල ඇති නඩත්තු කටයුතුවලට ප්‍රමුඛතාව දී ඒ සියල්ල බාධාවකින් තොර ව භාවිත කළ හැකි අයුරින් සාදා ගැනීමට කටයුතු කිරීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.(චේන්ෂෝ,තණකොළ කපන මැෂින්,විදුලි බුබුළු,වයර්,කැඩී ඇති වාහන,ටෙන්ට්,පුටු ආදී සියලු දේ............)

<u>තීරණය</u>

සියලු සුභ සාධන කටයුතු තාවකාලික ව දින කිහිපයකට නවත්වා එම ඉතුරු වන මුදලින් හෝ සභාව සතු සියලු යන්ත්‍රෝපකරන,අවි ආයුධ,වාහනවල ඇති නඩත්තු කටයුතුවලට ප්‍රමුඛතාව දී ඒ සියල්ල බාධාවකින් තොර ව භාවිත කළ හැකි අයුරින් සාදා ගැනීමට කටයුතු කිරීම සුදුසු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

යෝජනාව

6.7.3 කොම්පෝස්ට් අංගනයේ දූෂණ වංචා හෙළි කිරීමෙන් අනතුරුව ද ඒ උදෙසා කටයුතු කිරීමට හෝ පියවරක් ගැනීමට නොහැකි නම් එම අංගනය පෞද්ගලික ආයෝජකයන් සමඟ සාකච්ඡා කොට පෞද්ගලීකරණය කර සභාව ලාභ ඉපයීම සුදුසු යැයි ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් යෝජනා කරන ලදී.(නාගරික කසළ පමණක් නොව කඩදාසි,කාඩ්බෝඩ්,වීදුරු හා යකඩ ද ප්‍රතිචක්‍රීකරණ කටයුතු ද ඇතුළත් ව සිදු කළහොත් සභාවට අධික ලාභයක් ලැබිය හැක.)

තීරණය

කොම්පෝස්ට් අංගනයේ දූෂණ වංචා හෙළි කිරීමෙන් අනතුරුව ද ඒ උදෙසා කටයුතු කිරීමට හෝ පියවරක් ගැනීමට නොහැකි නම් එම අංගනය පෞද්ගලික ආයෝජකයන් සමඟ සාකච්ඡා කොට පෞද්ගලීකරණය කර සභාව ලාභ ඉපයීම සුදුසු යැයි ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා විසින් ස්ථිර කරන ලදී.මෙම යෝජනාව ඡන්ද විමසීමක් මඟින් පරාජය කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

මේ සංචාරක කලාපය දැන් පානදුර සිට බෙන්තර දක්වා ම දිවෙන්න යෝජනා කරලා තියෙනවා.මතුගමත් ඒ කලාපයට ඇතුළත් කර ගන්නා මෙන් සංචාරක අමාත්‍යාංශයට යෝජනාවක් කරන්න කියලයි,මම ඉල්ලා සිටින්නේ.මොකද මතුගම පස්දුන් කෝරළේ අගනගරය. බොහොම ලස්සන ප්‍රදේශයක්.ස්වාභාවික දිය ඇලි ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව සුන්දර වටපිටාවක් තියෙන ප්‍රදේශයක්.ඉතින් සංචාරක කලාපයට උපයෝගී කරගැනීමට පුළුවන් බොහෝ දේත් මේ මතුගම පුරවරයේ තියෙනවා.සභාවක් විදිහට අපි මේ යෝජනාව සභාව තුළ ස්ථිර කරලා අපේ මතුගම අනාගතයට හොඳ වැඩපිළිවෙළක් විදිහට මේක ක්‍රියාත්මක කරන්න ඕනා.ගම් ඇතුලට ගියා ම තියෙන ග්‍රාමීය වට පිටාව රස විඳින්න විදේශීය සංචාරකයන් කැමතියි.ඒ වෙනුවෙන් මෙම යෝජනාව සභා සම්මත කරලා සංචාරක අමාත්‍යාංශයට අපේ ඉල්ලීම සභාවක් වශයෙන් ඉදිරිපත් කරමු කියලා මම ඉල්ලා සිටිනවා.

6.7.2 කලිනුත් කතා කළ ප්‍රශ්න එක්ක බැලුවාම සභාවේ තියෙන තණකොළ කපන මැෂින් චේන්ෂෝ ආදියේ විශාල අඩුපාඩු තියෙනවා.දැන් අද ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා ප්‍රශ්න ඉදිරිපත් කරලා ඇහුවේ ඒ නඩත්තු කටයුතු සම්බන්ධවයි.දැන් මෙතන ඉන්න මන්ත්‍රීවරු කතා කරලා තණකොළ කපන මැෂින් එකක් ගන්න ඇහුවොත් ඒ මැෂින් හැමදාම කැඩිලා.එතකොට මේකේ වෙන සංවර්ධනයක් නැනේ.සුබසාධනයක් නැනේ.ඒ නිසා මම යෝජනා කරනවා සතියකට හෝ මේ ටෙන්ට්, පුටු දෙන සියල්ල නවත්වන්න.එහෙම නවත්වලා කැඩිලා බිඳිලා ගියපු සේරම අලුතෙන් හදන්න.එතකොට අපිට මේක හරියට විධිමත් ව කරගන්න පුළුවන්.විදුලි අංශයේත් ඒ වගේයි.බල්බ් අඩු වෙනකම් ඉන්නේ නැතුව බල්බ් ටික ගෙනත් තියාගන්න.

තුන්වන යෝජනාව හැටියට පසුගිය කාලයේදී අපේ මන්ත්‍රීතුමන්ලා කොම්පෝස්ට් අංගනයේ දූෂණ වංචාවන් බොහොම කැපකිරීමෙන් හෙළිකළා.දැන් අදටත් ඔබතුමන්ලා ඇහුවොත් මේකේ ගත්ත පියවර මොකක්ද කියලා මාසික ලැයිස්තුවක් ගෙනත් පෙන්වන එක විතරයි කරන්නේ.අර දවස් දෙකට හලන්න පුලුවන් කොම්පෝස්ට් ටිකක් හලලා මාසෙටම ඇහුවාම ඒක පෙන්නනවා.ඉතින් මේක බොරුවට නඩත්තු කරන්න ඕන නැහැ.මම යෝජනාවක් කරනවා වර්තමාන ජනාධිපතිතුමාගේ ක්‍රමවේදය අනුව දූෂිත පාඩු ලබන ආයතන සියල්ල පෞද්ගලීකරණය කරන්න.මේ තේරුමක් නැති වියදමක් දරන්නේ.එහෙම කරන්න නීතිමය තත්ත්වයක් නැත්නම් හොඳ ආයෝජකයෙක්ට මේක යොමු කරන්න.කිලෝ ගානට කුණු වලට ගෙවන ආයතන රටේ තියෙනවා.අනිත් එක මෙතන නාගරික කසළවලින් කොම්පෝස්ට් විතරයි නිපදවෙන්නේ.එතකොට මෙතනින් තව ඉදිරියට ගියොත් අපට පුළුවන් වීදුරු,කඩදාසි,කාඩ්බෝඩ් ප්‍රතිචක්‍රීකරණය,ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන්න.සභාව

සතු දෙයක් නිසා එහෙම කරන්න නීතිමය තත්වයක් නැති නම් ආයෝජකයෙක් සමඟ එකතු වෙලා මේ කටයුතු කරගෙන යන්න.වෙනස් විදිහට හිතලා කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා ඉදිරිපත් කළ 6.7.1 සංචාරක කලාපයක් බිහි කිරීම සම්බන්ධයෙන් වන යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක්.සංචාරක කර්මාන්තය කියන්නේ අපේ රටට විදේශ විනිමය ගලා ගෙන එන ප්‍රධාන ආදායම් මාර්ගයක්.මෙහිදී අපිට බෙන්තර-වාද්දූව වන තෙක් කලාපයේ නැති වෙලා තියෙන එකම දෙයක් තමයි මෙහෙට ආවට පස්සේ රාත්‍රී හතෙන් පසු සංචාරකයින්ට කරන්න දෙයක් නොමැති වීම.මමත් සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන්නෙක් වශයෙන් මේ කියන්නේ.මොකද ලංකාවේ හොඳම මුහුදු තීරයක් තියෙන කලාපයක් තමයි බෙන්තර කියන්නේ.මෙවැනි බොහෝ සංචාරක සම්පත් තියෙන බෙන්තරට අද සංචාරක මණ්ඩලයෙන් හිමිවිය යුතු යුතුකම් වෙන්නේ නැහැ. අද වෙනකොට සංචාරක අමාත්‍යංශයේ අවධානයට ලක් නොවුණු තැනක් තමයි බෙන්තර කියන්නේ.ඒක නිසා ඔබතුමාලාගේ මැදිහත් වීමෙන් ඒ අවශ්‍යතාවන් හොයලා බලලා ඊට ප්‍රමුඛස්ථානය දීලා කටයුතු කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

6.7.2 සංවර්ධන කටයුතු නවත්වලා තියෙන යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කරන්න කියන යෝජනාව.ඇත්තටම මේ සභාවේ දෙයක් වෙන්න ඕන නිසයි අපි මන්ත්‍රීවරු වශයෙන් දවල් ආහාරය එපා කියලා ඒ මුදල් පවා ඉතිරි කළේ.මම සභාවට ආපු දවසේ ඉඳලා මගේ දුරකථන ගාස්තුව ගන්නේ නැහැ.මේ මෑතකදී කතා කරපු වෙලාවේ මගේ ගමන් ගාස්තුව එපා කියලා කිව්වේ මේ සභාවට තියෙන ආර්ථික ප්‍රශ්න නිසා.මේ දේවල්වලට මුදල් නැතිකම නෙමෙයි හරියට කළමනාකරණය කර නොගැනීමයි තියෙන්නේ.මේ යන්ත්‍රසූත්‍ර හැමදාම කැඩිලා.ටෙන්ට්,පුටු දීගන්න බැරි තත්ත්වයේ තියෙන්නේ.මේ සියලු දේවල් දෙන්න බැරිනම් නවත්වලා දාන්න ඕනා.මේ සභාවේ ප්‍රමුඛස්ථානය දීලා වැඩ කරන්න ඕන තැන් තියෙනවා.ඒ නිසා ඒකත් සොයලා බලලා කටයුතු කරන්න.

6.7.3 යෝජනාවේදී මම නම් කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කරන එකට විරුද්ධයි.මේ එකම ප්‍රශ්නය තමයි දිගටම යන්නේ.සභාව ආරම්භයේ පටන් කතා කරපු දේවල් අදටත් අපි කතා කරනවා.මේ කොම්පෝස්ට් අංගනයෙන් අපට හොඳ ආදායමක් උත්පාදනය කරන්න පුළුවන්.හොඳ සම්පත් ටිකක් තියෙනවා.අපි මේ සම්පත් ප්‍රයෝජනයට නොගන්නා එකයි ප්‍රශ්නය වෙලා තියෙන්නේ.මේක හරියට කළමනාකරණය කරගන්න ඕනා.පෞද්ගලීකරණයට වඩා මේ දේවල් ක්‍රමවත් කරගන්නවා නම් අපට හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

6.7.1 සංචාරක කලාපයක් කිරීමේ යෝජනාවටත් 6.7.2 යෝජනාවටත් මම එකඟ වෙනවා.නමුත් 6.7.3 කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කරන යෝජනාවට විරෝධය ප්‍රකාශ කරනවා.අපේ තීරණය විය යුත්තේ සභාව සතු දේවල් පෞද්ගලීකරණය කිරීම නෙමෙයි.මේකට අවශ්‍ය වැඩපිළිවෙළ සහ නායකත්වය ලබා දීමෙන් මෙම අංගනය සංවර්ධනය කිරීමයි.

පළමු යෝජනාව හැටියට සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් "ගෝල්ඩන් ආර්ක්" විරුදාවලිය ලබලා තියෙන්නේ “මොරගල්ල” ප්‍රදේශය .ඒ වගේම බෙන්තර ප්‍රදේශය සංචාරක පුරවරයක් විදිහට ලෝක ප්‍රසිද්ධ ම නගර වශයෙන් හඳුනාගෙන තියෙනවා.ඒ මායිම්වල ඉන්න ප්‍රදේශවාසීන් හැටියට අපට මේ යෝජනාව සම්බන්ධයෙන් යම් වැඩපිළිවෙළක් සභාව මගින් ක්‍රියාත්මක කරනවා නම් එහි වටිනාකම අපේ ප්‍රදේශවල ජනතාවටත් භුක්ති විඳින්න පුළුවන්.ඇත්තටම මේ සංචාරකයින් අපේ පෞරාණික වස්තු,ස්වභාව සෞන්දර්ය නරඹලා යන එක පමණක් හැර ඔවුන්ට කිරීමට ක්‍රියාකාරකම් අපි හදලා නැහැ.අපේ ගම්වල තියෙන ස්වාභාව සෞන්දර්යයෙන් අනූන ස්ථාන හඳුනා ගෙන සභාව මඟින් වැඩපිළිවෙලක් හදලා තවත් සංචාරකයින් ගෙන්වා ගැනීමට කටයුතු කළ හැකියි.

6.7.2 සුබසාධන කටයුතු සම්බන්ධයෙන් කතා කිරීමේදී අපි මේ සභාවට පැමිණෙන විට යම්කිසි සුබසාධන කටයුත්තක් මෙහි තිබුණා.නමුත් අද ඒ සියලු දේවල් අකර්මණ්‍ය වී අවසන්.ඇත්තටම මේ ඉවත් කරලා තියෙන ටෙන්ට් ආදී දේ පවා තවත් කාලයක් භාවිතයට ගත හැකි අයුරින් සකසා ගත හැකියි.මෙවැනි වැඩ පිළිවෙලකට යා යුතුයි.අපි දැක්කා ටෙන්ඩර් දාන්න ලැයිස්තුවක් දීලා තියෙනවා.ඒකේ කැති පිහි පවා තිබුණා.අපි අපේ ගම්වල මේවා වෙන්දේසි කරලා විකුණලා දාන්නේ නැහැ.මේකෙන් උපරිම ප්‍රයෝජනයක් ගන්න ඕනා.අපි දැන් මේ ඉන්නේ පරිවාස කාලයක.මෙතෙක් අපි යෝජනා කරපු ව්‍යාපෘතිවලින් ක්‍රියාත්මක වුණේ ඉතාමත් අඩු ප්‍රමාණයක්.සභාපතිතුමාත් සංවර්ධන ව්‍යාපෘති සියල්ලක්ම කළේ “ලෙච්චන්දුව” පමණක් සීමා කරගෙන.මේ අනිත් මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වයක් ලැබුණේ ම නැති තරම්.මම නම් ඉදිරියට මේ සභාව මගින් සිදුකරන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා දැඩි ලෙස විරුද්ධ වෙනවා.මම හිතනවා අනිත් මන්ත්‍රීවරුත් ඒ විදිහට විරුද්ධ වෙයි කියලා.අපේ කාලය අවසන් නිසා මේ මුදල් ගෙවීම් කරන්නත් අපට බැරි වෙයි.සමහරවිට අපි මේ පරණ ව්‍යාපෘති සඳහායි මුදල් ගෙවන්න උත්සාහ කරන්නේ.මේ ප්‍රයෝජනයක් නැති යෝජනා කරලා මුදල් නාස්තියකට යනවාට වඩා මේ සභාවෙන් ජනතාවට කර ගන්නට බැරි වුණු සුභසාධන කටයුත්තක් වෙනුවෙන් මුදල් වැය කරන්න පුළුවන් නම් ඒ සඳහා ප්‍රමුඛස්ථානය දෙන්න කියන ඉල්ලීම කරනවා.

6.7.3.මෙහි දී අපි ගිය සභාවේ දී මේකට බෙදීමක් ඉල්ලුවා. එහිදීත් සතියක් ඇතුළත අමාත්‍යාංශයට මේ තොරතුරු යවලා පරීක්ෂණ කරලා වැරදිකරුවන්ට දඬුවම් දෙන බවට සභාපතිතුමා ප්‍රකාශ කළා.නමුත් අදටත් මේ සම්බන්ධව කිසිවක් සිදු වෙලා නැහැ.ඒ නිසා මේ පුබුදු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම විරෝධය ප්‍රකාශ කරනවා.අපි ඇත්තට ම ජනතා නියෝජිතයෝ ලෙස පෞද්ගලීකරණයට විරුද්ධයි.මොකද කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් අපට තියෙනවා.නමුත් මේක ක්‍රියාත්මක කරන්න අද වෙනතුරු කමිටුවක් කැඳවලා නැහැ.එ නිසා මේ පෞද්ගලීකරණය සම්බන්ධයෙන් විරෝධය ප්‍රකාශ කරනවා.අනිත් යෝජනා දෙක සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතාගේ සංචාරක යෝජනාව සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.ඉතා හොඳ යෝජනාවක්.මොකද රමණීය ස්වාභාවික ස්ථාන ගණනාවක් තියෙන ප්‍රදේශයක් මේ මතුගම නගරය.මේ මුළු රටම වීසා ක්‍රමවේදය වෙනස් කරලා සංචාරකයින්ට විවෘත කරන්න පුළුවන් නම් සංචාරක ව්‍යාපාරයෙන් මේ රට ගොඩනගන්න වැඩි ඉඩකඩක් ඇති බව මුළු ලොවම කියනවා.අපිට මේ යෝජනාව සභා සම්මත කරලා සංචාරක අමාත්‍යාංශයට යවන්න පුළුවන් නම් එය ඉතා වටිනවා.මම අවුරුදු හතරකට පෙර යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවා, වැලිපැන්න අධිවේගී පිවිසුම අසල බෙන්තර ගඟේ ප්‍රවිශ්ටය තියෙනවා.ඒ එන සංචාරකයා ව බෝට්ටු මාර්ගයෙන් බෙන්තොටට ගෙන යන්නට අවශ්‍ය ව්‍යාපෘතියක් සඳහායි ඒ යෝජනාව කළේ.ඒ සඳහා සභාපතිතුමා මැදිහත්වීමක් කළත් ඒක යථාර්ථයක් කර කරගැනීමට අපට බැරි වුණා.සාමාන්‍යයෙන් ලංකාවට පැමිණෙන විදේශිකයින්ගෙන් වැඩි දෙනෙක් බෙන්තර එක් දිනක් හෝ සංචාරය කරනවා.මමත් සංචාරක සේවයට අනුයුක්තව කලක් රැකියාව කළ නිසා මම දන්නවා, බෙන්තර දී විදේශිකයන්ට දැකගැනීමට හැකි වෙන්නේ ඉර බසින දර්ශනය සහ මුහුදු තීරය භුක්තිවිඳීම පමණයි.මීට අමතරව අපේ ප්‍රදේශයට යාබද පාහියන්ගල වැනි ස්ථාන දියුණු කර සංචාරකයින්ට විවෘත කරන්නට පුළුවන්.මෝල්කාව ගහත් සංචාරක ක්‍රියාකාරකම් සඳහා සෘජුවම යොදා යොදා ගැනීමට පුළුවන්.මේ කියපු කාරණා මම මීට පෙර සභාවන්වල දී ලිඛිතව ඉදිරිපත් කර තියෙනවා.ඔබතුමා මගේ අදහසත් ඒ අවශ්‍ය ස්ථානවලට ගෙනිහින් ඉදිරිපත් කරන්න.බේරුවල ප්‍රාදේශීය සභාව බෙන්තර සංචාරක කලාපයක් කිරීම මත ඉහළම ලාභ ලබන ප්‍රාදේශීය සභාවක් වෙලා තියෙනවා.අපටත් මෙම යෝජනාවන් ක්‍රියාත්මක කරලා ඒ තැනට යැමට හැකියි.මේ යෝජනාව හැකි කඩිනමින් ඉටුකිරීමට සාධාරණයක් කරන මෙන් නැවත වතාවක් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

රජයේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන හා සම්බන්ධ ඉල්ලීම ඉතාමත් හොඳ යෝජනාවක්.විශේෂයෙන්ම අපේ රටේ ඉතාමත් හොඳ දියුණු කරන්න පුළුවන් සම්පත් තියෙන සංචාරක ආකර්ෂණය දිනා ගන්න පුළුවන් ස්ථාන තියෙන රටක් හැටියට අපි ඒ සම්පත්වලින් ප්‍රයෝජනයක් අරගෙන නැහැ .ඒ නිසාම තමයි අපේ රටට ලැබිය යුතු විදේශ විනිමය අපට අහිමි වෙලා තියෙන්නේ.එක් පැත්තකින් තවමත් මේ රටට සංචාරකයින් ගෙන්වන්නේ අතීත මුතුන් මිත්තන් සැකසූ පෞරාණික දේවල් නැරඹීමට යි,රට මැද තියෙන කඳු ටික බලන්නයි,රට වටේ තියන මුහුදු තීරය බලන්නයි පමණයි.මේ තියෙන සම්පත් ටිකම භාවිත කළොත් මේ රට දැවැන්ත සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කළ හැකියි.අපේ රටේ තියෙන සුලභ,හිරු එළිය,පරිසරය,ස්වභාවික නිල්වන් ශාක පද්ධතිය යනාදී දේ පෙන්වා පමණක් සංචාරකයින් ආකර්ෂණය කළ හැකි රටක් මේක.ඒකට නිසි අයුරින් කටයුතු කරන්න කිසිවෙක් නිසි අයුරින් පාලනයක් කර නැහැ.ඉදිරියේදීවත් සංචාරක ආකර්ෂණය දිනා ගන්න වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනවා නම් එය කාලෝචිතයි.එනිසා මේ පළමු යෝජනාවට අපි එකඟයි.සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ජනතා විමුක්ති පෙරමුණේ අපේ රජයක් පිහිටවූවත් මේක පළමුවෙන්ම කරන කාරණයක්.

එතුමාගේ දෙවැනි යෝජනාව අපි නිතරම කතා කරන දෙයක්.එතුමා යෝජනා කර තිබෙනවා සුබසාධන වැඩ කටයුතු නවත්වලා හරි කෑති, මන්න,පිහි ඇතුළු සියලු දේ සකසා ගන්න උවමනායි කියලා.හැමදාමත් ඔබතුමා ඉදිරිපත් කරන ගෙවීම් වාර්තාවේ තියෙනවා නඩත්තු කටයුතු සඳහා වැය වන මුදල් ප්‍රමාණය පිළිබඳව.ඒ නිසා ඒක අමුතුවෙන් කතා කළ යුතු යෝජනාවක් නෙමෙයි.ඒ සම්බන්ධව අපේ එකඟතාවයක් මිස විරුද්ධත්වයක් නැහැ.

එතුමාගේ තෙවැනි යෝජනාව කොම්පෝස්ට් අංගනය ලාභ උපයන්න බැරි ස්ථානයක් නිසා පෞද්ගලීකරණය කිරීම සම්බන්ධව යි.මට එතුමා කතා කරද්දි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කතා කරන්න හිතුනා.හැම එකම පෞද්ගලීකරණය කරන්න පුළුවන් නම් සභා තියෙන්න ඕන නෑ.එකක් මේ යෝජනාව සභාවේ කරන්න පුළුවන් දෙයක් නෙමෙයි.මම හිතන්නේ නැහැ ප්‍රාදේශීය සභාවට පුළුවන් කියලා සම්පත් පෞද්ගලීකරණය කරන්න.ඒකට වෙනම නීතිමය තත්ත්වයක් තියෙනවා.අනිත් පැත්තෙන් අපට තියෙන සම්පත් පාඩු ලබනවා නම් මේක ද කළ යුතු විසඳුම වන්නේ.පුද්ගලික මනුස්සයෙකුට මේක ලාභ ලබන තැනට පත් කරන්න පුළුවන් නම් ඇයි ඒක මේ සභාවට කරන්න බැරි?අපි පසුගිය කාලයේ දී කොම්පෝස්ට් අංගනයේ දූෂණ අක්‍රමිකතා සම්බන්ධ ව කතා කළා.මේ ආයතන පාඩු ලබලා තියෙන්නේ ඔය දූෂණ අක්‍රමිකතා නිසා තමයි.එනිසා ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි යෝජනා කරන්නේ මේ වගේ තියෙන දූෂණ අක්‍රමිකතා හොයන්න.කවුද මේවට නිලධාරීන් පත් කළේ?කවුද ඒ නිලධාරීන් ව නියාමනය කලේ?කවුද ඒ නිලධාරීන් සමග එකතුවෙලා කොමිස් ගැහුවේ?කවුද නිලධාරීන්ට හොරකම් කරන්න අවශ්‍ය පරිසරය හදලා දුන්නේ? මේක මේ ක්‍රමය ඇතුලේ නිසි නියාමනයක් නොමැතිකම නිසා සිදුවූ දෙයක්.ඒ නිසා පෞද්ගලීකරණය කරන එක නෙමෙයි මේ ආයතනවල දූෂණ වංචා අක්‍රමිකතා හොයලා ඒවා නතර කරන්න වැඩපිළිවෙළ හදන්න.මේ රටේ සම්පත් වශයෙන් මේවා ලාභ ලබන තැනකට පත් කරන්න පුළුවන්.විසඳුම හරියට තේරුම් අරන් කතා කරමු .එ නිසා මේ ආයතන පාඩුයි කියල එකපාරටම පෞද්ගලීකරණය කරන යෝජනා ගේන්න එපා. ඔබතුමාගේ අනිත් යෝජනා දෙකට සහයෝගය දෙමින් මේ යෝජනාව සංශෝධනය කරගන්න ඕන බව කියනවා.අපි කවුරුත් එකතුවෙලා කොම්පෝස්ට් අංගනය හදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

ඔබතුමන්ලා අදහස් ඉදිරිපත් කළා.අපි අද වන විට අපේ අතීත මුතුන් මිත්තෝ හදපු දේවල් පෙන්නලා තමයි ජීවත් වෙන්නේ.ඉතින් මතුගම ප්‍රදේශයත් සංචාරක කලාපයට ඇතුළත් කිරීමට මෙතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව ලොකු වැඩසටහනක් දැන් අනුප පැස්කුවල් ඇමතිතුමා දියත් කරලා

තියෙනවා.ඉතින් ඒ නිසා සංචාරක කටයුතු සම්බන්ධව ආදී කාලයේ සිට ම අපි කරපු දේවල් නිසා තමයි අද අපට ඩොලර් ටික ලැබෙන්නේ. ඒ නිසා ඔබතුමා ගෙනා පළමු යෝජනාව පිළිබඳව ඉතාම සතුටුයි.

දෙවන යෝජනාව වශයෙන් අපි සභාවේ සියලු වැඩකටයුතු නවත්වලා මේ ටික අළුත්වැඩියා කරලා පාවිච්චියට ගන්න එක හොඳ අදහසක්.හැමදාම මේ ටික කැඩිලා කියලා අහනවාට වඩා මේවට කල් දීලා මේ ටික සේරම හදලා,දිනපතා කැඩෙන බඩු වෙන් කරලා,නිලධාරීන් දැනුවත් කරලා,කැඩෙන බඩු කොපමණ ද කියලා සභාවට ඉදිරිපත් කරලා,හදන්න බැරි ඒවාට අලුත් ටිකක් අරන් මේක කරමු. නැත්නම් අපි හැමදාම දෝෂාරෝපණය අහනවා.නමුත් අපි මේවා හරියට කළමනාකරණය කරගෙන ගියා නම් මේ සියල්ල කරන්න පුළුවන්.

ඒ වගේම ඔබතුමාගේ කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කරන තෙවැනි යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වද්දී මේක පෞද්ගලීකරණය කරන්න පුළුවන්.අපි ඊට පස්සේ මේ අංගනය පෞද්ගලීකරණය කලොත් එහි වැඩ කරන සේවකයන් සහ නිලධාරීන් ව කොහේටද අනුයුක්ත කරන්නේ?ඊට පස්සේ තමයි ඇත්ත ම ගැටලුව පැන නගින්නේ. අපි කරන්න ඕනා ඒක නෙමෙයි.පුළුවන් තරම් මේක ක්‍රමවත් කරලා පවත්වාගෙන යන එකයි.මගේ කොට්ඨාසයේ තියෙන නිසා මමත් මේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව උනන්දු වෙලා කටයුතු කළා.අපි මේක ක්‍රමවත් කරලා ඉදිරියට පවත්වා ගෙන යමු. පෞද්ගලීකරණය කරන්න එපා කියන එකයි මගේ අදහස වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා**

සංචාරකයින් වැඩියෙන් ලංකාවට ගෙන්වන්න ඕනේ කියන යෝජනාව සම්බන්ධයෙන් හැමෝම අදහස් ප්‍රකාශ කළා.සංචාරකයන් ලංකාවට ගෙන්වාගන්න නම් මුලින්ම රටේ වාතාවරණය හොඳ පැත්තට ගන්න ඕනා.හොරකම් දූෂණ වංචා හැම පැත්තෙන්ම ඒක කෙරෙන්න ඕනා.මේ රටේ තියෙන ප්‍රශ්න ඒ රටවලටත් දැනුම් දෙනවා.සංචාරකයින්ට සංචාරය කරන්න සුදුසු ද නැද්ද කියන එක ඒ හරහා ඔවුන්ට දැනගැනීමට ලැබෙනවා.අපේ රටවල කොපමණ ස්වභාව සෞන්දර්යක් තියෙනවා ද?ලංකාව දියුණු කරන්න බැරිනම් වෙන රටවල් කොහොමත් දියුණු කරන්න බැහැ.ඇත්තෙන්ම අපි නිධානයක් උඩ ඉන්නවා හා සමානයි.

කොම්පෝස්ට් අංගනය සම්බන්ධ යෝජනාවේදී සභාවට ආපු දවසේ ඉඳලා මමත් කියනවා හැම දේ පිළිබඳව ම.නමුත් මේ සභාවේ හොඳ දෙයක් ගෙනාවොත් බෙදීමක් කරලා නවත්වන්න පුළුවන්.නරක දේත් බෙදීමක් ඉල්ලලා දිනන්න පුළුවන්.දැන් මේ සභාවේ ඒ දවස්වල වගේ නෙමෙයි හරි මාර්ගයට හැමෝම සහාය දෙනවා.හොරකම්,දූෂණ වංචා හොයලා හොඳ පැත්තට සභාව අරගෙන ඉදිරි වැඩ කටයුතු කරන්න'යි මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ලක්මාල් ජයවර්ධන මහතා**

වැදගත්ම යෝජනාව වන්නේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් කළ යෝජනාවයි.අද වන විට අතිශයින් ම පහත වැටී ඇති සංවර්ධනය කළ යුතුම පැත්තක් තමයි සංචාරක ව්‍යාපාරය කියන්නේ.ඇත්තටම අපේ මතුගම නගරය අලංකාරය කරන්න අපේ මන්ත්‍රීවරු විශාල පිරිසක් යෝජනා ඉදිරිපත් කළා.නමුත් කිසිම සංවර්ධනයකට හෝ කිසිම ව්‍යාපෘතියකට අඩු ම මුල්ගල තැබීමට හෝ හැකියාවක් තිබුණේ නැහැ.එවැනි කාල වකවානුවක මේ එක යෝජනාවක් හෝ සැලකිල්ලට ගෙන මූලා ප්‍රතිපාදන හොයාගෙන ඒ සඳහා ක්‍රියාත්මක වෙන මෙන් මුලින්ම ඉල්ලා සිටිනවා.

කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කිරීම පිළිබඳ යෝජනාවේදී මූලිකම දැනුම තියෙන්නේ කොට්ඨාශ මන්ත්‍රීතුමා වන ගරු මද්දුමගේ දොන් අතුල මහතාට යි.එතුමා වසර තිහක් පමණ මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්.එතුමාට තිබුණු ප්‍රධානම අරමුණ වූයේ කොම්පෝස්ට් අංගනය

බැහැරකට ගෙනියන්නේ කොහොමද කියන එකයි.ඔබතුමා ඉදිරිපත් කළ අබලි ද්‍රව්‍ය,කාඩ්බෝඩ් ආදිය ප්‍රතිචක්‍රීකරණය ඉතා හොඳයි.අපේ කොම්පෝස්ට් අංගනයට අක්කර 50 ක් යෝජනා කළා.එ පමණ අවශ්‍ය නැහැ .මේ කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කිරීමට වඩා,ඒ අවශ්‍ය ඉඩක් මේ කොට්ඨාශයෙන් ලබා ගන්න පුලුවන්නම්,කුමන හෝ ඇමති කෙනෙකුට කියලා ලබාදෙනවා නම් මේ දියුණු යන්ත්‍ර සූත්‍ර ලබාදීලා මේක දියුණු වෙන හැටි බලන්න.ලොවම කාර්මික වූ කාල වකවානුවක තවමත් ලංකාව කුණු එකතු කරලා ඒක දිරාපත්වීමට ඉඩ දීලා බලාගෙන ඒකෙන් වැඩ ගන්න බැරි රටක් නම් මේක වැඩක් නැහැ.ඔබතුමාට පුලුවන්නම් එක යන්ත්‍රයක් ගෙනත් ජනාකීර්ණ නොවන ප්‍රදේශයක ආරම්භ කිරීමට මූලික අඩිතාලමක් යොදන්න.මේ ඉදිරිපත් කළ යෝජනා පිළිබඳව ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

6.7.3. යෝජනාව පිළිබඳව පොඩි ගැටලුවක් තියෙනවා.මේ යෝජනාවේ තියෙනවා කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කරන්න.පසුව තියෙනවා කඩදාසි,කාඩ්බෝඩ්,වීදුරු හා යකඩ ප්‍රතිචක්‍රියකරණය කරලා සභාවට අධික ලාභයක් ලබා ගන්න.මේ එකිනෙකට පරස්පර යෝජනා දෙකක්.කොහොම නමුත් මේක පෞද්ගලීයකරණය කරනවාට මගේ විරෝධය ප්‍රකාශ කරනවා.මේකේ නාගරික කසළ පමණක් නෙමෙයි, එළියට ගිහින් මේ අනිත් තියෙන කුණු ගෙනත් සභාවට ලාභ ලබන්න කටයුතු කරනවා කියන අනිත් යෝජනාවට අපි කැමතියි.මේක ලාභ ලබා ගන්න පුළුවන් ස්ථානයක් හැටියට පත් කරන්න පුළුවන්. මේක හරි නම් නිවැරදි කරලා කතා කරන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

මේ මන්ත්‍රීතුමාලාගේ අදහස් ටික අරගෙන ක්‍රියාත්මක කිරීමයි වටින්නේ.සංචාරක අමාත්‍යාංශයේ තිබෙන අඩුපාඩුකම් නිසා ම තමයි සංචාරක ව්‍යාපාරය කඩා වැටෙන්න මූලික හේතුවක් වෙලා තියෙන්නේ. දැන් වසංගත රෝග ගාණක් ආවා. ඒ තුළින් සහ අරගලවල තිබුණු ස්වභාවය හේතුවෙන් සංචාරක කර්මාන්තය තරමක් හෝ කඩා වැටුණා. ඒ අතරින් මම මාස අටකට පමණ කලින් යෝජනාවක් කළා.මීගම, ලද්දුව ආදවල, පොල්දූව කලාපය ගත්තම හරිත වන පෙදෙසක් පවතින කඩොලාන ශාක, කිරල ගස් තියෙන එ මඟින් විශාල වශයෙන් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ඇති කර ගනිමින් බොහෝ මිනිසුන් ප්‍රමාණයක් ජීවත් වන කලාපයක්.එමෙන්ම විශාල සංචාරකයින් පිරිසක් බෙන්තර ගඟ දිගේ පහුරු කන්ද දක්වාම බෝට්ටු සවාරි ගෙන යෑමට හැකි යි. මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා යෝජනාවක් ඉදිරිපත් කළා.මම හිතන්නේ අපේ කලාපය වරාපිටිය ප්‍රධාන දර්ගා නගරය අලුත්ගම බේරුවල දක්වාම මෙම සංචාරක කලාපයට ඇතුළත් කල යුතුයි .ඒ වගේම මුහුද සහ බෙන්තර ගඟ ආශ්‍රිතව බෝට්ටු සවාරි තිබුණා.එතකොට ඒ යෝජනාව හරහා අපේ ගම් ප්‍රදේශවල අයටත් විශාල වශයෙන් රැකියාවන් බිහි වෙනවා.මම එදා යෝජනා කළේ අපේ ලද්දුව ප්‍රදේශයේ සහ කඹුරුගොඩ ප්‍රදේශයේ ජනතාවට පිට්ටනියක් හදලා දීලා ඒක හැදූවට පස්සේ සභාවට අයිති වන ලෙස කඩ ජේළියක් හදලා සංචාරක කලාපයක් බවට මෙතන පත්කරන්න කියලා.ඒ හදපු යෝජනා අද වනතුරු ක්‍රියාත්මක වුණේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යෝජනා හැටියට තිබුණා.නමුත් වර්තමානයේ වැඩ පිළිවෙලත් සමග මුළු ලංකාවේ ම ව්‍යාපෘති නතර වුණානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

අපේ බෙන්තර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමාත් මෙතන ඇවිත් ඉන්නවා. එතුමන්ලා සංචාරක ව්‍යාපාරයේ නියැළී සිටින අය.ඒ නිසා හොඳ යෝජනාවක්.මේක ක්‍රියාත්මක වෙනවා නම් විශාල වශයෙන් රැකියා පමණක් නෙමේ,හොඳ ආයෝජකයන් ලබාගන්න පුලුවන් කියන එකත් මේ

අවස්ථාවේදී මතක් කරනවා.අනෙක් සියලුම යෝජනා පිළිබඳ ව කතා කළා.මේක හැමෝම කතා කළ සම්මත යෝජනාවක්.එය ක්‍රියාත්මක කිරීම හොඳ දෙයක් .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**

සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න අපි හොඳ වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනා. මේවා යෝජනාවලට පමණක් සීමා වෙලා වැඩක් නැහැ.මෙතුමා කිව්වා වගේම මීගම ප්‍රදේශය තමයි මෙහි කේන්ද්‍රස්ථානය විය යුත්තේ. මොකද ගඟ සහ මුහුද යන සියල්ල ඒ ආශ්‍රිතවයි තියෙන්නේ. මේක හොඳ වැඩපිළිවෙළක්.

දෙවන යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී සුබසාධන කටයුතු නවත්වන්න දෙයක් නැහැ, නැවතිලා තියෙන්නේ.මම මීට අවුරුදු දෙකකට පෙර මුදල් කමිටුවේ හිටියා.එහිදී පුටු 1000 සභාවට ගන්න තීන්දුවක් ගත්තා.හැබැයි අද වනතෙක් ක්‍රියාත්මක වුණේ නැහැ.මේ ටෙන්ට්,පුටු ආදිය වර්තමානයේ පවතින ආර්ථික තත්ත්වයත් සමග මිනිසුන්ට සපයා ගැනීම අපහසුයි.ඒ නිසා මෙය ප්‍රජා සංවර්ධන කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක වීම වඩාත් වැදගත් වෙනවා.මේ ටෙන්ට්වල ප්‍රයෝජනයට ගත හැකි තහඩු ටික ඉතුරු කරගෙන පුටු ආදිය නැවත මිල දී ගත යුතුයි.මේ ටෙන්ට්,පුටු ලබා දෙන එකවත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කිරීමේ යෝජනාවට මමත් පෞද්ගලික ව එකඟ නැහැ.අපට මෙතුමන්ලා වාර්තාවක් හදලා දුන්නා.ඒ අනුව ක්‍රියා කරලා එහි නිෂ්පාදන ධාරිතාවය වැඩි කරලා පුස්තකාලවලටත්,උප කාර්යාල හෝ ඒ අවශ්‍ය තැන්වලට එම පොහොර රැගෙන ගියාම එම ගම්වල ජනතාව පොහොර මිළ දී ගන්නවා.එ නිසා මෙ මගින් හොඳ මුදලක් සභාවට ලබා ගන්න පුළුවන්.ඒ නිසා මේ පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

කොම්පෝස්ට් අංගනය සම්බන්ධ යෝජනාවේදී මමත් කියන්නේ කොම්පෝස්ට් අංගනය පුද්ගලීකරණය කිරීම සුදුසු නැ කියලයි.

සංචාරක කර්මාන්තය ගත්තොත් එහි නියැලෙන අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඉන්නවා.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග මහතා සමඟ දැන් සංචාරක ඇමැතිව සිටින හරීන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ විශේෂ සම්බන්ධතාවයක් තියෙනවා.ඔහුගේ සහ අපේ සංචාරක ව්‍යාපාරයේ නියැලී සිටින මන්ත්‍රීවරු මූලික කරගෙන ඒ සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරලා හරීන් ප්‍රනාන්දු ඇමතිතුමාට යොමු කරලා ඉතා පහසුවෙන් මේ දේ කර ගැනීමට හැකියාව තියෙනවා.ඒ වගේම බෝපිටිය වත්ත,අඹේතැන්න වතුයාය වැනි භූ විෂමතාවයන් තියෙන ප්‍රදේශ තෝරාගෙන දියුණු කළොත් ඒ ආශ්‍රිත ප්‍රදේශය හෝ සංවර්ධනය වෙනවා.අපේ ප්‍රදේශවල රැකියා අවස්ථා උත්පාදනය වෙනවා.ඒ පිළිබඳ ව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය**

6.7.1. යෝජනාවට මමත් එකඟ වෙනවා. ඒ වගේම අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතාත් මේ හා සම්බන්ධ ව අදහස් ප්‍රකාශ කළා. මමත් කියනවා, අපේ ගම් ප්‍රදේශයේ ස්වාභාවික දේ බොහෝ තියෙනවා.ඒවායින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්.දැනට රැකියාවන්හි නියුතු නොවන අයට මේ හරහා නව රැකියා අවස්ථාවන් උදා වෙනවා.වැටකෙයියා,පන් ආදී ස්වාභාවික දෑ යොදා ගැනීම මඟින් නව නිර්මාණ කර උදව් උපකාර කර ගම සංවර්ධනය කර ගැනීමටත් මේ හරහා අවස්ථාව ලැබෙනවා.මේ යෝජනාව මඟින් හෝ එවැනි දෙයක් වෙනවා නම් මමත් ඇත්තට ම කැමතියි.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

ඇත්තටම මේක හොඳ යෝජනාවක්.ඒ වගේම ඇමතිතුමා ව මාසෙකට බැංකොක් වලට ගිහින් දාන්න ඕනා.දවස් දහයක් විතර ඉන්නකොට එතුමාට තේරෙයි බැංකොක්වල මොනවද කරන්නේ

කියලා.දෙවනුව සිංගප්පූරුවට ගිහින් දාන්න ඕනා.වෙනත් රටවලට යනකොට එහේ ගොඩ බැහැලා පැය හතරහමාරක් ඉන්න ඕන.එහිදී ඒ රටේ තියෙන සුන්දර ම ස්ථාන දකින්න සලස්වනවා.අපේ රටේ එහෙම නැනේ.මේක ගුවන්තොටුපලෙන් පටන් ගන්න ඕනා.මේ සුන්දර පරිසරය පෙන්නන්න ඕන.තවදුරටත් රාත්‍රියේදී නොනිදන නගර බවට මේ කොළඹ සහ සංචාරක නගර පත් කරන්න ඕනා. වෙනත් රටවල සංචාරකයින් සතු ධනය වක්‍රාකාරයෙන් අය කර ගැනීමේ ක්‍රම සකස් කරලා තියෙන්නේ.අපේ රටේත් ඒවා ක්‍රියාත්මක විය යුතුයි.මේ යන සංචාරක මගපෙන්වන්නන්ගේ මනස විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් සකස් කරලා එවන්න ඕන.මේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න බෑ කියලා කියනවා නම් ඒ නිකමෙක් තමයි.මේ සංචාරකයින් බලාපොරොත්තු වන සංචාරක ක්‍රියාකාරකම් සකස් කරන්න ඕනා.ඒ නිසා ඔබතුමා 6.7.1හොඳ යෝජනාවක් ගෙනාවේ.ඔබතුමා මේ අදහස් වල හොඳ ටික අරගෙන ඇමතිතුමාට අහන්න සලස්වන්න.මේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කළොත් ඇති මුළු රටම ගොඩනඟන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

මේ යෝජනාව සම්බන්ධ ව අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරුන්ට බොහොම ස්තුතියි. සංචාරක කර්මාන්තය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරලා අපි මෙතන කතා කළාම විතරක් වැඩක් නැහැ.මේ සම්බන්ධ ව වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනා.ඒ සඳහා සංචාරක කර්මාන්තය පිළිබඳව යම් අවබෝධයක් තියෙන මන්ත්‍රීවරු මැදිහත් වෙනවා නම් හොඳයි.ඇත්තටම සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් මේ මතුගම දියුණු කරන්න ඕන මොන අඩිතාලමක ඉඳන් ද කියලා මට අවබෝධයක් නැහැ. ඒ නිසා නැවත වතාවක් මේ සඳහා අවබෝධයක් තියෙන මන්ත්‍රීවරුන්ට මැදිහත් වෙන්න කියා ඉල්ලා සිටිනවා.

අන්තිම යෝජනාව සම්බන්ධවත් මම වචනයක් කතා කරන්නම්.ආයෝජනය කියන වචනයට බිය විය යුතු නැහැ.මේක විකුණන්න කියලා සින්නක්කර ඔප්පුවකින් ලියන්න කියන එක නෙමෙයි මම මෙතනින් අදහස් කලේ,ආදායමක් උපයන්න කියන එකයි. මේ වචනයේ වටිනාකම ඔබතුමන්ලා අනාගතයේ හෝ තේරුම් ගනී යැයි මම විශ්වාස කරනවා.

**“2022 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ 2022 වර්ෂයේ ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම”** කියලා පත්‍රිකාවක් බෙදලා තියෙනවා.රටේ කොලත් නැති වෙලාවේ බොරුවට කොළ පුරවලා ෆයිල් පුරවන්න හදන්න එපා යෝජනා ඉල්ලලා. අවුරුදු හතරක් තිස්සේ මන්ත්‍රීවරු දීපු ඉෂ්ට නොවුණු යෝජනා තියෙනවා.ඒ ඉටු නොවුනු යෝජනා ටික මේ අයවැය ලේඛනයට ඇතුළත් කරන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ වෙනකොට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කරපු යෝජනා සාකච්ඡා කර අවසන් වෙලා තියෙනවා.එතුමා අවසන් වශයෙන් ඉදිරිපත් කළා මේ “පෞද්ගලීකරණය” සහ “ආයෝජනය” යන දෙක අපට තේරුම් ගන්න කියලා.අපි ඒක හරියට ම තේරුම් අරන් තමයි කතා කළේ.එතුමා කියලා තියෙනවා පෞද්ගලික ආයෝජකයන් සමග එකතු වෙලා පුද්ගලීකරණය කරන්න කියලා.ඔය වචන දෙකම දැම්මේ නැත්නම් ඕකේ ප්‍රශ්නයක් නැහැ.මම මේ අවස්ථාවේ නැගිට්ටේ ඒක කතා කරන්න නෙමෙයි.ගරු සභාපතිතුමනි,පුබුදු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනා මේ සභාවේ සාකච්ඡා වෙන අවස්ථාවේ කවුරුත් පළමු සහ දෙවැනි යෝජනා සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කළා.නමුත් තුන්වැනි යෝජනාව වන කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කරන යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවක් තිබුණේ නැහැ.ඒ නිසා මේ අවස්ථාවේ මේ සභාවේ ගන්න තීරණය මොකක්ද කියලා බලන්න ඕනා.එක්කෝ මෙතුමා ඒ යෝජනාව ඉල්ලා අස්කර ගන්න ඕනා.එහෙම නැතිනම් පරාජය කරන්න ඡන්දයක් තියන්න ඕනා.ඒ නිසා ගෞරවයෙන් ඒ පිළිබඳ ව ඔබතුමාට මතක් කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි ඒකට බෙදීමක් ඉල්ලමු.
ඔබතුමාගේ යෝජනා එකකට මම කෙටි අදහසක් දෙන්නම්. සංචාරක ව්‍යාපාරය ව්‍යාප්ත කරන්න ඔබතුමාට හොඳ අවස්ථාවක් තියෙනවා.මතුගම මද්දෙගෙදර වත්තේ ඉඩම් අක්කර සීයක් සිසිර සේනාරත්න මැතිතුමා ඉද්දි ආයුර්වේද කටයුතු සඳහා වෙන් කරගත්තා.වැලිපැන්න ගඟ ආසන්නයේ එම ඉඩම ඔබතුමාට අරගෙන සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන්.අපි තොරතුරු දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**
ඕක සභාපතිතුමා වැඩපිළිවෙළක් එක්ක හදලා දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ අපි හදලා නෙමෙයි, අපි තොරතුරු ටික දෙන්නම්.ඔබතුමා මුල්වෙලා මේක හදන්න. රාජ්‍ය අනුග්‍රහය ඔබතුමාට තියෙන නිසා මම මේ කියන්නේ.මේ ඉඩම්වලින් කාටවත් ප්‍රයෝජනයක් වුණේ නැහැනේ.ඒකයි මම කිව්වේ.

**<u>කොම්පෝස්ට් අංගනය පෞද්ගලීකරණය කිරීමට විරුද්ධ වූ මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා.</u>**

එහි දී ඡන්ද විමසීම සිදු කළ අතර එම යෝජනාවට **පක්ෂ** ව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ 3ක් ද,**විපක්ෂ** ව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ 18ක් ද **ඡන්දය නොදුන්** මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ 5ක් ද එම අවස්ථාවේ දී **සභාවේ නොසිටි** මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ 3ක් ද **නොපැමිණි** මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ 4ක් ද විය.එම මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්ගේ ලේඛනය පහත පරිදි ඉදිරිපත් කරමි.

**පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියෝ**

1. පුබුදු මදුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
2. තුසිතා ප්‍රියංගනී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
3. මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**විපක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියෝ**

1. මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
2. ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
3. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
8. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
9. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. සුරේෂ් දර්ශන ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. නිලූකා දර්ශනී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
14. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

15. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
17. ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**ඡන්දය නොදුන් මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියෝ**

1. සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
2. පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
3. සුජීව නිර්මාණ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. හින්ටන් මද්දගේ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**එම අවස්ථාවේ දී සභාවේ නොසිටිය මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියෝ**

1. **නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**
2. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
3. ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**නොපැමිණි මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියෝ**

1. කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
2. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
3. කාන්ත සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**6.8 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:**

<u>යෝජනාව</u>

6.8.1 මතුගම ප්‍රාදේශීය සභාව මඟින් මේ වන විට ක්‍රියාත්මක වන යටදොළ බටහිර ග්‍රාම සේවා වසමේ කොස්ගහ කන්ද හන්දියේ සභාවට අයත් පෙර පාසල "ලාල් ජයසිංහ" පෙර පාසල නමින් නම් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම ප්‍රාදේශීය සභාව මඟින් මේ වන විට ක්‍රියාත්මක වන යටදොළ බටහිර ග්‍රාම සේවා වසමේ කොස්ගහ කන්ද හන්දියේ සභාවට අයත් පෙර පාසල "ලාල් ජයසිංහ" පෙර පාසල නමින් නම් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද

යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.8.2 <u>යෝජනාව</u>

I. 2019.02.05 වන දින පැවති මහා සභා වාරයේ දී උප සභාපතිතුමාගේ නිල කාමරය සකස් කිරීමේ දී සිදු වී ඇති අක්‍රමිකතා නිසා එම මුදල් ගෙවීමට සභාව මඟින් විරෝධතාවයක් එල්ල වූ අතර සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් පරීක්ෂණයක් කොට එම නිර්දේශය සභාවට ලබා දෙන මෙන්

ඉල්ලා සිටිය ද මේ වන විට එම නිර්දේශය ගරු සභාවට ඉදිරිපත් කර නොමැති අතර එම නිර්දේශය ගරු සභාවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමි.

II. රු.424 300.00ක් වන මුදල කොන්ත්‍රාත්කරු වන එල්.ඩී.ගයාන් මහතා වෙත ගෙවා අවසන් ද?
<u>තීරණය-තොරතුරු සතියක් ඇතුළත ලබා දෙන බවට පොරොන්දු වී ඇත.</u>

<u>යෝජනාව</u>

6.8.3 මෙම යෝජනාව 2018 වර්ෂයේ මා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවකි.යටදොළවත්ත 802D නැගෙනහිර ග්‍රාම සේවා වසමේ ඇති අඹේතැන්න මාර්ගයේ ඇති කානු පද්ධතිය හා මාර්ගයේ කොටසක් ඉතා අබලන් ව පවතී.මහා සභා වාර කිහිපයක දී මා විසින් මෙම මාර්ගය අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීම් කළ ද සභාපතිතුමාගේ හෝ ලේකම්වරියගේ අවධානයක් යොමු වූයේ නැත.ඔබතුමාගේ අවධානය මෙම යෝජනාව කෙරෙහි යොමු නොවීමට හේතුව කුමක් වේද?

802D යටදොළවත්ත නැගෙනහිර ග්‍රාම සේවා වසම මතුගම ප්‍රාදේශීය සභා බල මණ්ඩලයට අයත් වසමක් බවට සභාපතිතුමා සහ ලේකම්තුමියට මතක් කර සිටිමි.නැවත ගරු සභාවට යෝජනා කරනුයේ මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසට ය යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

**<u>තීරණය</u>**

මෙම යෝජනාව 2018 වර්ෂයේ මා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවකි.යටදොළවත්ත 802D නැගෙනහිර ග්‍රාම සේවා වසමේ ඇති අඹේතැන්න මාර්ගයේ ඇති කානු පද්ධතිය හා මාර්ගයේ කොටසක් ඉතා අබලන් ව පවතී.මහා සභා වාර කිහිපයක දී මා විසින් මෙම මාර්ගය අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීම් කළ ද සභාපතිතුමාගේ හෝ ලේකම්වරියගේ අවධානයක් යොමු වූයේ නැත.ඔබතුමාගේ අවධානය මෙම යෝජනාව කෙරෙහි යොමු නොවීමට හේතුව කුමක් වේද?

802D යටදොළවත්ත නැගෙනහිර ග්‍රාම සේවා වසම මතුගම ප්‍රාදේශීය සභා බල මණ්ඩලයට අයත් වසමක් බවට සභාපතිතුමා සහ ලේකම්තුමියට මතක් කර සිටිමි.නැවත ගරු සභාවට යෝජනා කරනුයේ මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසට ය යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.8.1. යෝජනාව යටතේ මේ යටදොළ හන්දියේ කොස්ගහකන්ද පෙර පාසල සඳහා ලාල් ජයසිංහ මහතාගේ නම යෝජනා කිරීම සම්බන්ධයෙන් විරෝධතාවක් තියෙනවා නම් පමණක් අපි මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්නම්.මේක හදාගන්න බැරුව ඉන්න අවස්ථාවක දී මේක ඉදි කරන්න අවශ්‍ය ලක්ෂ 20ක මුදලක් අපට ගෙනත් දුන්නේ මෙතුමායි.පක්ෂව හෝ විපක්ෂව වේවා ගමේ සංවර්ධන කටයුතු වල දී විශාල මෙහෙවරක් කරපු පුද්ගලයෙක්.අද වන විට එතුමා අනතුරකින් මිය ගිහින් ඉන්නේ. ඒ නිසා ඒ නම යෝජනා කරන්න කියලා ගමේ සමිති සමාගම් කිහිපයකින්ම තමයි මට ඉල්ලීමක් ආවේ.ඒ නිසා මම මේ යෝජනාව එතුමාට ගෞරවයක් වශයෙන් එතුමාගේ නමින් නම් කරන ලෙස යෝජනාවක් ගේනවා.

6.8.2 යෝජනාව සම්බන්ධයෙන් ඒ තොරතුරු තව සතියක් ඇතුළත ලබා දෙන බවට මට සභාවෙන් දැනුම් දීලා තියෙන නිසා ඒ යෝජනාව සම්බන්ධයෙන් කතා කරන්නේ නැහැ.

6.8.3 යෝජනාව මම 2018 දැම්ම යෝජනාවක්.අඹේතැන්න මාර්ගය ඇත්තටම අබලන් තත්ත්වයේ තියෙන මාර්ගයක්.පාසල් ළමුන් ඒ පාරේ සැහෙන අපහසුතා රැසක් මධ්‍යයේයි එන්නේ.වැස්ස වෙලාවට පාරේ අඩියක් විතර වතුර පිරිලා තියෙනවා.ඒ වගේම අඹේතැන්න වත්තේ ද්‍රවිඩ ජනතාව

විශාල ප්‍රමාණයක් ඉන්නවා.අනික දවසකට වාහන 150කට 200කට ආසන්න ප්‍රමාණයක් අඬේතැන්න මාර්ගය හරහා ගමන් කරනවා.ඒ අනුව ඡන්ද දායකයෝ 700 කට වැඩි ප්‍රමාණයක් එම මාර්ගය භාවිත කරනවා.ඒක නිසා මම මේ යෝජනාව සභාපතිතුමාට දුන්නා.මට ඊට පස්සේ මේ මාර්ගය සංවර්ධනය කිරීමක් පිළිබඳව දැනුම් දීමක් කළා.මේ මාර්ගය පිළිබඳව දැඩි ලෙස සභාපති තුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ යෝජනාව සම්බන්ධ ව මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ සමිතිවලින් මෙහෙට ආවම මම කිව්වා මන්ත්‍රීතුමා හරහා මේක එවන්න කියලා.මගේ අදහසක් තියෙනවා අපි පෙර පාසල නම් කළාට කමක් නැහැ,ඒක ජනතාවගේ ඉල්ලීම නම්. මම කියන්නේ අපි මෙහෙම කරමු.මේ ශාලාව නම් කරමු,"ලාල් ජයසිංහ මහතා"නමින්. අපිට මේවා ප්‍රාදේශීය සභා පෙර පාසල් ලෙසටනේ යන්නේ.ගොඩනැගිල්ල දුන්නේ එතුමා නිසා එතුමාගේ නමින් සමරු ශාලාව හරි,අනුස්මරණ ශාලාව හරි කියලා දාමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
අපේ පනතේ 198 වන වගන්තිය යටතේ අනුමැතිය දීලා තියෙන්නේ පාරක් හෝ ක්‍රීඩාංගණයක් නම් කිරීම සම්බන්ධයෙන් පමණයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට ගොඩනැගිල්ලක් කොහොමද නම් කරන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
මේක සභාවේ යෝජනාවක් දාලා සභාවේ ඡන්දයක් විමසලා ගන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභා යෝජනාවක් තමයි මේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ගොඩනැගිල්ලකට දැම්මට ප්‍රශ්නයක් නෑ නේද මන්ත්‍රීතුමා?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
නෑ ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
ඇත්තටම ලාල් ජයසිංහ මැතිතුමාට ගෞරවයක් වශයෙන් මේ කසුන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මම අනුමත කරනවා.මේක නීත්‍යානුකූල පැත්තට බැරිනම් ලාල් ජයසිංහ කියන නම දාලා ඊට අමතරව පෙර පාසල යන එකට "මිණිමුතු"වැනි ලස්සන නමක් යොදලා ඒ කළ හැකි උපරිමයෙන් ඉටු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ශාලාවට එහෙම ඒ නම දැම්මහම ගෞරවයක් ලැබෙනවා නේද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
ඔව්.ඒ වගේම ඒ පෙර පාසලේ පවතින කැඩී බිඳී ගිය දෑ ඉවත් කරලා සියලුම පහසුකම් හැකි ඉක්මනින් සලසන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එම යෝජනාව සංශෝධනය කරන්න අවශ්‍ය නම් එය නැවත වරක් මම ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ගොඩනැගිල්ලේ මුදුන් වහල ගාව යටින් එතුමාගේ නම ගහල ඕක නම් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක හැකි ඉක්මනින් කරලා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
6.8.1.යෝජනාව සම්බන්ධව අදහසක් දක්වනවා නම් දේශපාලන චරිතයක් විදිහට කළුතර දිස්ත්‍රික්කයම දන්නා ලාල් ජයසිංහ මහතා අප අතරින් වියෝ වුණා. ඇත්තටම එතුමාට ගෞරවයක් විදිහට යෝජනාවක් කරලා තියෙනවා "ලාල් ජයසිංහ අනුස්මරණ පෙර පාසල" කියලා නම් කරන්න.නමුත් මේක සංශෝධනය වෙලා දැන් "ලාල් ජයසිංහ අනුස්මරණ ශාලාව" කියලා යෝජනාවක් සම්මත වෙනවා.මෙම යෝජනාව පිළිබඳව මම කසුන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.මම ලාල් ජයසිංහ මහතාගේ බෑණාට කතා කළා මේ යෝජනාව සම්බන්ධයෙන්.ඇත්තටම කසුන් මන්ත්‍රීතුමා එතුමාගේ පවුලේ කාවවත් දැනුවත් කරලා නැහැ.මම මේකේ හොඳ පැත්ත දකින්නේ ඒකයි.ඒ පිළිබඳ දැනුවත් කළා නම් ඒකත් හොඳයි.මේ සම්බන්ධයෙන් කසුන් මන්ත්‍රීතුමාට මම විශේෂ ස්තුතියක් කරනවා.

- **ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
  අපි යෝජනා කරද්දී ගෙවීම් වගයක් සම්බන්ධ ව කල් තිබ්බනේ.දැන් ඒ පිළිබඳ නිලධාරීන් ගෙන්නලා සාකච්ඡා මට්ටමින් යන කාරක සභාවක් වශයෙන් යමු.මන්ත්‍රීතුමන්ලාට ඒ ප්‍රශ්න ඉදිරිපත් කරලා ඒවාට මේකෙන්ම පිළිතුරු ගමු.

  ආදාහනාගාර උදුනේ අලුත්වැඩියාව සම්බන්ධ ව කියන්න. මොනවද ඒකෙ කළේ?

**6.1.11** <u>ආදාහනාගාර උදුනේ අලුත්වැඩියාව</u>

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
ආදාහනාගාර ලී උදුනේ අලුත්වැඩියාවක් අපට කරන්න සිදුවුණා,ඒකේ පිපිරීමක් සිදු වුණ නිසා.මේ අලුත්වැඩියාව අයිතම දහයක් යටතේ සිදු වුණේ.මේ සඳහා අපි 2022 මාර්තු මස 24 වන වනදා මිළ ගණන් කැඳෙව්වා.Lanmo Engineering සමාගමේ ***"ඒ.ඒ.එල්.ලියනආරච්චි"*** තමයි එකේ කොන්ත්‍රාත්කරු වුණේ.ඒ අනුව ඒගොල්ලො ඒ අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පස්සේ අපිට ඒ බිල ඉදිරිපත් කරලා තියෙනවා.ඒ යටතේ,

1. ආදාහනාගාරයේ ඇතුළත ගිනි ගල් කියලා කියන්නේ.ඒවා බිදිච්ච ඒවා ඉවත් කරලා අලුත් -වැඩියා කළා - රු.1 45 000.00
2. ඉදිරිපස දේහය ඇතුල් කරන දොර අලුත්වැඩියා කටයුතු කරලා තිබුණා. ඒක ඇද වෙලා තිබුනේ. ඒකේ බීඩිං ගිහින් තිබුණා.ඒ ටික අලුත්වැඩියා කිරීමට - රු.1 65 000.00
3. ඒකෙ බීඩිං දාන්න - රු. 70 000.00
4. විදුලි පද්ධතියේ අලුත්වැඩියා කිරීමක් තිබුණා.ඒකට - රු. 35 000.00
5. ආදාහනාගාරයේ වට කරලා තියෙනවා පොඩි ඇලුමිනියම් ක්ලැඩින් එකකින්.එකේ කෑලි ගැලවිලා තිබුණා.ඒවා ම පාවිච්චි කරලා අලුත්වැඩියා කරලා තිබුණා.- රු. 15 000.00
6. ඊට අමතරව ආදාහනාගාරය ඇතුලේ ආරුක්කු හැඩයක් තියෙනවා.ඒක යොදන්න වෙනම ගාණක් අය කරලා තිබුණා. - රු. 55 000.00

7. චිම්නියේ උඩින් යන දුම් බටයේ ජොන්ට් එක ඉවත් වෙලා මළ බැඳිලා තිබුණා. ඒක පවිත්‍ර කරලා තිබුණා. - රු. 65 000.00

8. බර්නර් අයින් කරලා නැවත දාලා තිබුණා - රු. 75 000.00

9. සම්පූර්ණ පද්ධතියේ අදාළ පොඩි පොඩි අලුත්වැඩියා කිරීම් කරලා තිබුණා. - රු. 35 000.00

10. අවසාන බිල වශයෙන් ඉදිරිපත් කරලා තිබුණා. - **රු.660000.00**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාලංචිදුරගේ මිත්‍රානන්ද මහතා**
මේක වෙනත් ආයතනවලින් කරන්න බැ නේද?දිගටම මේ ආයතනයෙන් ම ද අළුත්වැඩියා කලේ?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
ඔව්.මේ වැඩ කරන අය හරි අඩුයි.අපේ දිගටම අලුත්වැඩියා කළේ මෙයා තමයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
බර්නර් 5ට කීයද දාලා තියෙන්නේ?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
රු.75 000.00ක් දාලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක කවදද කරලා තියෙන්නේ?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
2022 ජූලි මාසේ.මාර්තු මාසේ තමයි මිල ගණන් කැඳෙව්වේ.වැඩ ඉවර කරලා තියෙන්නේ ජූලි මාසයේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
දැන් ආදාහනාගාරයේ අලුත්වැඩියාව ඉවරද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
නැ මන්ත්‍රීතුමා, මේ B දරන පැත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැනට මේක වැඩ කරනවාද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
දැනට දෙකක් වැඩ කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැනට ආදාහනාගාරයේ හඳුනාගත්ත අලුත්වැඩියාවක් තියෙනවාද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
වහලේ අලුත්වැඩියාවක් තියෙනවා.ඒ පිළිබඳ දිගටම ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු උපසභාපති ලලිත් රණසිංහ මහතා**
මේ වගේ ආයතන සමාගම් තවත් තියෙනවාද?

**වැඩ අධිකාරි සමින්ද කුමාර මහතා**
මේ වගේ ආයතන ලංකාවේ තියෙන්නේ තුනක් වගේ මම දන්න හැටියට.මේ "නර්ඩ්"ආයතනය,තමයි මේක මුල ඉඳලාම මේ අලුත් වැඩියා කටයුතු දිගටම අපිත් එක්ක කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා**
මේක වෙනත් ආයතනයකට දීලා කරන්න බැරිද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
බැහැ.මේක විශේෂ ක්‍රියාවක්.මේ ආදාහනාගාර සම්බන්ධයෙන් හැමෝම කරන්නේ නැහැ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මේකේ ඉන්න නිලධාරීන් මේ පිළිබඳ සෑහීමකට පත් වුණාද?

**වැඩ අධිකාරි සමින්ද කුමාර මහතා**
ඔව්,මම එයත් එක්ක කතා කළා.එයා සෑහීමකට පත්වුණා.

**6.1.5** <u>ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසාන ගෙවීම් මුදල වන රු.**1323000.00**ක් ඉසුරු ගොවි සංවිධානය,ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන් ධ ව.</u>

2වන අදියර ඇස්තමේන්තුව.රු.**1 457 146.67**මේකේ කරපු වැඩ කොටස තමයි,

1. වොලිබෝල් ගහන්න පාවිච්චි කරන ප්ලේ ඒරියා එකේ කටයුතු සඳහා ඒක හාරලා කළුගල් අතුරලා ඒ වැඩ ටික කිරීම සහ ඊට අමතරව කෝඩ් එක වටේ තියෙන දැල ගැහුවා.ඒකට හයි කරන්න අවශ්‍ය දේවල් සඳහා
2. දැල් සහ යකඩ රාමුවෙන් සැකසූ ගේට්ටුවක් තියෙනවා.
3. ඊට පස්සේ පස් පුරවලා තියෙනවා.
4. ඒකේ යට වතුර රැදෙනවාට දාන්න රබර් පැකින් එකක් තියෙනවා.
5. වොලිබෝල් කණු දෙක දෙපැත්තෙන් හයි කරලා තියෙනවා.
6. ඊට අමතරව පිච් එක මාක් කරලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
ඒ ඔක්කොටම තමයි ඔය ගාණ නේද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
ඔව්.දෙවන අදියර(සභා අරමුදල් )

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ මන්ත්‍රීතුමාට ඒ මිනුම් වාර්තාත් දෙන්න බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
මේකේ ගෙවීම් මුදල් දෙකක් තියෙන්නේ ඇයි? ඔය දෙකෙන් නිවැරදි මොකක් ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ සභාපතිතුමාගේ දාන යෝජනාවේ රු.1 311 432.00ක් වශයෙන් දෙකක් තියෙන්නේ ඇයි?හේතුව මොකක් ද?

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
දැන් මේකේ අතරුදවුම් කීයක් තියාගන්නවා ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
සම්පූර්ණ ව්‍යාපෘතිය කීයද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
සම්පූර්ණ ව්‍යාපෘතියේ මීට වැඩියි.පළමු අදියරක් ගියා මේකේ.මේ දෙවන අදියර තමයි දාහතර ලක්ෂ ගාන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේකේ තියෙන අවසාන ගෙවීම කීයද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
දෙවන අදියර අවසාන ගාන මේ.

**උප සභාපති ලලිත් රණසිංහ මහතා**
දැන් මේ ව්‍යාපෘතියේ සම්පූර්ණ එක කීයද?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
මේකේ තියෙන්නේ දෙවන අදියර විතරයි. දෙවන අදියරේ ඇස්තමේන්තු මුදල රු.14 80 000.00යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
මේකේ ගෙවීම්වල 80 අංකය යටතේ රු.1 311 432.00 ක් දාලා තියෙනවා.ඒ දෙකෙන් කොයි එකද හරි?

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**

| | |
|---|---|
| අවසන් ගෙවීම | **-රු.1311432.00** |
| අතරුදවුම | **-රු.145714 .67** |
| මේ දෙකේ ම එකතුව | **-රු.1457146.67** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
දැන් මෙකෙ තියෙනවා රු.13 230 00.00යි. එතකොට ගෙවලා තියෙනවා. රු.13 114 32.00ක්. රු.14 800 00.00ද ගාන.

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
රු.14 800 00.00යි ව්‍යාපෘතිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට මේකේ මුලින් ම අතරුදවුම් කීයක් හරි ගෙවලා තියෙනවා ද?

**වැඩ අධිකාරි සමින්ද කුමාර මහතා**
නැ.ගෙවලා නැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
රු.14 800 00.00ද හරියට ම ගාන?

**වැඩ අධිකාරි සමින්ද කුමාර මහතා**
නැ මන්ත්‍රීතුමා ඒ ඇස්තමේන්තුවනේ. වැඩේ කළා ම බිල පොඩ්ඩක් අඩු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔය ගෙවන ගාන මේකේ සම්පූර්ණ මුදල කොපමණද ?

**වැඩ අධිකාරි සමින්ද කුමාර මහතා**
රු.14,45714.67යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේකේ ප්‍රශ්නයක් තියෙනවා ද? මේ ව්‍යාපෘතියට අදියර 2යි. එකක් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
පළමු අදියර යටතේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් තමයි රු.1500000.00 කියලා මුදල් වෙන් කළේ. ඒකෙ සල්ලි ආවේ නැ.දැන් තමයි චෙක් එක ඇවිල්ලා තියෙන්න්.මේකේ රු.1323000.00ක් කියලා ඇස්තමේන්තුවට දාල තියෙන්නේ යෝජනාවනේ.ඒ අරමුදල් ගෙවන්න අනුමැතිය ගන්න තමයි ඒ දාල තියෙන්නේ.මේකේ තියෙන එක මාර්තු මාසේ සභාවෙන් තමයි ඇස්තමේන්තුවට අනුමැතිය අරගෙන තියෙන්නේ.ජූනි 15 මහා සභාවේ මේ ගෙවීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා.ඒකෙන් පස්සේ තමයි මේක ගෙවලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ගෙවපු එකයි ගෙවන්න අනුමැතිය ඉල්ලපු එකයි දෙකක් මේ තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔබතුමා මේක පැහැදිලි කරන්න.

6.1.5. යටතේ "ග්‍රාමීය සහ පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසන් ගෙවීම් මුදල වන රු.1323000.00ක් ඉසුරු ගොවි සමිතිය ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාවට ඉදිරිපත් කරමි."මොකක්ද මේයෝජනාව?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබුණු මුදලට වොලිබෝල් ක්‍රීඩා පිටියේ එක අදියරක්.මේකට වෙනම ගොනුවක් තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට අරක තව එකක් ද?80 යටතේ 2වන පිටුවේ තියෙනවා තව එකක්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක නොසැලකිල්ලෙන් දාලා තියෙන්නේ. ඕගොල්ලෝ මේක මේ න්‍යාය පත්‍රයෙන් ප්‍රතික්ෂේප කරලා දාන්න. ඊළඟ සභාවට හරි මේක හරියට ලියලා දාන්න.මේකේ අලුත්වැඩියාව කියලා දාන්න බෑනේ.එක්කෝ මේක හරියට බලලා දාන්න.මේකේ තියෙනවා ගණන් දෙකක්. මන්ත්‍රීතුමන්ලා බලන්නේ මේකේ තියෙන්නේ ගණන් දෙකක්නේ.ෆයිල් දෙකක් තියෙන බව මන්ත්‍රීවරු දන්නැනේ. එහෙනම් ෆයිල් එකත් එක්කම දාන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ඉතින් මේවා සභාපතිතුමා හරහා ඉදිරිපත් වන යෝජනා. ඔබතුමාටයි හොඳ නැත්තේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ මම නම් ඊට පස්සේ මගේ යෝජනා යටතේ දාන් නැහැ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
නෑ නෑ සභාවට දාන්න ඕන.අපි ඇස්තමේන්තුවත් අලුතින් ඉල්ලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
අලුත් ඇස්තමේන්තුවක් ඉල්ලමු.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
තණකොළ කපන මැෂින් හා සම්බන්ධ ප්‍රශ්න ටික ගන්න.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා ඇහුව ප්‍රශ්නවලට අපි උත්තර නිකුත් කළානේ.ඒ අදාල ටික දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ඒක ඉදිරිපත් කරපු මන්ත්‍රිතුමා සභාවේ නෑ. අපට විශේෂයක් නෑ ඒකෙන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ මන්ත්‍රීතුමාත් එක්ක මේක බලලා එයාට දෝෂයක් තියෙනවා නම් සභාවට දාන්න කියමු,ප්‍රශ්නයක් හැටියට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අංක 71 තියෙනවා, දැන්වීම් පුවරු සඳහා වැඩිපුර අය කරන ලද මුදල ආපසු ගෙවීම කියලා.රු.52,200.00ක් අරන් තියෙනවා මුදලින්.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මතුගම ආයතනයෙන් ඇවිත් අපේ ලිපියට මුදල් ගෙව්වා.නමුත් ඒ අයට ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීමට යැවූ පසු එහෙන් සභාව නමින් චෙක් පතක් එවලා තියෙන්නේ.ඒ චෙක්පතින් සහ මුදලින් යනාදී වශයෙන් දෙපාරක් ගෙවලා තියෙන නිසායි මෙහෙම වෙලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඉල්ලීමේ ලිපිය ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

**<u>ගෙවීම්හි අංක 29 යටතේ ශ්‍රවණාගාර භූමිය තාර දැමීම සඳහා ඒ.බී.සී ගල් කියුබ් 6ක් මිලදී ගැනීම.(රු.9500.00*6)-රු.57, 000.00</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

ඒ.බී.සී සම්බන්ධ ප්‍රශ්නයක් නිසා මම කළුගල් සම්බන්ධ ප්‍රශ්නයක් අහනවා.කුමාර වෙල්ගම මාවතට කළුගල් වගයක් බාලා තිබුණා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නෑ.ඒකට සභාවෙන් ගෙව්වේ නෑ.මම ඒකේ පාඩුව දරන්නේ.ඒ වැසිකිලි හදන එකට අපට මන්ත්‍රීතුමා බාධා කළානේ.ඒ කරලා අපේ ගල් ලෝඩ් එක අරන් ගිහිල්ලා.මමයි ගල් ලෝඩ් එක බෑවේ.මම ඒකට අතින් ගෙව්වා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

කවුද ඒක අරන් ගිහින් තියෙන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

අරන් ගිහින් තියෙනවා අණුප පැස්කුවල් මන්ත්‍රීතුමාගේ ගෙදරට භාගයක්.ඉතුරු ගල් ටික එතන කඩේ හදපු කෙනා තුනී කරලා තියෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මම ඒකේ පාඩුව දරා ගත්තා.

**<u>අංක 21 යටතේ 2022 ජූලි 22 මහ සභාව සඳහා සංග්‍රහ අත්තිකාරම් රු.10 000.00</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

මට ගෙවීම් යටතේ අංක 21 සම්බන්ධ ප්‍රශ්නයක් තියෙනවා.මේකේ දාලා තියෙනවා 2022 ජූලි මස මහා සභාව සඳහා සංග්‍රහ අතිකාරම් රු.10 000.00ක මුදලක්. තේ එක විතරයිනේ හම්බ වුණේ.දැන් රු.10 000.00 තමයි මාස ගාණක් වැටිලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ බිලක් තියෙනවා. මේකේ එකතුව රු.**8760.00**ක් තියෙනවා.රු**.9000.00**ක් ගෙවලා තියෙනවා.ඉතිරිය රු**.200.00**ක් තියෙන්නේ. මේක "රත්න සුපර්" එකෙන් අරන් තියෙන්නේ.

| | | |
|---|---|---|
| 1. සුදු සීනි 3Kg | - | රු. 795.00 |
| 2. ඇන්කර් 2 | - | රු.2320.00 |
| 3. නෙස්ටමෝල්ට් | - | රු. 830.00 |
| 4. බෝතල් වතුර (බෝතල් 56) | - | රු.4200.00 |
| 5. පේපර් සර්වියට් | - | රු. 280.00 |
| 6. ලාඔජී තේ | - | රු. 335.00 |
| මුළු මුදල | - | රු.**8760.00** |

නැහැ ඉතින් 50දෙනෙක් විතර තේ බොනවනේ.මේකේ තියෙන්නේ ජූලි මස මහා සභාව සඳහා කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් ඉදිරිපත් කරන ලද තණකොළ කපන මැෂින් හා සම්බන්ධ ප්‍රශ්න</u>**

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
සභාව සතුව තණකොළ කපන මැෂින් කීයක් තියෙනවා ද?

**අරුණ බුද්ධික ජිනදාස මහතා**
සියලුම මැෂින් 11යි.
ප්‍රධාන කාර්යාලයේ 6න් 3යි වැඩ
යටදොළවත්තේ මැෂින් 3න් 1යි වැඩ .
වැලිපැන්න මැෂින් 2න් 1යි වැඩ .
ඒ අනුව ඔක්කොම මැෂින් 5යි වැඩ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
ගල්මත්තේ ඔක්කෝම කැඩිලා.එකක්වත් වැඩ නෑ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම දන්න විදියට ගල්මත්තේ දෙකක් වැඩ. මම මගේ පෞද්ගලික මැෂින් එකකුත් දීලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් මේ කියනවා මැෂින් එක තියෙනවාලු.ඒක ස්ටාට් වෙනවා.ඒත් මේකේ පුලිය කැඩිලාලු.පුලිය කැඩිලා නිසා තණකොළ කපන්න බැරිලු.මේවා පැහැදිලිව නිලධාරීන්ට කියා දෙන්න. තණකොළ කපන්න බැරි නම් මැෂින් එක කැඩිලා තමයි.පුලිය කැඩුනාම තණකොළ කපන්න බෑනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ නෑ. මේ පුලිය ගහගන්න පෙටි කෑෂ් එකෙන් පුළුවන්ලු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභාපතිතුමා නිකන් මේවා නිවැරදි කරන්න හදන්න එපා.මේවා නිවැරදි කරන්න බෑ.දැන් මැෂින් එක කැඩිලා.එක මැෂින් එකයි වැඩ කරන්නේ.කෙටියෙන් ඔච්චරයි.මේක තණකොළ කැපෙන වැඩේ කෙරෙන්නේ නෑනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
අපි මේ අවුරුද්දට පෙර අවුරුද්දේ එකත් ඉල්ලා ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
ඔය කියන ඔක්කොම හදනවාට වඩා හොඳයි මේවා සේරම අලුතින් ගන්න එක.හැමදාම කැඩුනාම හදන්න යන වියදම එක්ක බැලුවහම ඒක හොඳයි.මෙතන 2021.08.09 යන්ත්‍ර 3ක් අළුත්වැඩියා කරලා තියෙනවා.-රු.50 603.98ක්.ආපසු ස්ටීල් යන්ත්‍රයක් අළුත්වැඩියා කරලා තියෙනවා 2021.11.29 - රු.29 411.94 යි.ආපසු ස්ටීල් යන්ත්‍රයක් අළුත්වැඩියා කරලා තියෙනවා 2022.01.28 මේ යන්ත්‍ර 5 තියෙන යන්ත්‍ර 5මද?නැතිනම් එකක් අළුත්වැඩියා කරලා මාසෙකින් දෙකකින් නැවත අළුත්වැඩියා කරන්න විදිහක් නෑනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒක දැනගන්න ඕන. මෙහෙන් ලියලා භාර දෙන දිනේයි එහෙන් එන දිනේයි එක්ක බලන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
ඔව්.යන්ත්‍ර 5ම අලුත්වැඩියා කරලා තියෙනවා.මේ විදිහට මීට පෙර අළුත්වැඩියා කරපු 2021.07.01 සිට 2022.06.30 වෙනකන් අපි ඉල්ලලා තියෙන්නේ.ඊට පෙර අවුරුද්දත් අපි ඉල්ලනවා මේක දැනගන්න.නැත්නම් එකම යන්ත්‍රය ලොකු මුදලක් වියදම් කරලා අලුත්වැඩියා කරනවා නම් ඒක සභාවේ පවතින අඩුවක්නේ.ඒක නිසා පෙර වර්ෂයේ අලූත්වැඩියා සඳහා ගිය වියදම් ලබන සභාවට ඉදිරිපත් කරන්න.

<u>වාහන රක්ෂණ මිල ගණන් සභාවට ඉදිරිපත් කිරීම.</u>

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වාහන රක්ෂණය කරන්න මෙපමණ කල් කළේ රක්ෂණ සංස්ථාවෙන්.ඒකේ නියෝජිතයෙක් යටදොළ ප්‍රදේශයේ ඉන්නවා.ඒ අයගෙන් සභාවට යෝජනාවක් ආවා. දැන් මිළ ගණන් වැඩි වෙලා තියෙන්නේ.එ නිසා දැන් ආයතන දෙක තුනකින් රක්ෂණ මිල ගණන් ලැබිලා තියෙනවා.ඒක ගැන සාකච්ඡා කරන්න. (බිල ඉදිරිපත් කරන්න.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
මොනවද ඒ ආයතන?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ මිළ ගණන් ඇවිල්ලා තියෙන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන්,එම්.බී.එස්.එල් සහ සණස බැංකුවෙන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
මේ අඩු එක බලලා අඩු රක්ෂණ සමාගමට දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අඩු එකට නෙමෙයි, ප්‍රතිලාභ වැඩිපුර තියෙන එකට දෙන්න.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
දැන් ඕක ලියුමක් ඇරලද රක්ෂණ සමාගමෙන් ගත්තේ?නැතිනම් නියෝජිතවරයෙක් හරහා ද?

**අරුණ බුද්ධික ජිනදාස මහතා**
නියෝජිතවරයෙක් හරහා නෙමෙයි,සෘජුවමයි ගත්තේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
නියෝජිතවරයෙක් හරහා නොගෙන සෘජු ව ගත්තා නම් ඕක ඕන එකකට දෙන්න.ප්‍රශ්නයක් නැහැ.බලලා දෙන්න.හැබැයි නියෝජිතවරයෙක් හරහා දුන්නොත් මම විරුද්ධයි.දැන් ගියපාර කරපු වැඩේ නීති විරෝධියි.නියෝජිතයෙක් හරහා දෙන්න බැහැ.ගාණ වැඩි වුණත් අඩු වුනත් දෙන්න බැහැ. රජයේ සල්ලි නියෝජිත කෙනෙක් හරහා දෙන්නේ කොහොමද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මේක ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට දෙන්න ද තීරණය වෙන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
ඕක මුදල් කමිටුව කරන්න ඕන වැඩක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැනට රක්ෂණ නැද්ද මේ වාහනවල?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් මේ සැප්තැම්බර් ඉවර වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මට ලැබිලා තියෙන තොරතුරු අනුව ජේ.සී.බී. යන්ත්‍රයකයි,බොබ්කැට් එකකයි දැනට ඉන්ෂුවරන්ස් නැතුව තමයි දුවන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් මේ මාසයේ ඉවරයි. මේගොල්ලෝ මට මේක ඉදිරිපත් කළා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ මාසයේ නෙමෙයි.මේ ගිය මාසයේ හරි ඊට පෙර මාසයේ හරි දැන් මාස තුනක් වෙනවා ඉවරවෙලා.එතකොට මේක රක්ෂණය නැතුව දුවන්නේ කොහොමද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
එක ජේ.සී.බී. යන්ත්‍රයක් මාස තුනක් පහුවෙලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒක තමයි මම කිව්වේ.මේ වාහන රක්ෂණයක් නැතුව පාරේ දුවන්නේ කොහොමද?මේවා රජයේ වාහන.කාට හරි අනතුරක් එහෙම වුණොත් කවුද මේවට වග කියන්නේ? හරියට බැලුවොත් වාහන රක්ෂණයක් නැතුව පාරේ දුවන්න බැහැ.

**ගරු  උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දාන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
ඕක මුදල් කමිටුවට දාන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ  මුණසිංහ මහතා**
නෑ සභාපතිතුමා,මම මේ නොදන්න දෙයක් අහන්නේ.දැන් අපිත් වාහන දුවනවා.අපේ රක්ෂණය අපි අද කළාම ලබන අවුරුද්දේ මේ දවල් 12ට රක්ෂණය ගැහුවොත් එහෙම ඊළඟ අවුරුද්දේ දවල් 12 යි තත්පර ගාණට අපේ රක්ෂණේ ඉවර වෙනවානේ. එතකොට නැවත වාරයක් මිළ ගණන් කැඳවන්න හේතුව මොකක් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මිල ගණන් වැඩියි කියලා තමයි මිල ගණන් කැඳෙව්වේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා ම  කළාම ඒක වැඩි වුණත් ඒක රජයේ ආයතනයක්. එතකොට අපට ඒකට ඒ ආයතනය තුළ වගකීමක් තියෙනවානේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට ම දෙන්න. අනිත් ඒවාට දෙන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
පෞද්ගලික වුණත් ප්‍රශ්නයක් නැහැ.ඉතින් අපි මොකටද එහෙම දෙන්නේ. රජයේ ආයතනයකට දුන්නාම ඉවරයිනේ. හරි ඉතින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට කතා කරලා මේක කලාම ඉවරයිනේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
නෑ හරි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට දුන්නා.වැඩේ ඉවරයිනේ.

<u>ජේ.සී.බී.යන්ත්‍ර පිළිබඳ ප්‍රශ්නය</u>

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඊළඟ ප්‍රශ්නය තමයි ජේ.සී.බී.යන්ත්‍රයක් තියෙනවා.එකක් ගරාජ් එකේ.ට්‍රාන්ස්මිෂන් පද්ධතිය සහ ගියර් පද්ධතියේ අළුත්වැඩියාව සඳහා සෙනොක් එකේ ඇස්තමේන්තුව රු.1 000,000.00ක් කිව්වා.නමුත් අපි වෙන කෙනෙකුට ලක්ෂ 500000.00ට භාර දීලා තියෙනවා හදන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ  දොන් අතුල මහතා**
කාටද ඒක හදන්න දීලා තියෙන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
යටදොළ  ප්‍රදේශයේ කෙනෙක්ට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
නෑ නෑ. ඒ වගකීම ගත්තේ මමයි.ඒක කතා කරන්න දෙයක් නෑනේ. ඒක හෙට නෙමේ අනිද්දා දිනේදී හයි කරන්න පුළුවන්.දැන් හයි කරලා තියෙන්නේ.ඒකේ පොඩි කෑල්ලක් නැතිවෙලා.(හබ් එකක්)ඒ හබ් එක මෙහෙ ගන්න තිබුණේ නැහැ.සෙනොක් එකට කතා කරලා එහේ තිබුණෙත් නැහැ.දැන් ඒක ගෙනල්ලා තියෙන්නේ.ඒක හෙට නැත්නම් අනිද්දා හයි කරලා දෙයි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඊළඟට අනිත් එකේ අලුත්වැඩියාවක් ඇවිත් තියෙනවා.ඒක මේ නිලධාරීන් මට ඉදිරිපත් කරලා රු.65000.00 පමණ යනවා කිව්වා.මේකේ දෙපැත්තෙන් පාස්සන්න තියෙන්නේ.අරුණ මහත්තයා කියන්න මේක ගැන.

**ගරු  උප සභාපති ලලිත් රණසිංහ මහතා**
නෑ ඔයාම කියන්න. ඇහෙන්නේ නෑ නැත්නම්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේකේ පිටිපස්සේ ආර්ම් එක කැඩිල තියෙන්නේ.ඒක රු.65 000.00ට බිල අරන් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ කියන්නේ මේක අළුතින් හදන්න ද?නැතිනම් දත් ටික දාලා හදන්න ද?අර ඉරිලා තිබුණ ආර්ම් එකනේ. ඒ වගේ මුදලක් යනවා වැඩේට.වැඩේ කරන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් මේ බිල ගත්තට මන්ත්‍රීවරුන්ගේ මතවාද තියෙනවා ද?. ඒක නිරවුල් කරගන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
හරි,රු.65 000.00සාධාරණ යි.ඒක ලොකු වැඩක්.අපට පේන්නේ නැති වැඩ ප්‍රමාණයක් මේක ඇතුලේ තියෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඊළඟට "සෙනොක්" එකේ බිලක් ගැන මේ මන්ත්‍රීතුමා ඇහුවා.ඒ බිල ගැන කියන්න.නෑ මේ තව ලොකු ප්‍රශ්න දෙක තුනක්  තියෙනවා.මම මේක ඉක්මනට ඉවර කලේ අනිත් අය දන්නේ නෑනේ මේක.
(බිළ ඉදිරිපත් කරන ලදී.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක ගෙවලාද තියෙන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව්.ගෙවලා තියෙන්නේ.රු.42,000.00ක් යටදොළට දීපු මැෂින් එක මෙහෙට ට්‍රාන්සර් කරගත්තා.මෙහෙයුම් වියදම් රු.42 000.00 ගෙව්වාම තමයි දුන්නේ. ඒක සභාවේ අනුමත කරලා ගෙව්වේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
හරි ඉතින් දැන් ඒකට කරන්න දෙයක් නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මන්ත්‍රීතුමියට මළ ගෙදරක යන්න තියෙනවා. ඒ නිසා කාරක සභාව දැනට අවසන් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**
කිතුලහේන කොමිටියවත්ත ප්‍රජා ශාලාව කෙලවර වල් බිහි වී ඇති කොටසේ තාවකාලික භෝගයන් වගා කිරීමට අවසර ලබා ගැනීම සඳහා කිතුලහේන ප්‍රදීප් ප්‍රජා සුභ සාධක සංගමය විසින් අවසරයක් ඉල්ලා තියෙනවා.
මේ තඹරටිය ග්‍රාම නිලධාරී වසමට තියෙන විශාල භූමි භාගයක් සහිත කොමිටියවත්ත පෙර පාසල් පිට්ටනිය නිරවුල් කරලා වැට ගහලා සකස් කරන්න කියන යෝජනාව මගෙන් මුල් කාලේ ආපු යෝජනාවක්.නමුත් අද වෙනතුරුත් එම යෝජනාව ක්‍රියාත්මක වුණේ නැහැ.
අද වෙන කොට ප්‍රදේශවාසීන් විශාල අර්බුදයකට මුහුණ දී තියෙනවා.යම්කිසි පිරිසක් මේ පිට්ටනිය මැද්දෙන් පාරවල් දෙකක් හදාගෙන ගෙවල්වලට යන්න සකස් කරගෙන තියෙනවා.ඊට අමතරව එතන නොයෙක් මත්ද්‍රව්‍ය ජාවාරම් වෙනවා කියලා ප්‍රාදේශවාසීන් ප්‍රකාශ කරනවා.පස් දාලා ඒ පිට්ටනියේ පාර සම්පූර්ණයෙන් ම විනාශ වෙලා තියෙන්නේ.දැන් කොමිටියවත්ත ප්‍රජා ශාලාව තමයි අපි පෙර පාසලට අරන් තියෙන්නේ.අද වෙනකොට ඒකත් අබලන් වෙලා තියෙන්නේ.ගමේ මිනිසුන්ට රැස්වීම් තියන්න මේ ප්‍රජා ශාලාව දෙන්න වෙලා තියෙන්නේ.ඒකෙත් දැල් දිරාපත් වෙලා ආරක්ෂාව නැති වෙලා තියෙන්නේ.ප්‍රදීප් ප්‍රජා සුභ සාධන සමිති ගොඩනැගිල්ලේ යි පවත්වන්නේ.ඒ නිලධාරින් සහ සාමාජිකයන් මේ ඉල්ලීම කරනවා. ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම් වගා කිරීමට දෙනවා කියන පදනම මතයි මේ අය මේ ඉල්ලීම කරන්නේ.
මේ පිළිබඳ අවධානය යොමු කර කඩිනමින් මේ ප්‍රජා ශාලා පිට්ටනි භූමිය නිරවුල් කර වැට මායිම් සකස් කරන්න.නැතිනම් ලොකු අර්බුදයක් වෙනවා.මේ ඉල්ලීම සලකා බලා හැකි නම් ඒ අයට අවස්ථාවක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒක ලොකු ඉඩම් ප්‍රමාණයක්.දැනට ලියනාරච්චි ක්‍රීඩා පිටියෙන් පස්සේ සභාව සතු ලොකු ඉඩමකට තියෙන්නේ ඕක.ආපසු ක්‍රීඩා පිටියක් හදන්න හෝ වෙනත් ඉදි කිරීමක් සඳහා තියෙන්නේ ඔය ඉඩම පමණයි.මේක දෙනවා නම් කොපමණ කාල සීමාවකටද දෙන්නේ කියලා බලන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වගා කරන්න අවසරය දෙන්න පුළුවන්.වැට මායිම් තීරණය කරන්න තාක්ෂණ නිලධාරියෙකු යවන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක අවුරුද්දකට වගේ අඩු කාල කාලසීමාවකට දින කාල සීමා එක්ක අතුරු බෝග වලට දෙන්න.වෙන භෝගයකට අවසර දුන්නොත් මේ ඉඩම කවදහරි දවසක සංවර්ධන කටයුත්තකට යැමේදී ඒක මේ සභාවට කරන අසාධාරණයක්.සමිතිවලට දුන්නට පස්සේ සමිතිවලින් වෙන වෙන

දේවල් කරන්නේ.ඒ නිසා මේක ලිඛිත අවසරයක් මත ගිවිසුමක් ඇතුව දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

කොහොමත් එතන ක්‍රීඩාපිටියට හානියක් වෙන්න නෙමේ.පහල තියනවා බැවුම් සහිත ප්‍රදේශයක්.ඒක දැන් කුණු දාලා ගොඩ වෙලා තියෙන්නේ.ඒ ප්‍රදේශයයි මේ ඉල්ලන්නේ. කොහොමත් මේක ගිවිසුමකට යටත් කරලා දෙන්න.නැතිනම් ගන්න ගියාම ප්‍රශ්න වෙනවා.ඒ නිසා තමයි මම කිව්වේ භූමිය නිරවුල් කරන්න සලකා බලන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මේ පාරක් කියලා නිකන් තාර දාලා නෙමෙයිනේ.කෙනෙක් එතනින් ගියා කියලා ප්‍රශ්නයක් වෙන්නේ නැනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**

පොඩි ඉල්ලීමක් තියෙනවා.අපේ ධූර කාලය තව ටික දවසකින් ඉවර වෙනවා.ආයෙ කවුරුන් මෙහි සභාවට එයිද අපි දන්නේ නෑ. ඒ වෙනකොට ඔය ලිපිය ගහන ගිවිසුම අස්ථානගත නොකර අනිවාර්යයෙන් තියෙන්න ඕනා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් ඒ ප්‍රශ්නය ඒ විදිහට කරමු.නැත්නම් කාලය යනවානේ.

දැන් නැවත කාරක සභා අවස්ථාවක් යන්නේ.

**<u>ඉම්රිච් ආයතනය සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කළ ප්‍රශ්න</u>**

(පිළිතුරු පෞද්ගලික ව ලබා දී ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

දැන් මේ ප්‍රශ්නවලට උත්තර අපි හැමෝටම අතට ලැබිලා තියෙන නිසා ඒක ගැන කෙළින්ම කතා කරමුද?නැත්නම් ආයෙත් ප්‍රශ්න කියව කියවා ඉන්න ගියාම වෙලාව යනවානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

නෑ.මට ප්‍රශ්නයක් නැහැ.ඇත්තටම මේ කඩේ කරන පිරිස එක්කවත් පෞද්ගලික ප්‍රශ්නයක් අපට නැහැ.මෙතන අපි පෙන්නලා තියෙන්නේ සභාවට වූ අලාභ හානියක් පිළිබඳව පමණයි.ඇත්තටම ඒ මනුස්සයාව අමාරුවේ දැම්ම එකට මේ සභාවේ නිලධාරිනුත් වගකියන්න ඕනා.ඇත්තටම පව් ඒ කෙනා.ඒ මනුස්සයව හිර කරලා දැන් ලක්ෂ විසි ගාණක් ගන්න යන එකත් සාධාරණ නැහැ.මම ඒ මතයට එන්නේ නෑ. මානුෂීය වෙන්න ඕන අපි.නමුත් මෙතන මේ සභාවට වෙලා තියෙන අලාභ හානිය පිළිබඳව කවුද වගකියන්නේ? මම මේ ප්‍රශ්ණාවලිය යොමු කළේ ඒ පුද්ගලයාට හානියක් කරන්න නෙමෙයි.දැන් මම කෙලින්ම අහන්නේ මේකට වගකියන්නේ සභාපතිතුමා ද?ලේකම්තුමිය ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

කලින් අවස්ථාවක මම මේ "ඉම්රිච් "කියන නම නොකියා මේ ප්‍රශ්නයම ඇහුවා.අද පුබුදු මන්ත්‍රිතුමා මේ ප්‍රශ්නය අහලා තියෙනවා.මම ඇහුවා සභාවේ ඇතැම් නිලධාරීන් එතනට ගිහින් කාලා එනවා. ඇතැම් විට අපට ගේන කෑම එක පවා එතැනින්ද ගෙනාවේ දන්නේ නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මේ ප්‍රශ්නය ඇතුළේ අපට වෙනම කාරණාවක් තියෙනවා.මේ යෝජනාව ගෙනත් තියෙන්නේ මම.මම 187 වන වගන්තිය යටතේ මේක ගෙනත් තියෙන්නේ. මේ වගන්තියේ කියනවා මේ සභාවට ඕනෑම අවස්ථාවක රුපියල් 50.00ට අඩු ඕන මුදලක් කොමසාරිස් දැනුවත් කරලා අත හරින්න පුළුවන් කියලා.මුළු පිරිසකටම කොවිඩ් කාලයේදී මාසික කුලිය සම්බන්ධ ව යි ඒ දැම්මේ.මාසික කුලිය තමයි මේ රු.90 000.00ක් වෙලා තියෙන්නේ.දැනට එන්න තියෙන අඩු මුදල් ටික අයකර අයකරගැනීම සභාවේ වගකීම.ඒක කරන්න ඕන.හැබැයි දැන් විශාල මුදලක් වෙලා තියෙනවනේ.අපි ඕකෙන් කහට එකක්වත් බොන්නේ නැති මිනිස්සු.අපි එයාට කළේ අපේ යුතුකම.එනිසා මේ රු.90 000.00ක් වශයෙන් වූ වාරික එකතු වෙලා ලක්ෂ විසි ගානක් ඇවිත්. දැන් මේ සේරම එකපාර ගෙවන්න බෑ.දැන් මේක කොටස් වශයෙන් හෝ ගෙවන්න වෙයි .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

දැන් මේක කොටස් වශයෙන් ගෙවන එක නෙමේ ගැටලුව.මෙච්චර මුදලක් සභාවට අහිමි කළේ ඇයි?කවුද මේ සල්ලි එකතු නොකළේ?දැන් මේ රු.90 000.00 ගාණේ සල්ලි එකතු නොකර 2020 ඉඳන් 2021,2022 වෙනකන් ඉන්නවා.එතකොට ලක්ෂ විසි ගාණට වැඩියි.එතකොට මේ සභාවෙන් ඒ නිලධාරීන් ගෙන්නලා අහන්න ඇයි මේ සල්ලි එකතු නොකළේ කියලා?ඇයි මේක එකතු කරන්න නොගියේ?මෙතන ඒ මනුස්සයාගේ ප්‍රශ්නයක් නෙමේ තියෙන්නේ.ඒ මනුස්සයාව අමාරුවේ දාලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

ඇත්තටම ඒ මනුස්සයා පව්.ඒ මනුස්සයාව විනාශ කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මාසෙන් මාසේ මේකේ සල්ලි එකතු කරා නම් මෙච්චර ලොකු මුදලක් එකතු වෙන්නේ නෑනේ. ගෙවන්න බැරි නම් ඒ මනුස්සයා කියනවා මට මෙච්චර ගෙවන්න බෑ,මේක අඩු කරලා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

දැන් මේ එකතු කරලා නැති එකේ වගකීම බාරගන්නේ කවුද?

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

දැන් මේකේ මාස ගාණක් යනකොට නිලධාරීන් කියන්න එපැයි මේක මාස ගාණක් ගෙවලා නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

දැන් ඔබතුමියට එහෙම සල්ලි ගෙවලා නෑ කියලා කිව්වද නිලධාරීන්?

**ගරු ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**

2021 වෙනකම් ලියුම් දාලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**

ලියුම් දාලා නෙමෙයි මං අහන්නේ කිව්වද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මේකේ එතකොට තව ප්‍රශ්නයක් තියෙනවා. මේකේ අවුරුදු දෙකක් තිස්සේ නොගෙවා ඉන්නකොට ඕගොල්ලෝ ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද?ඉම්රිච් එක අතහරින්නකෝ.කවුරුහරි කඩ බදු හරි

ගෙවන්නේ නැතුව ඉන්නකොට ඕගොල්ලෝ ඒක අත්පත් කරගන්න යනවනේ.කොච්චර කාලෙකට පස්සේද අත්පත් කරගන්නේ?

**ගරු ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
දින හතක් නොගෙව්වොත් රතු නිවේදන බෙදනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට අවුරුදු දෙකක් යනකම් මොකක්ද මේ කළේ?මේ වගේ මිනිස්සුන්ව අමාරුවේ දාන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අපි මේක කාරක සභාවක් කැඳවලා ඒ නිලධාරියා ගෙන්නලා එයාලට කතා කරලා අහමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
හැමදාම මේ වැඩේනේ වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ සල්ලි එකතු කළේ නැත්තේ ඇයි කියලා අහන්න අපට ඒ ෆයිල් එකත් එක්ක ඒ නිළධාරියාව මෙතනට ගේන්න.මේ සභාවට ලක්ෂ විස්සක් අහිමි කරලා තියෙන්නේ. කවුද වගකියන්නේ මේ හැමදේටම.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
බදු ගත්ත එක්කෙනාගේ කාලේ ඉවර වෙනකන් ඉඳලා එයාගෙ බදු ගෙවීම් අවසන් කළා. අවසන් කළා ම මෙයා ඉන්නවා.මෙයාව එළියට දාන්න බැනේ.එයාට දුන්නා සභා තීරණයක්.පස්සේ මෙයා වැලිවේෂන් එක අඩු කරලා දෙන්න ඉල්ලුවා.අඩු වුණේ නැහැ,රු.10 000.00 අඩු වෙලා තියෙන්නේ.එතකොට දැන් රු.90 000.00ටයි ගණනය කරලා තියෙන්නේ.සහන ලැබුණේ නැහැ එතනින්.එ නිසා මෙයා නැවත ඉහළින් සහන ඉල්ලුවා.මෙයා ඒක බලාපොරොත්තුවෙන් ගෙවන් නැති වෙන්න පුළුවන්.නමුත් මාස 21 මුදල මුලින් අය කරගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
එයා අතුරු බදු කරුවෙක් ලෙස ඉන්නකොට ඒ අදාල බදුකරුට එයා රු.1 60 000.00 ද කොහෙද ගෙව්වා. රු.1 60 000.00ක් ගෙව්ව කෙනාට මේ රු.90 000.00 ගෙවන්න බැරි වෙන්න විදිහක් නෑ.එතනයි ගැටළුව තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව් රු.1,60 000.00ගන්නවා.එයාට ගෙවන්න බැරි කමක් වෙන්න බෑ.නිකන්ම කඩ කරන්නත් බැනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
ලිඛිතව මේ ගැටලුව පිළිබඳව කීයක් ලියුම් දැම්මාද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේකේ මුදල් අය කරගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
දැන් සභාපතිතුමා ඕකට ගන්න ක්‍රියාමාර්ග මොකක්ද?

**ආර්.අයි.සුනිල් මහතා**
දැන් 2020 ඉඳන් ඇරියස් එක තියෙන්නේ.ආපන ශාලා සියල්ල කොවිඩ් නිසා වැහුවා.එ නිසා මේ වාර්තාව අපට මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් ගන්න වෙන්නේ කවදා ඉඳන් ද මේ ආපන ශාලා අරින්න දුන්නේ කියලා.ඒ අනුව හිඟ මුදල ගන්න ඕන.නැත්නම් කඩේ සීල් කරලා නඩු දාන්න ඕන.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඇයි ඔබතුමා මෙච්චර දවසක් මාස විසි එකක්(21) වෙනකම් මේක නොකිව්වේ?ඇයි නීතිමය ක්‍රියාමාර්ගයක් නොගත්තේ?මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් මේ වන තෙක් මේ වාර්තාව නොගත්තේ ඇයි?

**ආර්.අයි. සුනිල් මහතා**
මට සභාවෙන් සීල් කරන්න අවසර දුන්නේ නෑ,බලයක් පැවරුවේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔයා සභාව දැනුවත් කරාද?

**ආර්.අයි.සුනිල් මහතා**
ලිඛිතව දැනුවත් කලේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට කාවද දැනුවත් කලේ?

**ආර්.අයි.සුනිල් මහතා**
මම කඩේ කරන කෙනාට කිව්වා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
නෑ.සභාවේ කාවද දැනුවත් කලේ?

**ආර්.අයි.සුනිල් මහතා**
සභාවේ ඒ විෂය කරන නිලධාරීන්ට දැනුම් දුන්නා.මෙම විෂය යටතේ නිලධාරීන් තුනක් මාරු වුණා . සමීර මහත්තයා හිටියා.අරුණ මහත්තයා හිටියා.සීතා මිස් හිටියා. දැන් ඉන්නේ ප්‍රීතිකා මිස්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ කියන්නේ 2020න් පස්සේ විෂය තුන්දෙනෙකුට මාරු වුණා ද?හරි,නිලධාරීන් මාරු වුණා කියලා ඒක සමාවට කරුණක් නෙමෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
තනිකරම මුල ඉඳන්ම මේ හැම මුදල් ප්‍රශ්නයකටම ඔබතුමාගේ වංචාව මෙතන තිබුණේ.ලක්ෂ ගණනක් පාඩු වුණා.

**ආර්.අයි.සුනිල් මහතා**
මට ඒ අදාළ බලය දුන්නේ නැහැ සභාවෙන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් මෙයාව මාරුවක් කරන්න කියලා කොමසාරිස්තුමිය කියලා ගියා.මේ ලිපිය ගහලා නැද්ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
දැන් මේ සභාවට නිලධාරීන් එකතුවෙලා කෝටි ගණනක් පාඩු කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
දැන් ඔබතුමා කටින්ද රාජකාරිය කරන්නේ? ඔබතුමා දැනුම්දීමක් ලිඛිතව කරලා ම නැද්ද?

**ආර්.අයි.සුනිල් මහතා**
මම මේ විෂය කරන කෙනාට ඇවිත් කිව්වා.මට ඒ සීල් කරන්න අවශ්‍ය බලය දීල නැහැ.මාසික කුලිය මෙහාටනේ ගෙවන්නේ.මාව දැනුවත් කරලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන  ජයසේකර මහතා**
මේ අවුරුදු දෙකටම ඉල්ලීමක්  කරලාම නැද්ද බදු ගෙවන්න කියලා?

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
දැන් ඕකෙන් වුනේ ඔබතුමා අමාරුවේ වැටුන එක විතරයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන්  හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් දිගින් දිගටම මොන ප්‍රශ්නය ගත්තත් මේ හැමදේකටම මූල්‍යමය ගනුදෙණුවක් තිබුනොත් එතන මොකක් හරි ම වංචාවක් වෙලා.මේවාට තීන්දු තීරණ ගන්න.මේ මිනිස්සුන්ගේ බදු මුදල්වලින් මේ දේවල් කරන්නේ.මේවා අයතා ලෙස ගනුදෙණු කරන්න දෙන්න එපා.මේක අපි කාගෙවත් ආයතනයක් නෙමෙයි,රජයේ ආයතනයක්.දැන් මේ අනිත් කඩවලින් කොරෝනා කියලා බදු අයකරගෙන නැද්ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
කඩ 100ක් තියෙනවා නම් එකකට විතරක් විශේෂයක් වෙන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
මේක ඇත්තමයි මේ විදිහට යන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් මේ සම්බන්ධයෙන් සභාපතිතුමා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක අයකරගන්න ක්‍රියාත්මක වෙන්න.අය කරගන්න නිවේදනය යවලා මෙයාට සාධාරණ කාලයක් දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
බැහැ,සභාපතිතුමා.ඔතනට නෙමේ අපට එන්න ඕන.අපට මුලින්ම මේ ලියුම්  දීලා තියෙනවා නම්,ලියුම් අරන් තියෙනවා නම් වාර්තාවක් දෙන්න. ඒ මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කර ගන්නැතුව ඉඳලා එකපාර ගෙවන්න කියලා මේ මිනිස්සුන්ව අමාරුවේ දාන්න එපා.මොකක්ද මේ  වැඩේ තේරුම?ඒ මනුස්සයා අසරණ මනුස්සයෙක්.දැන් මේ මනුස්සයාව අමාරුවේ දාන තැනට එන්න එපා.

**ගරු සභාපති මෙරිල්  මුණසිංහ මහතා**
දැන් මේක කොහොමද අය කර ගන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අය කරගන්න දැන් මේ මුදල් එකතු නො කළ අයගෙන්.මුලින්ම මේ අයට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මම ගියාම කිව්වා කොමසාරිස්තුමිය හමුවෙන්න ගියා කියලා.මුදල අඩු කරලා දෙන්න කියලා කොමසාරිස්තුමිය කිව්වලු.ඒ අනුව රු.1 60000.00 ක මුදල රු.90 000.00ට අඩු වුණාලු .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
කොමසාරිස්තුමියගේ ඉල්ලීම සභාවට දාලා ඒක මෙතන අනුමත වෙන්න ඕන නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක වෙලා තියෙන්නේ ඒක නෙමෙයි.එක එක නිලධාරීන් ගිහින් තමන්ගේ අවශ්‍යතාව මත මෙතනින් කනවා.කෑම ගන්නවා.ඒක නිසා මේකෙන් ගිහින් මුදල් අය කරගන්න යන්නේ නැහැ.කෑම 20-30 ඒ මනුස්සයාගෙන් ගන්නවා.අරගෙන ඊළඟට සල්ලි එකතු කරන්න යන්න බැහැ. නිලධාරීන් ගිහිනුත් කාලා එනවා.මම වගකීමෙන් කියන්නේ අපි කවුරුවත් ඕකේ තේ එකක්වත් බීලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**
ඒක තමයි මමත් කියන්නේ.ඒ මනුස්සයා අමාරුවේ දාන්න නෙමේ අපට ඕනා.මේක පෙන්නන්න ඕන සභාවේ තියෙන වරද. නිලධාරීන්ගේ පරිපාලනමය දෝෂ. නැතුව අපට ඒ මනුස්සයා එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
රු.1 60 000ක මුදල රු.90 000.00ට අඩු කරන්න අපි සභාවෙන් තීරණයක් අරගෙන නැහැනේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඒ මනුස්සයා එක්ලක්ෂ හැටදාහ ගෙව්වනම් අදත් සල්ලි ගෙවලානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම දැනුවත්ව ඒ මනුස්සයා අන්ත අසරණ වෙලා තියෙන්නේ.ඒ මනුස්සයාට මේ මුදල ගෙවන්න බැහැ.මේක අපෙන් වෙච්ච අසාධාරණයක්.ලක්ෂ විස්සක් එකපාර ගෙවන්න බැහැ.මේක ගොඩ ගහලා තියෙන්නේ. මේ විදිහට කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ විදිහට කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් අපි පියවරක් ගන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
මේකේ තීරණයකට එන්න සභාපතිතුමා.ඔබතුමා කෙලින් තීරණයක් ගන්න.මේක මේ සභාවෙන් අපි කතා කරලා අහනකන් කවුරුවත් තීරණයක් අරගෙන නැනේ.මේ සල්ලි එකතු කරන්න කවුද එපා කිව්වේ?නිලධාරීන්ගේ හිතුමතේටනේ වැඩ කරන්නේ.අපි සභාවේ මේවා කතා කරනකොට අර මිනිස්සු අපි එක්ක තරහ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ ආකාරයෙන් කටයුතු ගොඩක් තියෙනවා. යටදොළවත්තේ ඉඩම් වෙන්දේසියක් තියෙනවා.වැඩ අධිකාරි මහත්තයා යන්න කලින් මම මේ කතා කළේ.ඒ ආශ්‍රිත පුද්ගලයින්ගේ පාරවල්වල ආරවුලක් බව කිව්වා.පරීක්ෂා කළා ම වෙන්දේසිය අත්හිටුවන්න කිව්වා.හැබැයි දැන් ඇළගහවත්ත පාර කපලා වතුර බස්වන්න කාණුවක් හදලා.පස්සේ බලන කොට අර වෙන්දේසියේ තමයි දිගටම වැඩ කරගෙන යන්නේ.අපට දැනුම් දුන්නා වැඩ නවත්තලා තියෙන්නේ කියලා.හැබැයි දිගටම වැඩ කරනවා.ඇළගහවත්ත පාර කපනවා.ඒ තීරණය අපට දැනුම් නොදුන්නේ ඇයි?

(අදහස් ප්‍රකාශ කිරීමේ දී මයික්‍රෝෆෝනය ක්‍රියා කර නොමැති වීම හේතුවෙන් පවසන දෙය පැහැදිලි ව නො වැටහේ.)

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ඕගොල්ලෝ ගත්ත තීරණය කියන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔය ප්‍රශ්නය පිළිබඳව මම ලේකම්තුමිය එක්ක කිහිප වතාවක් ම කතා කළා,මේක නවත්වන්න කියලා.මේ වැඩේ නීත්‍යානුකූල කරලා කරන්න කියන එක මම ලේකම්තුමියට කතා කරලා කිව්වා.කිහිප වතාවක් ඉල්ලුවා.හැබැයි ඊට එහා ගිහින් මම කිව්වාට පස්සේ වැඩ අධිකාරි මහත්තයා එතනට ඇවිත් බැලුවා.වෙන්දේසි ඉඩමේ ඇතුලට යන තැන සපත්තු පාලමකින් වතුර බහින්න අවසර දීලා,හදලා තියෙනවා.මම දන්නේ නැහැ,මට නම් ඇත්තටම පැහැදිලි නැහැ,මොන විදිහට ද මේ අනුමැතිය දෙන්නේ කියන එක.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
"ඉම්රිච්"එකේ ප්‍රශ්නයට හැකි ඉක්මනින් මුදල් අය කරගන්න ක්‍රියාමාර්ග ගන්න.එයාට සහනයක් දෙන්න ඕන.දැන් මේ සභාව කියන්නේ එයාගේ කඩේට සීල් තියන්න නෙමෙයි.එයත් එක්ක කතා කරලා මේ මුදල් ටික අය කරගන්න ක්‍රමයක් සකස් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
සභාපතිතුමා,දැන් රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් නිලධාරීන්ට මොකක්ද කරන්නේ?මේකේ මුදල් ගන්න එපා කියලා මම නම් උපදෙස් දීලා නැහැ. මුදල් අහිමි කිරීමයි මේ තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔතන රාජකාරි පැහැර හැරීමක් වෙලා තියෙන්නේ.ලබන සභාවට කලින් මේ ඉම්රිච් එක සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගෙන් විමර්ශනයක් ඉල්ලන්න. එතකොට මේක පැහැර හැරලද මොකක්ද වෙලා තියෙන්නේ කියලා දැනගන්න පුලුවන්.ලබන සභාවට කලින් අපට ඒ වාර්තාව ලබා දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි විමර්ශනයකට දාමු.අපට ඒ කලින් විමර්ශන ඉල්ලපු ඒවගෙනුත් වාර්තා තාම හමුවුණේ නැහැ.මූලික විමර්ශනයට දාපු දෙකක් තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මොනවාද ඒ දෙක?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මෙහෙමයි ,ලලිත් ඉන්දික සිරිවර්ධන මන්ත්‍රීතුමා සහ තවත් සභාවේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එක්ක එකතු වෙලා ගෙවීම් 5ක් සම්බන්ධයෙන් විමර්ශනයක් ඉල්ලා සිටියා.ඒ පහම විමර්ශන නිලධාරීන් මෙහේ ඇවිත් බලලා සතියක් පරීක්ෂණ කරලා ඉවර වෙලා වාර්තාව අද දෙනවා කියලා තිබුණා.නමුත් අද දෙන්න බැරි වෙලා තියෙනවා.ඒක දවස් තුනක් ඇතුළත මෙහෙට දෙනවා කියලා තියෙන්නේ.ඊට පස්සේ මන්ත්‍රීතුමන්ලා එක්ක කමිටුව මුණගැහුණා.පොහොර ප්‍රශ්නයේ සහ අත්සන් ලේඛන සම්බන්ධ ව මූලික විමර්ශනවලට ඒ දෙකම බාරගත්තා.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
අර වවුවර්වල එකයි,අත්සන්වල එකයි සම්බන්ධ ව මූලික විමර්ශනය දැනට කළා.ඒකේ වාර්තා දෙක තමයි මේ සතියේ දෙන්න තියෙන්නේ. අත්සන් ලේඛන හා සම්බන්ධ එක කොළඹ යැව්වා කියලා කිව්වා.ඒ අතර අපට දැනට ඒ මුදල් අය කරගන්න කිව්වා.දැන් අපි මේ සතියේ අත්සන්වලට අදාළ ව අය කරගන්නවා.කොළඹින් වාර්තාව ආවට පස්සේ ඒකෙනුත් ඒ නිර්දේශය ඉදිරිපත් කරන්නම්. වව්චර් සම්බන්ධ එකේ වාර්තාව නැහැ.මූලික විමර්ශනය සම්බන්ධ ව මේ සතියේ වාර්තාව ලැබෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
කොම්පෝස්ට් අංගනයේ එක?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
කොම්පෝස්ට් එකටයි,කටවුට් එකටයි දෙකටම මේ විමර්ශනය අවසන් වෙලා පස්සේ විමර්ශනය කරයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අර විදුලි බල්බ් මිලදී ගැනීම සම්බන්ධ එකේදි මොකද කිව්වේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒක අපි තවම දැම්මේ නෑ.ඒක අපි කතා කළා විතරයිනේ.ප්‍රශ්නයක් ඇවිත් එතන අපි පනහා බැගින් දෙන්නෙක්ගෙන් මිලදී ගත්තා.50 බැගින් දෙකක් ගන්න එක ම දවසේ යන්න කියන එක මමයි නියෝග කළේ.ඒකත් අපි දානවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක අනිවාර්යෙන් මට වාර්තාවට ඇතුළත් වෙන්න ඕනා.ඒ බල්බ් හා සම්බන්ධ ප්‍රශ්නයේ දී ඒවාට වොරන්ටියක් තිබුණේ නැහැ.ඇත්තටම මට ඒකට තාම උත්තරයක් ලැබුණේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වොරන්ටි ගෙනත් දීලා තියෙනවා දැන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
කොහොමද වොරන්ටි ගෙනත් දුන්න විදිහ මට කියන්න.මොකද එදා දිනේදී පළාත් පාලන කොමසාරිස්තුමිය ඇවිල්ලා ඉද්දි මෙතන කතා කරනකොට වොරන්ටි තිබුණේ නැහැ.එතකොට දැන් අද වොරන්ටියක් තියෙන්නේ කොහොමද?ඒ බල්බ් ටික ඔක්කොම හයි කරලා ඉවරයි.ඒවාගේ සීරියල් අංක කොහොමද දන්නේ?එදා දිනේදි නෑ කිව්ව එක අද දිනයේ දී කොහොමද මේ හයි කරලා තියන බල්බ්වලට වොරන්ටි එන්නේ?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
වොරන්ටි කාඩ් ටික පස්සේ ආවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
වොරන්ටි කාඩ් ටික පස්සේ එන්නේ කොහොමද?මේක පෙට්ටියට දාලා එන්නේ.බල්බ් එකක් ගන්න කොට සීරියල් අංකය එක්ක තමයි වොරන්ටි කාඩ් ටික දාලා තියෙන්නේ.එතකොට ඒ වෙලාවේ කිව්වා"මේකේ වොරන්ටි කාඩ් එකක් තිබුණේ නැහැ,මේ බල්බ් 50ක් තියෙනවා.මේ බල්බ් 50ම එක බිලකට දාලා තියෙනවා.ඒ බල්බ් 50 ටෙන්ඩර් දාපු එකක් විතරයි"කියලා.ඒත් බිලක් තිබුණේ නැහැ. ටෙන්ඩර් කරලා.ටෙන්ඩර් කඩපු එකක් අපට පෙන්නුවේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම ඒ බල්බ් හදිස්සියේ මිලදී ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
හරි සභාපතිතුමා මිලදී ගැනීමේ නෙවෙයි ප්‍රශ්නේ තියෙන්නේ,වොරන්ටි කාඩ් එකේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එදා කිව්වා "අගෝස්තු 08 සිට ටෙන්ඩර් කැඳුවා,ඊට පස්සේ මේ බල්බ් මිලදී ගත්තේ කියලා."මම මේ කියන්නේ කමිටුවක් ඇතුළේ වුණ දෙයක්.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නැහැ,50 පනහා සභාපතිතුමාගේ නියෝගයට මිළ දී ගත්තා කියලා කිව්වේ.ටෙන්ඩර් කැඳුවේ ඊට පස්සේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් ඒ ටෙන්ඩර් කැඳුවේ නැද්ද?ඊට පස්සේ ටෙන්ඩර් කැඳුවද?දැන් මේ මන්ත්‍රීතුමා කියන්නේ ටෙන්ඩර් කැඳුවේ නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**
ටෙන්ඩර් කඩනකොට අපි හිටියේ නැනේ.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නෑ ටෙන්ඩර් දීලා නෙවෙයි.මිළ ගණන් වැඩි වීම විතරනේ තිබුණේ.මිළ ගණන් වැඩි වීම මතනේ ඒක වුණේ.ටෙන්ඩර් කැඳුවේ ඕකට ඉස්සෙල්ලා එකේ.ඔය ගත්ත 50 ඒ වගේ ටෙන්ඩර් කැඳුවේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභාපතිතුමා,ඒ මිල ගණන් සහිත පොත අපට ඉදිරිපත් කරන්න පොඩ්ඩක්.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මීට ඉස්සෙල්ලා හදිසි මිලදී ගැනීම් අරන් තියෙන්නේ කොහෙන්ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ 50 මිළ දී ගැනීම හදිසි මිළ දී ගැනීමක්.ඒක තමයි කිව්වේ මිළදී ගන්න කියලා.වෙනදත් අපි මෙහෙම මිලදී ගැනීම් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
නැහැ,හදිසි මිළ දී ගැනීම් කළාට කමක් නැහැ.මේ ගත්ත බල්බ් එකේ ගාණත් වැඩී.මේක ලූමින් 1600, වොට් 18 එකක්.ඒ බල්බ් එක ඇත්තටම දැනට ම පිච්චිලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් ඔය හදිස්සියේ ගත්ත 50න් මොනවද අලාභ වෙලා තියෙන්නේ?මොනවද පිච්චිලා තියෙන්නේ? ඒවා ප්‍රතික්ෂේප කරලා දාන්න,ආයෙත් බඩු ගන්නේ නැතුව.එච්චරයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
නැහැ,එහෙම නෙවෙයි වෙන්නේ.මම අහන්නේ මේ ගෙදර කරන වැඩ මෙතන කරන්න බෑ.මේ කොහොමද වොරන්ටි නැති බල්බ් එකක් ගත්තේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ පණහක් ගන්න පුලුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
වොරන්ටි නැතුව ගන්න පුලුවන් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වොරන්ටි දීලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
කමිටුව ඇතුළෙදි තිබුණේ නැතුව දැන් කොහෙන් ද වොරන්ටි අරන් එන්නේ? අපට බොරු වොරන්ටි ගේන්න එපා.පෙට්ටිය ගේන්නකෝ මුලින්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
දැන් වොරන්ටි කාඩ් හම්බුනාද?

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
100ක් ගේන්න හොඳේ.වොරන්ටි 50ක් බැහැ.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
100 තැන් දෙකකින් ගත්තේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
බොරු කියන්න එපා මහත්තයා,ටෙන්ඩර් එකෙන් පස්සේ ඔයාලා බොරු දිනයක් දාලා ගත්තේ.මම ඕනේ නම් ඇත්ත කියන්නම්.නිලධාරීතුමා,ඔබතුමා අමාරුවේ වැටෙන්න එපා.සේරම එළිකරන්නද?එපා ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ මිළ ගණන් සහිත පොත පොඩ්ඩක් ගෙන්නන්නකෝ.සභාවෙන් කොහොමද මේ වොරන්ටි නැති බල්බ් ගන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
50ට එහා අරන් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
හරි 50 ගත්ත එක හරි.රු.1650.00ට මේ බල්බ් එක ගන්න සභාපතිතුමා නියෝගයක් දීලා තියෙනවා. එතකොට මේ බල්බ් එක රු.1140.00යි එළියේ.එතකොට රු.1650.00 වැඩි ගාණට ගන්නේ ඇයි?එතකොට මේක වොට් 18.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
නෑ,මේ ලිපියේ තිබුණනේ මේක ගන්න කියලා.ඔයා ඒ අනුව ක්‍රියාත්මක වුණා නේද?

**සැපයුම් නිලධාරී අර්ජුන කිරිඇල්ල මහතා**
ඔව්.මම ඒ අනුව ඔය තැන් දෙකට ඕඩර් එක දාලා තියෙනවා 08.04 වනදා.පිලිප් බල්බ් ගත්ත තැනකින් බිල හමු වුණා.අනිත් බිල හමු වුණේ නැහැ.ඊට පස්සේ බිල ඊයේ ආවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මිළ ගණන් දන්නේ නැතුව බල්බ් අරගෙන පස්සේ අද තමයි බිල දාන්නේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඉතින් ඔයා මේ ලිපිය දැක්කාම සභාපතිතුමාව දැනුවත් කරන්න එපැයි මේක ඔයා අමාරුවේ වැටෙන වැඩක් කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඕක සභා වාර්තාවට අනිවාර්යෙන් ඇතුළත් කරන්න.ලයිට් අරන් මාසෙකට පස්සේ තමයි බිල ගහන්නේ,මිල ගණන් දාන්නේ.මේ සභාවේ නිළධාරීන්,සභාපතිතුමා,ලේකම් මිස් හැමෝම ලයිට් හයි කරලා මාසෙකට පස්සේ තමයි මිල ගණන් දන්නේ,ගාණ කීයද අහන්නේ.එතකොට අද කීයද ගාණ?

**සැපයුම් නිලධාරී අර්ජුන කිරිඇල්ල මහතා**
රු.950.00 ගාණේ දීලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට එයා කිව්වා නම් මේක මාසෙකට පස්සේ රු.2950.00යි කියලා.එතකොටත් ගෙවනව ද?මිළ ගණන් දන්නේ නැතුව බල්බ් එක අරගෙන අද තමයි මිළ ගණන් දන්නේ.අදලු බිල දුන්නේ.එතකොට ඇයි මේ මාසයක්.මේ බිලක් එන්න මාසයක් යනවද?ඕවා කියන්න පොඩි ළමයින්ට.ඕවා ඕගොල්ලෝ ගිහින් හැදුවේ මේ ඊයේ පෙරේදා. දැන් එවේලේ කොමසාරිස්තුමිය ඉන්නකොට ඇහුවාම කිව්වා එක තනි වොරන්ටියකට දීලා මේ බල්බ් 50ම ගත්තේ කියලා.හරි ඔය පෙට්ටියක් ගේන්නකෝ බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
නැහැ,නැහැ.එක වොරන්ටියක් තිබුනේ නෑ ඒ වෙලාවේ.රු.1650.00ට උපරිම මිළකට ගන්න සභාපතිතුමා දීලා තිබුණු ලිපිය විතරයි තිබුණේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔබතුමාලාට මේ නිළධාරීන්ව රවට්ටගෙන ඕවා වහන්න පුලුවන්.ඕවගේ තුට්ටු දෙකේ වැඩ කරන්න එපා.මේ අහිංසක මිනිස්සුන්ගේ මුදල්.ඕගොල්ලෝ ගෙදරින් ගේන ඒවා නෙවෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
මේකේ සභාපතිතුමා මිළදී ගැනීම් කරන පිළිවෙලේ තමයි හැමදාම ප්‍රශ්නේ තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ලක්ෂපාන එකෙනුයි,වැලිමානානේ සුජීව නිර්මාණගේ"නිම්සර සුපර් එකෙනුයි මේ දෙක ගත්තේ හදිසි මිළ දී ගැනීම් යටතේ.මමයි කිව්වේ බල්බ් ගන්න.හෙට යන්න බල්බ් නෑ කිව්වා.දැන් මේක හදන්නත් ඕන.මම කිව්වා පණහ පණහ ගන්න කියලා.''ලක්ෂපාන''එකෙන් ටිකක් ගත්තා.අනිත් එක''පිලිප්'' එකෙන් ගත්තා.පණහ පණහ යටදොළ එක්කෙනෙක්ගෙනුයි වැලිමානානේ එක්කෙනෙක්ගෙනුයි ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඕක ටෙන්ඩර් කරපු පොත ගේන්න බලන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඊට අමතරව මිළ ගණන් කැඳවනකොට ඒ බඩු ආයේ ගන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
ඕකේ දැන් ක්‍රමවේදය තමයි බල්බ් එකක් ගන්නකොට වොරන්ටි එකක් තියෙන්න ඕනි.දැන් කිව්වා රු.1650.00 උපරිම මිළකට යන්න පුලුවන් කියන එක.ඒකත් ප්‍රශ්නයක් නැහැ කියමුකෝ.බල්බ් එකක් ගන්නකොට වොරන්ටියක් ලැබෙනවානේ.වොරන්ටි කාඩ් එකක් නැතුව ගන්න බල්බ්වලට පස්සේ වොරන්ටි දෙන්න බෑනේ.සීරියල් නම්බර් එකක් තියෙනවානේ.එහෙම සීරියල් නම්බර් තියෙනවා නම් අපිට පුලුවන් ගිහින් වෙන බල්බ් එකක් හරි මාරු කරගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**
අර්ජුන මහත්තයා,දැන් ස්ටොක් එකේ බල්බ් කීයක් තියෙනවාද?බල්බ් කුඩු වෙන්නේ නැනේ.බල්බ් 200-500ක් සටොක් එකේ තියාගන්න.

(වොරන්ටි පරීක්ෂා කරන ලදී.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ බල්බ් එකේ සීරියල් නම්බර් එක කොහෙද තියෙන්නේ.මේ පෙට්ටිය පින්එක තියෙන බල්බ්වල පෙට්ටියක්. මේකේ ස්ටිකර් එකක් ගහලා වහලා තියෙන්නේ.මේවා අපට පෙන්නන්න එපා.ගොන්නුන්ට පෙන්නන්න.අපි මී හරක්ද මේවා පිළිගන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඕක දාන්න විමර්ෂණයකට.වරදක් කරලා තියෙනවා නම් අය කරන්න.එච්චරයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
හෝල්ඩර් බල්බ් එකකට පින් බල්බ් එකක එකක් අලවලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
පෙනි පෙනී මේ වංචාවලට අනුබල දෙන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේක අනිවාර්යයෙන් සභා වාර්තාවට දාන්න.ස්ටිකර් එකක් අලවලා ගෙනල්ලා මේ මුළු සභාවම හැල්ලුවට ලක් කරලා,මේ මුලු සභාවම නො මඟ යැවූ බවට වාර්තාවට ඇතුළත් කරන්න.මේ වගේ හොරකම් කරන්න එපා.ඕගොල්ලෝ හොරට ගත්ත හින්දා ඒගොල්ලෝ මේක ඇලෙව්වේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ කියන්න තියෙන දෙයක් කියන්න.මම හොරකම් කරලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභාපතිතුමා,හොරකම් කළත් එකයි.හොරකම් කරන තැන බලන් ඉඳියත් එකයි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔබතුමා කිව්ව තැනකින් තමයි අනිත් බල්බ් 50 මිලදී ගත්තේ.ඒ 50යි මේ 50යි අපි ගත්තේ හදිසි මිළ දී ගැනීම් යටතේ.එතනින් එහාට අපි මිළ දී ගෙන නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මිලදී ගැනීමක් නෙමෙයි අහන්නේ.මේ අපිව බොරුවට ගොනාට අන්දන්නේ ඇයි?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔබතුමන්ලාගේ ඔය ගැන විරෝධතාවයක් තියෙනවා නම් අය කර ගන්න දාන්න.නැත්නම් සල්ලි නොගෙවා ඉන්න.

**ගරු උපසභාපති ලලිත් රණසිංහ මහතා**
අනිත් එකට යන්න. මේවා සභාගත වෙලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමි**
මම මේ දන්නැති නිසා අහන්නේ,කාරක සභාව වුණත් මේ වැඩ කරන නිලධාරීන් මන්ත්‍රීවරු ඉස්සරහට ගෙනත් අපට ප්‍රශ්න කරන්න අයිතියක් තියෙනවා ද?මේ සභාවේ එහෙම බලතල තියෙනවාලු.ඒකෙන් නිලධාරීන් සහ මන්ත්‍රීවරු අතර ලොකු ගර්ශනයක් ඇති වෙලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
කාරක සභාවෙදි නිලධාරීන් ගෙන්නලා ප්‍රශ්න කරන්න පුලුවන්.කාරක සභාවක් තියෙන්නේ ඒකට තමා.නිලධාරීන්ට වාචිකව කරුණු දෙන්න තමයි ඒක තියෙන්නේ.මේ වගේ ප්‍රශ්න වෙන එක ගැනයි හාමුදුරුවෝ මේ අහන්නේ.මට නම් ඕන දෙයක්.නිලධාරීන් එක්ක තරහා තියාගන්න එපා.වැඩකරන ක්‍රමය හදාගන්න.

දැන් ඊළඟ ප්‍රශ්න දෙකට යනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න-**</u>
(පිළිතුරු පෞද්ගලික ව ලබා දී ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මට ඒ ප්‍රශ්න ටිකට උත්තර ලැබුණා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
වංචනිකව අත්සන් යෙදීමේ ප්‍රශ්නයේ තොරතුරු ටික තියෙනවා.ඒකත් සාකච්ඡා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සාකච්ඡාවක් නම් අවශ්‍ය නෑ මට.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ.කරුණු දක්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මට දැනගන්න ඕන ප්‍රධාන කළමනාකරණ සහකාර කියලා තනතුරක් තියෙනවානේ.එම තනතුර යටතේද අභ්‍යන්තර විගණන නිළධාරී කියන තනතුර තියෙන්නේ?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
එය ස්වාධීන තනතුරක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒක සභාවේ ස්වාධීන තනතුරක්ද,ස්වාධීන තනතුරක් කියන්නේ ඇයි?මේ ඉන්න ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුරට යටත්ව නෙවෙයි ද අභ්‍යන්තර විගණන නිළධාරීන් ඉන්නේ.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
සභාපතිතුමාට තමයි වග කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභාපතිතුමාට වග කියන කතාවක් නෙමෙයි මම අහන්නේ,අභ්‍යන්තර විගණන නිළධාරී කෙනෙක් ඉන්නවා නම් ඒ කෙනා ඉන්නේ ප්‍රධාන කළමනාකරණ සහකාර යටතේ නෙවෙයිද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් ඔබතුමිය වැඩබලන ලේකම්වරියක් ද?ලේකම්වරියක් ද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
වැඩබලන ලේකම්වරියක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔබතුමියගේ සීල් එකේ ඇයි එහෙනම් ලේකම් කියන තනතුර දාලා තියෙන්නේ.

**ගරු ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
වැඩ බලන ලේකම් හැටියට තමයි දාලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
වැඩ බලන ලේකම් හැටියට නොගහා ලේකම් හැටියට දාන්නේ ඇයි?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
සීල් එක ඉතින් එහෙම ගහලා තියෙන්නේ.එහෙම තමයි පාවිච්චි කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැනට ඔබතුමිය මේ සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරිතුමිය ද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නැහැ,නිත්‍ය තනතුරට පත් කිරීම කියලා තියෙනවානේ,ඒ ගොල්ලෝ තනතුර දෙන්නේ වැඩ බලන තනතුරට අමතර ව තමයි.නමුත් අභ්‍යන්තර විගණනයයි දෙකක් කරන්න බැහැනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔව් දැනට ඔබතුමිය අරකේ වැඩ බලන ගමන් අභ්‍යන්තර විගණන නිළධාරී ද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නැහැ. ලියුමේ තියෙන්නේ වැඩ බලන තනතුරට අමතරව කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මට දීලා තියෙන වාර්තාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරීම කියලා තියෙන්නේ. මේකේ තියෙන්නේ ඔබ දැනට නිත්‍ය තනතුරට අමතර ව කියලා.නිත්‍ය තනතුර මොකක්ද? අභ්‍යන්තර විගණන නිළධාරිද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නිත්‍ය තනතුර කියන්නේ ඒක නෙවෙයි. කළමනාකරණ සේවා නිලධාරී තමයි නිත්‍ය තනතුර.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
නැහැ නිත්‍ය තනතුරට අමතරව. කළමනාකරණ සේවා සහකාර තමයි හැමෝම.මේ සභාවේ කළමනාකරණ සේවා සහකාර 8 දෙනෙක් ඉන්නවා.ඔබතුමිය සභාවේ අභ්‍යන්තර විගණන නිළධාරීතුමිය.එතකොට මේ ලිපියට යටත්ව අපට හැඟෙන දේ තමයි ඒ අභ්‍යන්තර විගණන නිළධාරී තමයි ඔබතුමියගේ නිත්‍ය තනතුර.ඊට අමතරව තමයි මේ පුරප්පාඩු වෙලා තියෙන ලේකම්ධූරයේ වැඩබලන්න පත් කරනු ලැබුවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
ඔබතුමිය හරියට පැහැදිලි කිරීමක් දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපිට ඕකේ වැටහීමක් නෑ. අපි දෙපාර්තමේන්තුවෙන් අහලා නිවැරදි කර ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අභ්‍යන්තර විගණන නිළධාරී තමයි එයා හිටියේ. එතකොට එතුමියව ලේකම් තනතුරට පත්කළා. දැන් වැඩ බලන නෙමේද එහෙනම්.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
නිත්‍ය තනතුර කියන්නේ අපේ කළමනාකරණ සේවා තනතුරට.එතකොට ලේකම් තනතුරට තමයි පත් කරලා තියෙන්නේ.මාස 03කට වැඩ බැලීමටත් එතැන් සිට ශ්‍රේණිධාරියෙක් පත් වෙන තෙක් නියමිත රාජකාරී ඉටු කිරීමට පත් කරන ලෙසත් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට මට කියන්න මොනවද මේ මේකට යටත්ව දීමනා ගෙවීම් වශයෙන් හඳුන්වන්නේ?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
වැඩ බලන දීමනාවයි,නිවාඩු දින වැටුප් ගන්නේ.මුල් කාලයේ දී අතිකාල දීමනා හැටියට ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
2019.12.03 වනදා සිට ඔයා අරන් තියෙන්නේ වැඩ බලන දීමනාව හෝ නිවාඩු දින වැටුප් විතරයි?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ඔව්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ අතරවාරයේ වෙන මොකුත් දීමනා අරගෙන නැතේ?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මුල් කාලයෙදී අතිකාල දීමනා හැටියට ගත්තේ.ඒක ඊට පස්සේ නිවැරදි කරලා ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මුල් කාලයෙදී අතිකාල දීමනා හැටියට ගත්තේ කොහොමද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මගේ ලියුම ආවේ පස්සේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ තනතුරේ ඉද්දි ඔයා දැනගන්න ඕනා ඒ තනතුරට හිමි වැටුප් මොනවාද කියලා. ඔයා අතිකාල දීමනා අරගෙන තියෙනවා අවුරුද්දකට වැඩි ගාණක්.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මම අවුරුද්දක් අතිකාල දීමනා ගත්තේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම අවුරුද්දක් ගත්තේ නැද්ද කියන එකේ විස්තර ටික ලබන සභා වාරෙදී දෙන්නම්.ගත්ත කාලවලත් එක්ක දෙන්නම්.අතිකාල දීමනා ගන්න බැහැ ඔබතුමියට.ලේකම් කෙනෙකුට ගන්න පුලුවන් වැඩබලන දීමනාවයි,නිවාඩු දින වැටුප් විතරයි.එතකොට දැනට කවුද මේකේ අභ්‍යන්තර විගණන නිළධාරී?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
පාලිත මහත්තයා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අභ්‍යන්තර විගණන නිළධාරීට හිමි අතිකාල දීමනාද,නැතිනම් ඔය කියන වැඩබලන දීමනාවයි, නිවාඩු දින වැටුපයිද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
අතිකාල දීමනායි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඉසුරුනී නිකේෂලාගේ කාර්යාල කාර්ය සහායක පත්වීම කියන එකක් දීලා සභාවෙන් තියෙනවා. ඒකට පළාත් පාලන කොමසාරිස්තුමියගේ අනුමැතියක් ගන්න ඕනේ නැද්ද?මේකට නීත්‍යානුකූලව අනුමැතියක් අවශ්‍ය ද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ආදේශක පදනමෙන් ගන්නකොට කවදාවත් එහෙම අනුමැතියකට ගිහින් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම අහන එකටයි උත්තර ඕනේ.කාර්යාල කාර්ය සහායක පත්වීමක් සභාවට ගැනීමේ දී පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ අනුමැතියක් අවශ්‍යද? නැද්ද?

**ගරු ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ඕනේ නැහැ,පුරප්පාඩුවක් තියෙනවා නම් සභාපතිවරයාගේ නියෝගය මත ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
එතකොට 2019 චක්‍රලේඛනයක් තියෙනවා PL1,PL2,PL3 යටතේ සභාවන්,පළාත් සභා ඇතුලු කිසිම ආයතනයකට කාර්යාල කාර්ය සහායක PL1 යටතේ දෙන්න බෑ.එතකොට මේ පත්වීම ලබා ගන්න එපා කියලා සභාවට ලැබිලා නැද්ද?

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ස්ථිර පත්වීම්වලට බඳවා ගන්න එපා කියලයි තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
PL1 ස්ථිර පත්වීම් යටතේ තියෙන එකක්ද? මම දැනුවත්ව PL1 කියන්නේ කාර්යාල කාර්ය සහායක ආදේශක පත්වීම.එතකොට ඒකත් දෙන්න බැහැ. PL1, PL2, PL3 දෙන්න බැහැ.PL2 කියන්නේ මොකක්ද? මම දැනුවත්ව PL1 කියන්නේ ආදේශක පත්වීම.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ඔය ටික පැහැදිලි කරලා දෙන්නම් මන්ත්‍රීතුමාට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ චක්‍රලේඛයේ තියෙන්නේ මෙහෙම. බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම කියලා.මම අවශ්‍ය කරුණු විතරක් කියන්නම්.

ඒ අනුව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ වන සියලුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ PL1,PL2,PL3 දැනට පවතින සියලුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට 2020.01.22 දින පැවති රාජ්‍ය අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බවට සහ එහි තීරණය පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතු ය. යනුවෙන් සඳහන් වෙනවා. ඒකේ තියෙනවා එසේම සියලුම ආයතන 2019.12.31 වන දිනට එම සේවා ගණයේ පවතින පුරප්පාඩු පිළිබඳ ව සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම 1 - අමාත්‍යාංශ ලේකම්වරු මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර එකී ආයතනික පත්‍රයේ පිටපතක් එක්සෙල් පැතුරුම්පතක විද්‍යුත් තැපැලෙන් එවන්න.අනිත් එක තියෙනවා තවද සියලුම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම යන මැයින් නිකුත් කළා 2019.11.20 දිනැති ලිපියේ විධිවිධාන අනුව තවදුරටත් නොවෙනස්ව පවතින බව අවධාරණය කර සිටිමි.මම දැනුවත්ව මේ PL1 කියන්නේ ආදේශක පත්වීම් ගහන්න බෑ කියන එක.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ඔය කියන එක මාර්තුවල ආවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ ලියුමේ තියෙන්නේ 11වන මාසේ 20 දිනැති ලිපිය හා බැදේ යනුවෙන්.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ඒකේ තියෙන්නේ ස්ථිර පත්වීම ගැන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ස්ථිර පත්වීම් නෙවේ.එකම ලියුමේ තියෙන ටික මේ කියෙව්වේ.මේ 2020.01.08 මේ ලිපිය.එතකොට නිකේෂලාගේ පත්වීම ගහලා තියෙන්නේ 2020.02.03 වැනිදා.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
මන්ත්‍රීතුමා ඕකේ දැන් විමර්ෂණයක් යනවනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
විමර්ෂණයක් වැඩක් නැහැ.මට ඕක සභා වාර්තාවට දාලා දෙන්න.ඕගොල්ලෝ විමර්ෂණය කරපු විදිහත් අපි දන්නවා.විමර්ෂණ නෙවේ මේවගේ කළේ රක්ෂණයක්.කෝ විමර්ෂණ නිළධාරියෙක් ඇවිත් කරපු එක විමර්ෂණයක ප්‍රතිඵලයක් පෙන්නන්නකෝ.

**ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය**
ගිය සතියේ ආවා විමර්ෂණ නිළධාරීන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ මන්ත්‍රීවරු කමිටුවක් දාලා මේක හෙව්වේ නැත්නම් විමර්ෂණ නිළධාරීන් මෙච්චර කලකට හෙව්ව දෙයක් කියන්නකෝ.එදා පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස්තුමිය ඇවිත් කිව්වේ අද වන තුරු මතුගම සභාවෙන් කිසිම චෝදනාවක් ආවේ නෑ කියලා.ඒක කියලනේ ගියේ.එතකොට විමර්ෂණ නිළධාරීන් පිළිබඳව කොහොමද අපි විශ්වාසයක් තියන්නේ.

කාරක සභාව අවසන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**
පොළ පිළිබඳව අපි යම් යම් තීන්දු තීරණ ගත්තා.පොළෙනුත් කමිටුවක් කැඳවලා,සභාපතිතුමාගේ අනුදනුම පිට පොලිස් නිලධාරීන් සමඟ එකතු වෙලා අපි ඒක කළා.එහි දී වාහන කීයක් ද තියෙන්නේ කියලා විමර්ෂණය කළා.ඊයේත් මතුගම සභාව ඉස්සරහා එළවලු ලොරියක් තිබුණා.ඒ අය දැනුවත් කරලා ඒවා ඉවත් කරගන්න.එ නිසා මේකේ අපේ මන්ත්‍රීවරු,සභාවේ නිළධාරීන් විමර්ෂණය කළා.අපි හැමෝම එකතු වෙලා මේ කටයුතු කරමු.නැති නම් පිරිසකට මේ හරහා ලොකු අසාධාරණයක් වෙනවා.

(අදහස් ප්‍රකාශ කිරීමේදී මයික්‍රෝෆෝනය ක්‍රියාත්මක කර නොමැති නිසා කථා කරන කිසිවක් පැහැදිලිව නොඇසේ. )

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඩෙංගු මර්දන බලකායේ සේවයේ යෙදවීම පිළිබඳව සභා වාර්තාවට අසත්‍ය තොරතුරු වගයක් දීලා තියෙනවා.2වන හෝ 3වන මාසේ යටදොළවත්ත ගමෙන් ගමට ගොස් වැඩසටහනක් කළා කියලා.ඇත්තටම එහෙම එකක් වුණේ නැහැ.මේ බොරු තොරතුරු දීලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලයේ අයයි අපෙන් ඒ පිරිස ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
දැන් සභාවාර ගණනාවක දී දිගටම පරිපාලන ගැටලු රාශියක් මතු වුණා.මේකට සෘජුව ම වැඩබලන ලේකම්තුමිය වග කියන්න ඕනා.ඒත් එක්කම සභාපතිතුමාත් කොටස්කරුවෙක් වී අවසානයි.නිළධාරීන්ට විරුද්ධව සහකාර කොමසාරිස්තුමිය පරීක්ෂණ කටයුතු සිදු කරනවා.ඒ පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ලේකම්ධූරයෙන් ඉල්ලා අස් විය යුතු යැයි මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ටවුන්ගෙදරවත්ත පාරේ ලියුමක් එවලා තියෙනවා.ඒ හදපු ගොඩනැඟිල්ල උස්සලා තියෙන්නේ.එන වතුර වාන ඔක්කෝම පාරටලු එන්නේ.ඒක නිසා කඩිනමින් මේක ගිහින් බලලා ඒ ටික සමතලා කරලා වතුර ටික බස්සවන්න.

(මයික්‍රෝෆෝනය ක්‍රියාත්මක කර නැත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මතුගම යටදොළවත්ත වෙන්දේසි ඉඩම හා සම්බන්ධව ගත්ත පියවර පිළිබඳ ව අපට දැන්නුවේ නැහැ.ඒ අනුව වෙන්දේසිය අත් හිටවූ බවට අපට ලියුම් එව්වා.තව දුරටත් කවුරු හරි මේක කළොත් ඔහුට විරුද්ධ ව ක්‍රියාමාර්ග ගන්නා බව කියනවා.ඒත් වැඩ කරනවා.

(මයික්‍රෝෆෝනය ක්‍රියාත්මක කර නොමැති වීම හේතුවෙන් පවසන දෙය වටහා ගැනීමට අපහසු වී ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
පාර කපලා.ඒ කපලා තියෙන ක්‍රමයත් වැරදියි.අපට තාක්ෂණ නිළධාරීන්ට තරම් දැනුමක් නැහැ.නමුත් වැස්ස වෙලාවට ලොකු වතුර පාරක් එන්නේ.පාර හරහා කෙළින් කපලා කාණුවක් දාලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ මනත්‍රීතුමා දැනුවත් කළ වෙලාවේ ගිහින් බැලුවේ නැද්ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැනට ඇළගහවත්ත පාර කපලා කාණුවක් දාලා තියෙන එක පිළිබඳ ව සභාව දැනුවත් ද?හැම වෙන්දේසි ඉඩමකම ප්‍රශ්න වෙලා තියෙනවා.ඒ වෙලා තියෙන්නේ අවිධිමත් ලෙස කරන වැඩ නිසා.මේවා කරද්දී ගමේ මිනිසසුන්ගෙන් අහන්න ඕන. දැන් මේ වෙලා තියෙන විදිහට බෝදරගම පාර්ක් හරහා තමයි වතුර බහින්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ මන්ත්‍රීතුමාලගේ ප්‍රශ්නයට මොකද කරන්නේ?එතුමා පැමිණිල්ලක් ඉදිරිපත් කළා.අපිත් එතනට ගියා ඒක බලන්න.මේ ප්‍රශ්නය විසඳන හැටි කියන්න.මේකට නිලධාරීන් සහ කොට්ඨාශ මන්ත්‍රීතුමා ගිහින් බලලා ඒ අවශ්‍ය කටයුතු කරන්න.පව් ඒ මිනිස්සු.

**වැඩ අධිකාරී සමින්ද කුමාර මහතා**
අපි ගිහින් වැඩි දුර පරීක්ෂා කර බැලුවාම මන්ත්‍රීතුමා කිව්ව ඉඩම් කැල්ල පාරෙන් අනිත් පැත්තේ තියෙන්නේ කියලා හොරවල උප කාර්යාලයේ තාක්ෂණ නිලධාරී මහත්තයා කිව්වා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ මිනිස්සු වීඩියෝ කරලා එවන්නේ ඇයි?අක්‍රමිකතා නිසානේ.මේ වෙන්දේසි ඉඩමට ඇතුළු වන තැන දාලා තියෙන්නේ සපත්තු පාලමක්.බලන්න,මේ වහිනකොට එන වතුර වානේ සැර.මෙතනින් පාසල් ළමයෙක්ටවත් යන්න බැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක හැකි ඉක්මනින් ගිහින් බලලා ඉක්මනට ඉවරයක් කරන්න.

**7.** **කාරක සභා වාර්තාව සලකා බැලීම.**

**8.** **ආදායම් සහ වියදම් වාර්තා සලකා බැලීම.**

8.1 2022 අගෝස්තු මස ආදායම් සහ වියදම් වාර්තා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කරන ලදී.

**9.** **පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**
පුංචි ඉල්ලීම් දෙකක් තියෙනවා කරන්න.ඒ තමයි සිමෙන්ති බෝක්කුව ළඟ ඉඳන් අභයරාජ මාවතේ සොල්දර කඩේ හන්දිය දක්වා මාර්ගය පසුගිය කාලයේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය යෝජනා ක්‍රමය යටතේ පාර කාපට් කරන්න වැඩ කටයුතු ඇරඹ‍ෙහ කළා.මේ වෙන කොට ඒ වැඩ කටයුතු ස්ථාන කිහිපයකදී නතර වෙලා තියෙනවා.සමහරක් ස්ථානයක දී නාරවිල අභයරාජ විහාරස්ථානය ඉදිරිපස ඒ

ස්ථානයේ මහා විශාල වළවල් කිහිපයක් ඇති බව මීට පෙර ඔබතුමාව දැනුවත් කළා.ජේ.සී.බී.යන්ත්‍රය නැතිබවට තමයි මම මුලින් මතක් කළේ.දැන් ඒක මහා අප්‍රසාදයට ලක් වෙලා තියෙනවා.දැන් ඒ ප්‍රධාන මාර්ගයේ කාර් එකක්වත් යන්න බැහැ යට වදින නිසා.ඒ නිසා මේකට පස් දෙකක් දාලා වළවල් දෙක වහලා දෙන්න කියලා කඩිනමින් ඉල්ලා සිටිනවා.

ඒ වගේ ම තමයි කන්දහේන මාර්ගය මැද සම්පූර්ණයෙන් ම බෝක්කුව කඩා ගෙන බැහැලා තියෙනවා.ලබන මාසේ ඉඳන් විහාරස්ථානවල කඨින පිංකම පටන් ගන්නවා.ඒ නිසා ඊට පෙර මෙම මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉහත කාරණා දෙක සම්බන්ධයෙන් ඉල්ලා සිටිනවා.හෙට දිනේදී තාක්ෂණ නිලධාරියෙක් යොදවා සොයා බලා එම කටයුතු ඉටු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු ව මහ සභාවේ කටයුතු ප.ව.04.55ට පමණ අවසන් විය.**